**<u>කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරිපිටදී ය.</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ගිහාන් කුලතුංග මැතිතුමා.(සභාපති)</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ප්‍රදීප් හෙට්ටිආරච්චි මැතිතුමා.</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න මැතිතුමා.</u>**

---

**<u>නඩු අංකය:- HC (TAB) /493/2019</u>** **<u>දිනය:- 2022.01.12</u>**

**<u>තීන්දුව</u>**

මෙම නඩුවේ නීතිපති තුමා විසින් 1 සිට 3 විත්තිකරුවන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති අධි චෝදනා පත්‍රයෙහි සඳහන් චෝදනා පහත ආකාරයෙන් වේ.

01. වර්ෂ 2012 ක් වූ නොවැම්බර් මස 10 වන දින හෝ ඊට ආසන්න දිනයක දී මෙම අධිකරණයේ බලසීමාව තුළ පිහිටි වැලිකඩ බන්ධනාගාරය තුළ දී හෝ අන් ස්ථානයක දී යුෂ්මතුන් පැමිණිල්ල නොදන් අන් අය සමග යම් වරදක් කිරීම සඳහා එනම් නම් සඳහන් කරමින් තෝරාගත් නිශ්චිත සිරකරුවන් පිරිසකගේ මරණය සිදු කිරීමට හෝ එකී වරදට අනුබල දීමට හෝ වූදිතයින් පොදු අරමුණක් සහිතව එකී වරද කිරීමට හෝ ඊට අනුබල දීමට ක්‍රියා කිරීමට එකඟ වීමෙන්, කුමන්ත්‍රණය කිරීමේ වරද සිදු කල බවත්, එකී කුමන්ත්‍රණයේ ප්‍රතිඵලයක් වශයෙන් එම වරද සිදු කරන ලද බවත්, එබැවින් යුෂ්මතුන් දණ්ඩ නීතිසංග්‍රහයේ 113ආ. සහ 102 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

02. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේදී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී පළමු චූදිත වන යුෂ්මතා පැමිණිල්ල නොදත් අන් අය සමග තෝරාගත් යම් නිශ්චිත සිරකරුවන් පිරිසකගේ මරණය සිදු කිරීම සඳහා වැලිකඩ බන්ධනාගාරය තුළට සාපරාධී අයුතු ඇතුළු වීමෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 සහ 433 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව ය.

03. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග තෝරාගත් යම් නිශ්චිත සිරකරුවන් පිරිසකගේ මරණය සිදු කිරීම පොදු අරමුණ කරගත් නීතිවිරෝධි රැස්වීමක සමාජිකයන්ව සිටීමෙන් දණඩ නීති සංග්‍රහයේ 140 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව ය.

04. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග කංකානම්ලාගේ මලින්ද්‍ර නිලේන්ද්‍ර වල්පොල නොහොත් මාලන් නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා හෝ පැහැර ගෙන යාමේ වරද සිදුකළ බවද, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයින් දත් බවත්, එබැවින් 1 වන චූදිත වනයුෂ්මතා එම වරද සිදුකරනු ලබන අවස්ථාවේදී එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයකුව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කියවිය යුතු 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

05. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී ඉහත කී නීතිවිරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිප දෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග අතපත්තු සංගක්කාරගේ නිමර්ල අතපත්තු නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා හෝ පැහැරගෙන යාමේ වරද සිදු කළ බවද, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු

අරමුණ ඉෂ්ඨ කරගැනීම වස් සිදු කළ බවත්, එම වරද ඉහත කී නීති විරෝධි රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කර ගැනීමේ දී දී සිදුවිය හැකි බව එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයින් දත් බවත්, එබැවින් 01 වන චූදිතවන යුෂ්මතා එම වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයකුව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කියවිය යුතු 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව ය.

06. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිප දෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග මොහොමඩ් විජය රෝහණ නොහොත් ගුන්ඩු නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා හෝ පැහැරගෙන යාමේ වරද සිදු කළ බවද, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කර ගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයින් දත් බවත්, එබැවින් 01 වන චූදිතවන යුෂ්මතා එම වරද සිදුකරනු ලබන අවස්ථාවේ දී එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයකුව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කියවිය යුතු 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

07. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේදී හා එම ක්‍රියාකලාපයේ දී ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිප දෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග චින්තාමනි මොහොට්ටිගේ තුෂාර චන්දන නොහොත් කුලුතුෂාර නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා හෝ පැහැරගෙන යාමේ වරද සිදු කළ බවද, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කරගැනීම වස් සිදු කළ බවත්, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කර ගැනීමේ දී සිදුවිය හැකි බව දී සිදුවිය හැකි බව එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයින් දත් බවත්, එබැවින් 1 වන චූදිත වනයුෂ්මතා එම වරද සිදුකරනු ලබන අවස්ථාවේ දී එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයකුව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන

වගන්තිය සමග කියවිය යුතු 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව ය.

08. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිප දෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග අසරප්පුලිගේ ජෝතිපාල නොහොත් පොන්නකපිල නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා හෝ පැහැර ගෙන යාමේ වරද සිදු කළ බවද, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කරගැනීම වස් සිදු කළ බවත්, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කර ගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීති විරෝධි සාමාජිකයින් දත් බවත්, එබැවින් 01 වන චූදිත වන යුෂ්මතා එම වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයකුව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කියවිය යුතු 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව ය.

09. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිප දෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග හෂර් ශ්‍රී මනකීතරී පෙරේරා මංජුශ්‍රී නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා හෝ පැහැර ගෙන යාමේ වරද සිදු කළ බවද, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයින් දත් බවත්, එබැවින් 01 වන චූදිත වනයුෂ්මතා එම වරද සිදුකරනු ලබන අවස්ථාවේ දී එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයකුව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කියවිය යුතු 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව ය.

10. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිප දෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග රයිගමගේ සුසන්ත

පෙරේරා නොහොත් මාලසුසන්ත නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා හෝ පැහැරගෙන යාමේ වරද සිදු කළ බවද, එම වරද ඉහත කී නීති විරෝධී රැස්වීමේ පොදු අරමුණ ඉෂ්ඨ කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයින් දත් බවත්, එබැවින් 01 වන වූදිතවන යුෂ්මතා එම වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයකුව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කියවිය යුතු 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව ය.

11. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී පළමු වූදිතවන යුෂ්මතා විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග කංකානමලාගේ මලින්ද්‍ර නිලේන්ද්‍ර පැල්පොල නොහොත් මාලන් නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා පැහැර ගෙන යාමේන්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කිය 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

12. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී පළමු වූදිතවන යුෂ්මතා විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග අතපත්තු සංගක්කාරගේ නිමර්ල අතපත්තු නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා පැහැරගෙන යාමෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කිය 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

13. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී පළමු වූදිතවන යුෂ්මතා විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග මෙහොමඩ් විජය රෝහණ නොහොත් ගුන්ඩු නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා පැහැරගෙන යාමේන්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කිය 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

14. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී පළමු වූදිතවන යුෂ්මතා විසින් පැමිණිල්ල නොදත් අන් අය

සමග චින්තාමනි මොහොට්ටිගේ තුෂාර චන්දන නොහොත් කලුතුෂාර නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා පැහැර ගෙන යාමෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කිය 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

15. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී පළමු චූදිතවන යුෂ්මතා විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග අසරප්පුලිගේ ජෝතිපාල නොහොත් පොන්නකපිල නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා පැහැර ගෙන යාමෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කිය 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

16. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී පළමු චූදිතවන යුෂ්මතා විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග හෂර් ශ්‍රී මනකීතරී පෙරේරා නොහොත් මංජුශ්‍රී නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා පැහැරගෙන යාමෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කිය 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

17. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේ දී පළමු චූදිතවන යුෂ්මතා විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග රයිගමගේ සුසන්ත පෙරේරා නොහොත් මාලසුසන්ත නැමැත්තාව මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට පාත්‍ර වන අන්දමින් බැහැර කිරීම සඳහා පැහැර ගෙන යාමෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කිය 355 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

18. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම ඉහත කී නීතිවිරෝධි රැස්වීමේ සාමාජිකයකු හෝ කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග කංකානමලාගේ මලින්ද්‍ර නිලේන්ද්‍ර පැල්පොල නොහොත් මාලන් යන අයගේ මරණය සිදු කළ

බවත් එම වරද ඉහත කී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදු කරන ලද බවත් නැතහොත් එම වරද එකී පොදු අරමුණ ඉටු කරගැනීමේදී සිදුවිය හැකි බව එකී නීතිවිරෝධී රැස්වීම් සමාජිකයන් දත් බවත් එබැවින් එම වරද සිදුකරන අවස්ථාවේ දී යුෂ්මතුන් එකී නීතිවිරෝධී රැස්වීමේ සමාජකයින්ව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

19. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයකු හෝ කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග අතපත්තු සංගක්කාරගේ නිමර්ල අතපත්තු යන අයගේ මරණය සිදු කළ බවත් එම වරද ඉහත කී පොදු අරමුණ ඉටු කරගැනීමේ දි සිදු කරන ලද බවත් නැතහොත් එම වරද එකී පොදු අරමුණ ඉටු කරගැනීමේදී සිදුවිය හැකි බව එකී නීතිවිරෝධී රැස්වීම් සමාජිකයන් දත් බවත් එබැවින් එම වරද සිදුකරන අවස්ථාවේදී යුෂ්මතුන් එකී නීතිවිරෝධී රැස්වීමේ සමාජකයින්ව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

20. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයකු හෝ කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග මොහොමඩ් විජය රෝහණ නොහොත් ගුන්ඩු යන අයගේ මරණය සිදු කළ බවත් එම වරද ඉහත කී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදු කරන ලද බවත් නැතහොත් එම වරද එකී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීතිවිරෝධී රැස්වීම් සමාජිකයන් දත් බවත් එබැවින් එම වරද සිදුකරන අවස්ථාවේ දී යුෂ්මතුන් එකී නීතිවිරෝධී රැස්වීමේ සාමාජකයන්ව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

21. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග චින්තාමනි

මොහොට්ටිගේ තුෂාර චන්දන නොහොත් කලුතුෂාර යන අයගේ මරණය සිදු කළ බවත් එම වරද ඉහත කී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදුකරන ලද බවත් නැතහොත් එම වරද එකී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීතිවිරෝධී රැස්වීම් සමාජිකයන් දත් බවත් එබැවින් එම වරද සිදු කරන අවස්ථාවේ දී යුෂ්මතුන් එකී නීතිවිරෝධී රැස්වීමේ සාමාජිකයන්ව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

22. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයකු හෝ කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග අසරප්පුලිගේ ජෝතිපාල නොහොත් පොන්නකපිල යන අයගේ මරණය සිදු කළ බවත් එම වරද ඉහත කී පොදු අරමුණ ඉටු කරගැනීමේදි සිදු කරන ලද බවත් නැතහොත් එම වරද එකී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීති විරෝධී රැස්වීම් සමාජිකයන් දත් බවත් එබැවින් එම වරද සිදුකරන අවස්ථාවේදී යුෂ්මතුන් එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයන්ව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

23. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයකු හෝ කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග හෂර් ශ්‍රී මනකීතරී පෙරේරා නොහොත් මංජුශ්‍රී යන අයගේ මරණය සිදු කළ බවත් එම වරද ඉහත කී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදු කරන ලද බවත් නැතහොත් එම වරද එකී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීති විරෝධී රැස්වීම් සමාජිකයන් දත් බවත් එබැවින් එම වරද සිදු කරන අවස්ථාවේ දී යුෂ්මතුන් එකී නීතිවිරෝධී රැස්වීමේ සාමාජිකයන්ව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

24. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයකු හෝ

කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග රයිගමගේ සුසන්ත පෙරේරා නොහොත් මාලසුසන්ත යන අයගේ මරණය සිදු කළ බවත් එම වරද ඉහත කී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදු කරන ලද බවත් නැතහොත් එම වරද එකී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීතිවිරෝධී රැස්වීම් සමාජිකයන් දත් බවත් එබැවින් එම වරද සිදු කරන අවස්ථාවේ දී යුෂ්මතුන් එකී නීති විරෝධී රැස්වීමේ සාමාජකයන්ව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

25. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම ඉහත කී නීති විරෝධි රැස්වීමේ සාමාජිකයෙකු හෝ කිහිපදෙනෙකු විසින් පැමිණිල්ල නොදත් අන් අය සමග දේවමුල්ලගේ මලිත් සමීර පෙරේරා නොහොත් කොණ්ඩඅමිල යන අයගේ මරණය සිදු කළ බවත් එම වරද ඉහත කී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදු කරන ලද බවත් නැතහොත් එම වරද එකී පොදු අරමුණ ඉටු කරගැනීමේ දී සිදුවිය හැකි බව එකී නීතිවිරෝධී රැස්වීම් සමාජිකයන් දත් බවත් එබැවින් එම වරද සිදුකරන අවස්ථාවේදී යුෂ්මතුන් එකී නීතිවිරෝධී රැස්වීමේ සාමාජකයන්ව සිටීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 146 වන වගන්තිය සමග කිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

26. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග කංකානම්ලාගේ මලින්ද්‍ර නිලේන්ද්‍ර පැල්පොල නොහොත් මාලන් යන අයගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

27. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග අතපත්තු සංගක්කාරගේ නිමර්ල අත්පත්තු යන අයගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

28. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග විසින් මොහොමඩ් විජය රෝහණ නොහොත් ගුන්ඩු යන අයගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

29. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එම ක්‍රියාකලාපයේදීම යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග විසින් චින්තාමනි මොහොට්ටිගේ තුෂාර චන්දන නොහොත් කලුතුෂාර යන අයගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

30. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එම ක්‍රියාකලාපයේදීම යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග විසින් අසරප්පුලිගේ ජෝතිපාල නොහොත් පොන්නකපිල යන අයගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

31. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග විසින් හෂර් ශ්‍රී මනකීතරී නොහොත් මංජුශ්‍රී යන අයගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

32. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග විසින් රයිගමගේ සුසන්ත පෙරේරා නොහොත් මාලසුසන්ත යන අයගේ මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව.

33. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් වේලාවේ දී ස්ථානයේ දී හා එම ක්‍රියාකලාපයේදීම යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමග දේවමුල්ලගේ මලිත් සමීර පෙරේරා නොහොත් කොණ්ඩඅමිල යන අයගේ

මරණය සිදු කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය 296 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බව ය.

අධිකරණය විසින් චූදිතයන් වෙත චෝදනාවන් කියවා දෙන ලදුව 01, 02, 03, විත්තිකරුවන් වෙන් වෙන්ව චෝදනාවන්ට "නිවැරදිකරුවන්" බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව මෙම නඩුව විභාගයට ගන්නා ලදී.

පැමිණිල්ලේ නඩුව අවසානයේදී මෙම නඩුවේ 3 වන විත්තිකරුව අධිකරණය විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 200 (1) වගන්තිය ප්‍රකාරව නිදොස් කොට නිදහස් කරන ලදී. ඉන් අනතුරුව 1 සහ 2 විත්තිකරුවන්ගෙන් විත්තිවාචකය කැඳවන ලදුව නඩු කටයුතු ඉදිරියට පවත්වාගෙන යන ලදී. 1 සහ 2 විත්තිකරුවන් විත්තිකූඩුවේ සිට ප්‍රකාශ කරන ලදුව ඔවුන් වෙනුවෙන් සාක්ෂි ද කැඳවා විත්තියේ නඩුව අවසන් කරන ලදී.

මෙම චෝදනාව ඔප්පු කිරීම සඳහා පැමිණිල්ල විසින් සාක්ෂිකරුවන් 40 දෙනෙක් ( ද්විතීයික සාක්ෂි වල ආවේශ්‍යතාවය පිලිබඳ විමසීමේදී කැඳවන ලද සාක්ෂිකරුවන්ට අමතරව) කැඳවා ඇත. එනම් විශ්‍රාමික සහකාර බන්ධනාගාර අධිකාරී පල්ලේකුඹුර වලව්වේ කුඩා බණ්ඩාර, බන්ධනාගාර ජේලර් ලලිත් වසන්ත නානායක්කාර, යුධ හමුදා සැරයන් තෙන්නකෝන්, බන්ධනාගාර ජේලර් දුෂ්මන්ත කුමාර, සෙනරත් බන්දුල ලියනාරච්චි, ඉන්දික පෙරේරා, ජයසිංහ ආරච්චිගේ මලරීන්, සුදේශ් නන්දිමාන් සිල්වා, පො.කො. ලක්මාල් වීරසූරිය, සමයක්කාරගේ මාලනී, බන්ධනාගාර ජේලර් නිමල් ශාන්ත, වෛද්‍ය දසනායක, වෛද්‍ය අජිත් තෙන්නකෝන්, වෛද්‍ය ප්‍රසන්න අප්පුහාමි, වෛද්‍ය මොහොමඩ් රොෂාන් සූෆියන්, අඹගහවත්තේ ගෙදර සේනාරත්න, ප්‍ර.පො.ප. විජේවික්‍රම, ප්‍ර.පො.ප ඉද්දමල්ගොඩ, පො.ප. පේදුරු ආරච්චි, කා.පො.ප. සුමනලතා, පො.ප. මධුර සුසන්ත, පො.සැ. ප්‍රියදශර්න රත්නායක, පො.සැ. ජිනවංශ ජයරත්න, පො.සැ. මහේෂ් ජයසුන්දර, ප්‍ර.පො.ප බාලසූරිය, ප්‍ර.පො.ප. ප්‍රනාන්දු, පොලිස් අධිකාරී විජේසිරි වික්‍රමසේකර, චාමර ගමගේ, සා.පො.අ. හේමන්ත, ප්‍ර.පො.ප. සාගර කරසිංහආරච්චි, නියෝජ්‍ය රජයේ රස පරීක්ෂක ගාමිණී

මඩවල, පො.සැ. යසරත්න, නියෝජ්‍ය පොලිස්පති නාලකද සිල්වා, බන්ධනගාර ජේලර් ප්‍රේමවංශ, පො.කො. ධමර්සිරි බණ්ඩාර, කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් විරාජිනි අප්සරා, උ.පො.ප. කුමාර ප්‍රියදශර්න, නීතිඥ සුරංග බණ්ඩාර, කා.ප්‍ර.පො. දිල්රුක්ෂි නඩේසලිංගම් සහ ටානියා දුලාරි ජයවීර යන සාක්ෂිකරුවන් වේ.

ඉහත සඳහන් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවා පැ. 01 සිට පැ. 93 දක්වා ලේඛන ලකුණු කරමින් පැමිණිල්ලේ නඩුව අවසන් කරන ලදී. අධිකරණය විසින් විත්තිවාචක කැඳවීමට තීරණය කර විත්තිකරුවන්ගේ අයිතිවාසිකම් පහදා දීමෙන් අනතුරුව 1 සහ 2 විත්තිකරුවන් විත්තිකූඩුවේ සිට ප්‍රකාශ සිදු කරන ලදී. ඉන් අනතුරුව 1 වන විත්තිකරු වෙනුවෙන් වානක තුෂාර වීරසිංහ, සාගර කුලසේකර, තිලින රාජපක්ෂ, තනුජ ගොඩේවත්ත, වසන්ත කුමාර ලියනවඩුගේ, ලමාහේවගේ කමල් වසන්ත කුමාර සිල්වා, අඹගහ ලියනගේ චමින්ද කුමාර යන සාක්ෂිකරුවන්ද 2 වන විත්තිකරු වෙනුවෙන් විශ්‍රාමික බන්ධනාගාර කොමසාරිස් ජනරාල් පියසේන විජේසිංහ කොඩිප්පිලි, කෝවිලගේ ඉනෝකා සංජීවනී සිල්වා, කා.ප්‍ර.පො.ප. නිල්මිණි මෙන්ඩිස්, සමීරවීර ආරච්චිගේ ශ්‍රියා ජයරානී යන සාක්ෂිකරුවන් කැඳවා විත්තියේ නඩුව අවසන් කරන ලදී. ඉන් අනතුරුව පැමිණිල්ල සහ විත්තිය වෙනුවෙන් වාචික සැලකිරීම් ඉදිරිපත් කරන ලදී.

මෙම නඩුවේ පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්පිණ්ඩනය කිරිමට ප්‍රථමයෙන් මෙම නඩුව තීරණය කිරීමේදී පොදුවේ අනුගමනය කළ යුතු නීතිමය සිද්ධාන්තයන් සහ සංකල්ප සිහිපත් කර සිටීම සුදුසු වේ. අපරාධ නඩුවක විත්තිකරුවෙකුට එරෙහිව චෝදනාවක් අධිකරණයට ඉදිරිපත් කර ඇත්තා වුව ද සෑම අවස්ථාවකම එම චූදිතට නිදෙර්ෂීභාවයේ පූවර් නිගමනයේ වාසිය නඩුව පුරාවටම පවතින බව සිහිපත් කරමු. එනම් චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කරන තෙක් නිදෙර්ෂීභාවයේ පූවර් නිගමනය පවතිනු ඇත.

තවද අපරාධ නඩුවක විත්තියට තම නිදෙර්ෂීභාවය ඔප්පු කිරීමට කිසිදු වගකීමක් නැත. එසේ හෙයින් එකී නිදෙර්ෂී භාවයේ පූවර් නිගමනය බිඳ හෙළීමට පැමිණිල්ල විසින් අදාළ චෝදනාව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරිම සිදු කළ යුතුය. ඒ අනුව මූලිකවම පැමිණිල්ල විසින් චෝදනාව සම්බන්ධයෙන් ප්‍රබල

සාක්ෂි ඉදිරිපත් කිරිමට අපොහොසත් වුවහොත් විත්ති වාචකය සලකා බැලීමකින් තොරව වුවද විත්තිකරු නිදොස් කොට නිදහස් කළ යුතු වේ.

පැමිණිල්ල ප්‍රබල නඩුවක් ගොඩ නඟා ඇති බවට මෙම අධිකරණයට පෙනී යන්නේ නම් විත්තියේ සාක්ෂි සළකා බලනු ලැබේ. මෙම නඩුවේ 01 වන සහ 02 වන විත්තිකරුවන් විත්තිකූඩුවේ සිට ප්‍රකාශ ලබා දී ඇත. විත්තිකූඩුවේ සිට කරනු ලබන ප්‍රකාශයක් අනෙකුත් සාක්ෂියක් වශයෙන් සලකාබැලිය යුතු අතර එවැනි ප්‍රකාශයක් මගින් හෝ විත්තිකරුවන්ගේ සාක්ෂි මගින් යම් සාධාරන සැකයක් පැමිණිල්ලේ නඩුව මත ඇති කරන්නේ නම් හෝ විත්තිකරුවන්ගේ හෝ ප්‍රකාශ හෝ සාක්ෂි ප්‍රතික්ෂේප කිරීමට නොහැකි නම් හෝ විත්ති වාචක පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අධිකරණයට හැකියාවක් නොමැති නම් එහි වාසිය විත්තියට ලබා දිය යුතු වේ.

අපරාධ නඩුවක විත්තිකරුට නිහඬව සිටීමේ අයිතියක් ඇත. විත්තිකරුවෙකු නිහඬව සිටීම යන කරුණ ඔහුට එරෙහිව අගතිදායී අනුමිතියකට පැමිණීම සඳහා හේතුවක් නොවිය යුතු අතර දුවර්ල නඩුවක් තහවුරු කිරීමට එසේ නිශ්ශබ්දව සිටිම හෝ විත්තියේ යම් දුවර්ලතාවයක් යොදා ගැනීමට හැකියාවක් නොමැත. මෙවැනි අපරාධ නඩුවක චෝදනාව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇද්ද යන්න තීරණය කිරීමේ දී මුලින්ම පැමිණිල්ල විසින් ප්‍රබල නඩුවක් ගොඩනගා තිබේද යන්න සලකා බැලිය යුතුය. එසේ පැමිණිල්ල විසින් ප්‍රභල නඩුවක් ගොඩ නඟා ඇති අවස්ථාවක දී අධිකරණය විසින් විත්තියේ යෝජනා හා ස්ථාවරයන් ද විත්තිවාචකයද සැළකීමෙන් පසුව අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇති සියලු සාක්ෂි සළකා බැලීමෙන් අනතුරුව අවසාන තීරණයකට එනම් චෝදනා සාධාරණ සැකයෙක් ඔබ්බට ඔප්පු වී ඇත්ද යන තීරණය එළඹිය යුතු වේ.

අපරාධ නඩුවක ඉදිරිපත් කර ඇති සාක්ෂි සළකා බැලීමේ දී අධිකරණය විසින් එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල පිළිගත හැකි භාවය සළකා බැලීමේ දී දැනට පොදුවේ භාවිතා වන සාක්ෂි දීමේ විලාශය ප්‍රමාදයකින් තොරවීම ඒකාකාරී භාවය වියහැකිභාවය ඇතුළු පරීක්ෂාවන් යොදා ගනු ලැබේ.

මෙම පරීක්ෂණයන්ට පාදක වන වැදගත් කරුණක් වන්නේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මත පරස්පරතාවයන් ලකුණු කර තිබීම හෝ ඌණතාවයන්ට අධිකරණයේ අවධානය යොමු කිරීමයි. මෙවැනි පරස්පරතාවයන්

හෝ ඌණතාවයන් වෙන් වෙන්ව සළකා බලා එමගින් පැමිණිල්ලේ නඩුවේ අරටුවට යම් හානියක් සිදු වන්නේ ද යන්න අධිකරණය විසින් සුපරික්ෂාකාරීව සළකා බැලිය යුතුය. යම් හෙයකින් නඩුවේ හරයට බලපාන ආකාරයේ පරස්පරතාවයන් හෝ ඌණතාවයන් ඇති අවස්ථාවක දී එහි වාසිය විත්තියට ලබා දිය යුතු වේ. එසේ වුව ද එම පරස්පරතා හෝ ඌණතා නඩුවේ හරයට බල නොපාන බවට අධිකරණය සෑහීමකට පත් වන්නේ නම් එකී පරස්පරතා හෝ ඌණතා නොසළකා හැරීමට ද හැක.

සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දී අධිකරණය මතකයේ තබා ගත යුතු කාරණයක් වන්නේ මෙම සාක්ෂිකරුවන් සාමාන්‍ය මනුෂ්‍යයන් වන බැවින් ඔවුන්ගේ සාක්ෂි මත මේ සිද්ධිය සම්බන්ධයෙන් යාන්ත්‍රිකව පටිගත කරන ලද සිද්ධි මාලාවක් නැවත විකාශනය කරන්නා මෙන් සාක්ෂි දීම බලාපොරොත්තු විය නොහැකි බවය. එසේ හෙයින් සාමාන්‍ය මනුෂ්‍යයින්ට අමතක වීම් සහ අතපසුවීම් මෙන්ම යම් යම් සිද්ධි සිතේ ධාරණය කර ගැනීමේ ශක්තිය සහ මතක තබා ගැනීමේ හැකියාව, එවැනි සාක්ෂිකරුවෙකුගේ අධ්‍යාපනික සමාජයීය සහ අනෙකුත් කරුණු සැළකිල්ලට ගෙන විශ්ලේෂණය කළ යුතු වේ.

ඉහත සීමාවන්ට යටත්ව සාක්ෂිකරුවෙකු විසින් කරුණු වසන් නොකොට සම්පූර්ණ සත්‍ය හෙළිදරව් කළ යුතු බවට අධිකරණය බලාපොරොත්තු විය යුතුය. පොදුවේ ඉහත දැක්වූ සිද්ධාන්ත හා පරීක්ෂණයන් ඒ ඒ අවස්ථාවෝචිත පරිදි අදාළ හා උපයෝගී කර ගෙන සාක්ෂිකරුවන්ගේ සාක්ෂියේ පිළිගත හැකිභාවය හා සත්‍යභාවය පිළිබඳව සාක්ෂි විශ්ලේෂණය කිරීමෙන් පසු චෝදනාව ඔප්පු වී ඇද්ද යන්න පිළිබඳව නිගමනයකට එළඹිය යුතු වේ.

මෙම නඩුවේ 01 සහ 02 විත්තිකරුවන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාව ඔප්පු කිරීම සඳහා පැමිණිල්ල විසින් සාක්ෂිකරුවන් 40 දෙනෙක් කැඳවා ඇති අතර එකී සාක්ෂි සම්පිණ්ඩනය කිරීම ආරම්භ කරනු ලැබේ.

**<u>සාක්ෂි සම්පිණ්ඩනය සහ විශ්ලේෂණය</u>**

මෙම නඩුවේ සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් ඇස දුටු සාක්ෂිකරුවන් හතරදෙනෙකු පැමිණිල්ල මෙහෙයවා ඇත. එනම් පැ.සා.01 නන්දිමාල්, පැ.සා. 02

කුඩා බණ්ඩාර, පැ.සා. 03 ලියනාරච්චි සහ පැ.සා. 4 ඉන්දික පෙරේරා යන ඇස දුටු සාක්ෂිකරුවන්ද අනුශාංගික පෙළඹවීමේ හේතුව සම්බන්ධයෙන් වන පැ.සා.9 මාලනී, පැ.සා11 මලරීන්, පැ.සා 100 ටානියා සහ සාක්ෂි අංක 20. බන්ධනාගාර නියාමක නිමල් ශාන්ත යන අය වේ.

අප විසින් මුලින්ම මෙම ඇස දුටු සාක්ෂිකරුවන් හතරදෙනා ඇතුළු ඉහත කී අනෙකුත් සාක්ෂි සම්පිණ්ඩනය කොට එම සාක්ෂිවල පිලිගත හැකි භාවය සලකා බලනු ලැබේ.

මේ අවස්ථාවේ සාක්ෂි සම්පිණ්ඩනයට පෙර තේරුම් ගැනීමේ පහසුව සඳහා මෙම සාක්ෂිකරුවන් හතරදෙනාගේ සාක්ෂිය තුලින් හෙලිදරව් වී ඇති සිද්ධි මාලාව පොදුවේ ගෙනහැර දැක්වීම සුදුසු වේ. එනම්, පොදුවේ ගත්කල 2012.11.09 වන දින වැලිකඩ බන්ධනාගාරයේ සිර මැදිරි පරීක්ෂා කිරීම සඳහා විශේෂ කාර්‍ය බලකායේ (වි.කා.බ) නිලධාරීන් ඇතුළු 700 කට අධික බට කණ්ඩායමක් වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රය තුලට පැමිණ ඇත. මෙම කණ්ඩායම අවි සහිතව මෙසේ ඇතුළු වී මුලින්ම එල්. ශාලාව ඇති ස්ථානය අවට සෝදිසි කර ඇත. ඉන්අනතුරුව චැපල් අංශයද සෝදිසි කර ඇත. මෙසේ පරීක්ෂා සිදු කෙරෙන අතරතුර සවස 3.30 ට පමණ යම් ඝෝෂාකාරී කලබලකාරී තත්වයක් බන්ධනාගාරය තුල හට ගෙන ඇත. විශේෂයෙන්ම මරණ දණ්ඩනයට නියම වී සිටි සිරකරුවන් සහ වි.කා.බ සාමාජිකයින් අතර යම් උණුසුම්කාරි තත්වයක් හට ගෙන ඇති අතර යම් වෙඩි ශබ්ද ඇසී ඇති අතර කඳුලු ගෑස් ගැසීමක්ද සිදුවී ඇත. රුදෙවියන් ගල් මුල් වලින් පහරදීමක්ද සිදු වී ඇති බව හෙලිදරව් වේ. මේ අවස්ථාවේ බන්ධනාගාර නිලධාරීන්ගේද ඉල්ලීම අනුව වි.කා.බ. කණ්ඩායම බන්ධනාගාරයෙන් පිටතට ගොස් ඇත.

මේ වන විට බන්ධනාගාරය තුල යම් රුදෙවියන් පහලොවකට වැඩි පිරිසක් ටී. 56 අවි අතැතිව වහල උඩ නැග කෑගසමින් සිට ඇත. ඉන්පසුව බන්ධනාගාර නිලධාරීන් වන කුඩා බණ්ඩා, හපුආරච්චි, එමිල් රංජන්, ගාමිණී ජයසිංහ සම්බන්ධ වී තත්වය යම් ආකාරයකට පාලනය කර ගනිමින් සිරකරුවන් අත තිබී ගිනි අවි 12 ක් පමණ නැවත ලබාගෙන තත්වය පාලනය කර ගෙන ඇත. මෙම කටයුත්ත සඳහා යම් සිරකරුවන්ගේද සහායක් ලබා ගත් බව හෙලිදරව් වේ. එමිල් රංජන් නැමැති 2 වැනි විත්තිකරු එවකට මැගසින් බන්ධනාගරයේ අධිකාරීවරයා ලෙස සේවය කර ඇත.

ඉන් පසු සිරකරුවන් බහුතරයක් නැවත සිර මැදිරිවලට ගිය බවක් හෙළිදරව් වී ඇත. මාලන් නැමැති සිරකරුවෙක් ඇතුළු කිහිපදෙනෙක් අවි සහිතව වහලට නැග සිට ඇත. ඉන්පසුව රාත්‍රී 12.00 ට පමණ යුධ හමුදා නිලධාරීන් ඇතුව භට කණ්ඩායමක් බන්ධනාගාරය තුලට ඇතුළු වී ඇති අතර සන්නද්ධ රථ දෙකක්ද ඔවුන්ගේ සහායට යොදා ගෙන ඇත. යුධ හමුදා නිලධාරීන් සහ භටයින් බන්ධනාගාරය තුලට පැමිණ යම් මෙහෙයුමක් සිදු කර ඇත. රාත්‍රී 12.00 පමණ වන විට තත්වය පාලනය කර ඇත.

ඉන් අනතුරුව සිවිල් ඇඳුමෙන් සැරසුන පුද්ගලයන් තිදෙනෙක් යුධ හමුදා නිලධාරීන් සමග මෙම නඩුවේ චෝදනාවන්හි නම් සඳහන් මරණකරුවන් වන නිමර්ල අතපත්තු, විජය රෝහන නොහොත් ගුණ්ඩු, සුසන්ත පෙරේරා නොහොත් මාල සුසන්ත යන අයව රාත්‍රී 12.30 ත් අළුයම 1.30 ත් අතරද නිලේන්ද්‍ර පැල්පොල නොහොත් මාලන්, අසරප්පුලිගේ ජෝතිපාල නොහොත් පොන්න කපිල සහ හෂර් ශ්‍රී මනිකීතරී නොහොත් මංජුශ්‍රී යන අයව අළුයම 4.30 ට පමණ ද මීට අමතරව කළු තුෂාර යන අය සහ කොණ්ඩ අමිල යන අය ඔවුන් සිටි සිර මැදිරි හෝ රැස්ව සිටි ස්ථාන වලින් රැගෙන ගොස් ඇති අතර සුළු වේලාවකින් ඒ දෙසින් යම් වෙඩි හඬ ඇසීමක් ද සිදු වි ඇත.

මෙම පුද්ගලයින් වෙන් වෙන්ව අවස්ථා කිහිපයකදී එක්ව සහ වෙන් වෙන්ව එසේ රැගෙන ගොස් ඇත. එක් අවස්ථාවක තිදෙනෙක්ද පසුව සමහර අය වෙන් වෙන්වද රැගෙන ගොස් ඇත. මේ සම්බන්ධයෙන් පසුව විස්තරාත්මකව සාක්ෂි සලකා බලනු ලැබේ. පසු දින උදෑසන මෙම අය තැන් තැන්වල වෙඩි වැදී මියගොස් සිට ඇත. ඉතාමත් පුළුල් ලෙස මින් මතුවට සාක්ෂි සලකා බලනු ලබන සාක්ෂිකරුවන්ගෙන් පොදුවේ හෙළිදරව් වන සිද්ධියේ ස්වභාවය ඉහත ආකාරයට වේ. අප විසින් දැන් මෙම සාක්ෂි වෙන් වෙන්ව සම්පිණ්ඩනය කර එම සාක්ෂිවල පිළිගත හැකි භාවය මුලින්ම පරීක්ෂා කරනු ලැබේ.

<u>සාක්ෂි සම්පිණ්ඩනය සහ පිළිගත හැකි භාවය සළකා බැලීම</u>

පැ.සා. 2 බන්ධනාගාර නියාමක පල්ලේකුඹුර වලව්වේ කුඩා බණ්ඩාර.

පැමිණිල්ල විසින් සිද්ධිය සම්බන්ධයෙන් මුලින්ම කැඳවූ සාක්ෂිකරු වන්නේ පැ.සා. 2 බන්ධනාගාර නියාමක පල්ලේකුඹුර වලව්වේ කුඩා බණ්ඩාර යන සාක්ෂිකරු වේ. මොහු 2012 වසර වන විට පලමු පෙල ජේලවර්රයෙකු වශයෙන් වැලිකඩ බන්ධනාගරයට අනුයුක්තව සේවය කර ඇත. 2012.11.09 වනදා ඔහු සේවයේ යෙදී සිටි අතර ඔහුගේ ජොෂ්ඨ නිලධාරී වන ප්‍රධාන ජේලර් වලිසුන්දර නිවාඩු යාම හේතුවෙන් එම රාජකාරිය ආවරණය කරමින් සිට ඇත. එසේ සිටිනා විට දහවල් 1.30 ට පමණ දිවා ආහාරය ගැනීමට ඔහුගේ නිල නිවසට ගොස් සිටිනා විට ප්‍රධාන ගේට්ටුවේ සිටි නියාමක දුරකථනයෙන් ඔහුට දැනුම් දී ඇත්තේ විශේෂ කායර් බලකායේ (වි.කා.බ.) නිලධාරින් 700 ක් පමණ බලෙන් බන්ධානාගාරය තුලට ඇතුලු වූ බවත් වහාම පැමිණෙන ලෙසටත්ය. ඒ අනුව ඔහු පැමිණි අවස්ථාවේ ආයුධ සන්නද්ධව එම නිලධාරීන් සිට ඇති අතර එසේ මෙවන් නිලධාරීන් පැමණෙන බවට මෙම සාක්ෂිකරු කලින් දැන සිට නැත. එම වි.කා.බ. නිලධාරින් 650 ක් හෝ 700 ක් පමණ එල්. ශාලාව දෙසට ගමන් කර සිට ඇත. එතැන රැදෙවියන් පරීක්ෂා කිරීමක් සිදු කරමින් තිබුණ බවත් එතැන බන්ධනාරගාර බුද්ධි අංශයේ ප්‍රධාන ජේලර් ඉන්දික සම්පත් අය සහ ජේලර් පුෂ්පකුමාර නැමැති අයෙක්ද සිට ඇත. සාක්ෂිකරු බන්ධනාගාර අධිකාරී ගාමිණී ජයසිංහ මහතාව අමතා මේ සම්බන්ධයෙන් දැනුම් දී ඇත. පසුව ගාමිණී ජයසිංහ, රණවන නැමැති වි.කා.බ. නිලධාරියා සහ මෙම සාක්ෂිකරු අධිකාරි තුමාගේ කායර්ාලයට ගොස් ඇති අතර එතැනදී වැපැල් අංශය සෝදිසි කිරීමට අවශ්‍ය බව දැනගෙන ඇත. එවැනි සෝදිසි කිරිමක් ඒ අවස්ථාවේ නොකරන ලෙසට මෙම සාක්ෂිකරු රණවන නිලධාරියාගෙන් ඉල්ලා ඇත. එසේ වුවද එම ඉල්ලීම සම්බන්ධයෙන් නිලධාරීන් අතර පොදු එකගත්වයක් තිබ් නැත. එම සෝදිසිය දිගටම කරගෙන ගොස් ඇති අතර පස්වරු 3.30 ට පමණ මෙම වැපැල් අංශයේ රැදෙවියන් කමර්ාන්ත අංශයේ සිට පැමිණීමට නියමිතව තිබී ඇත. සුළු වේලාවකට පසුව යම් ඝෝෂාවක් ඇසී ඇති අතර එහිදි මරණීය දණ්ඩනයට නියම වී සිටි සිරකරුවන් සහ වි.කා.බ හටයින් අතර උණුසුම් වචන හුවමාරුවක් සිදුවන බව සාක්ෂිකරුට ඇසී ඇත.

මේ අවස්ථාවේ සාක්ෂිකරු එතැන සිටි සහකාර පොලිස් අධිකාරී වරයෙකුට දැනුම් දී ඇත්තේ මෙයට පෙරද මෙවන් අවස්ථාවක විශාල ගැටළුකාරී තත්වයක් ඇති වූ බැවින් කණ්ඩායම රැගෙන නැවත යන ලෙසය. එකී නිලධාරියා ඊට කැමති වී නොමැත. සෝදිසිටය දිගටම කර ගෙන ගොස් ඇත. මේ වන විට ගැටළුකාරී

තත්වය තව උත්සන්න වී ඇති ඇතර සිරකරුවන් විවිධ දේ දමා ගසන තත්වයක් මතු වී ඇත. වි.කා. බ නිලධාරින් විසින් කඳුළු ගෑස් ගැසීමක් ද සිදු කර ඇත.

මෙම සාක්ෂිකරුද මේ අවස්ථාවේ කඳුළු ගෑස් හේතුවෙන් ප්‍රධාන කායර්ාලය වෙත පැමිණ ඇත. වි.කා.බ .නිලධාරීන් පසුව බන්ධනාගාරායෙන් පිටතට ගොස් ඇති අතර පිටත සිට කඳුළු ගෑස් ගැසීමක් සිදු කර ඇත මේ අවස්ථාව වන විට සිරකරුවන් 15 දෙනෙකු පමණ වහලය මත නැග ගිනි අවි සහිතව සිටි බවත් යම් වෙඩි තැබීමක් ද සිදු වී ඇති බවත් සාක්ෂිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

සාක්ෂිකරු විසින් තත්වය සම්බන්ධයෙන් එමිල් රංජන්, ගාමිණී ජයසිංහ, ඉන්ධික සම්පත් යන නිලධාරීන්ටද කතා කොට ඇති අතර ඔවුන්ගෙන් තත්වය පාලනය කර ගැනීම සඳහා උපදෙස් පතා ඇත. පසුව යම් සිරකරුවන් අතට පත්වී තිබූ අවි වලින් කොටසක් එකතු කර ගැනීමට මෙම සාක්ෂිකරු සමත් වී ඇත. මේ සඳහා කළුතුෂාර ඇතුළු රැදෙවියන්ගේ සහායද ලබාගෙන ඇත. එසේ වුවද මාලන් නැමැති සැකකරු ඔහු අත වූ තුවක්කුව ලබා දී නැති අතර ඒ වවන විට මෙම සාක්ෂි විසින් සිරකරුවන්ගෙන් ලබාගෙන තිබූ තුවක්කු කිහිපයක් සාක්ෂිකරුට තජර්නය කර රැගෙන ගොස් ඇත.

මේ අවස්ථාවේදී සාක්ෂිකරු බන්ධනාගාර විනය අංශයේ සිට ඇති අතර තත්වය යම් මට්ටමකට පාලනය වී තිබී ඇත. මෙම සාක්ෂිකරු විනය අංශයේ සිටිනා විට ලෙස්ටර් නැමැති රැදෙවියා එක්වරම වෙඩි වැදී සාක්ෂිකරු ඉදිරියේ මැරී වැටී ඇත. මේ සමඟ බරපතල තත්වයක් ඇති වී ඇති අතර මේ අවස්ථාවේ යුද හමුදා සෙබළුන් ඇතුළු කණ්ඩායමක් සන්නද්ධ රථ දෙකක් ද සමග බන්ධනාගාරය තුලට පැමිණ ඇත. මේ අවස්ථාවේ වෙඩි හඬ උත්සන්න වී ඇති අතර පසුව මෙම සාක්ෂිකරු සිටි ස්ථානයට හමුදා ඇඳුමෙන් සැරසුන් 10 ක් 12 ක් පමණ දෙනා ගිනි අවි ද සමග පැමිණ ඇත. පැමිණි අය සාක්ෂිකරුගේ නිල ඇඳුමෙන් ඔහුව හඳුනා ගෙන ඇත. මේ අවස්ථාවේ විනය අංශය තුල බන්ධනාගාර නිලධාරීන්ට අමතරව සිරකරුවන් කිහිපදෙනෙකුද සිට ඇත. එම අය ආරක්ෂාව පතා පැමිණි බව මෙම සාක්ෂිකරු හමුදා නිලධාරීන්ට දැනුම් දී ඇත. මේ අවස්ථාවේ සාක්ෂිකරු භාරයට ගෙන තිබූ ගිනි අවි හමුදා නිලධාරින්ට භාර දී ඇත.

ඉන් අනතුරුව මෙම සාක්ෂිකරු විනය අංශයෙන් පිටතට පැමිණ ප්‍රධාන ගේට්ටුව වෙත ගමන් කර ඇත. එසේ පැමිණ බෙස්ලයින් පාරේ ආසන්නයට ප්‍රධාන

දොරටුවෙන් පිටතට පැමිණ ඇත. මේ වන විට ප්‍රධාන දොරටුවේ සාමාන්‍යයෙන් සිටි නිලධාරින් සිට නැත.නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක ඇතුළුව පොලිස් නිලධාරින් ඒ අවට සිට ඇත. මේ අවස්ථාවේ සිවිල් පුද්ගලයින් දෙන්නෙක් බන්ධනාගාරයේ තාප්පය අසලින් මාගර්ය දිගේ පැමිණ බන්ධනාගාරය තුලට ගමන් කරනු සාක්ෂිකරු දැක ඇත. එම අය සාක්ෂිකරු විසින් මීට පෙර දැක තිබූ අය නොවන අතර සිවිල් ඇඳගත් අය මෙසේ බන්ධනාගරය තුලට ප්‍රවිශ්ඨ වන්නේ කුමකටද ඇතිවූ කුතුහලය මත ඔවුන් පසු පස මෙම සාක්ෂිකරු ගමන් කර ඇත. එසේ යන විට පුද්ගලයින් දෙදෙනෙක් නොව තිදෙනෙක් දැක ඇත. මුලින් ගිය අය නිල් පාට කොට කලිසමක් සහ කහ පාට ටී ෂටර් එකක් ඇද සිට ඇත. ඔහු අත ටෝච් එකක් තිබී ඇත. එම තිදෙනා මුළුතැන් ගෙය පසුකර ගමන් කරන විට සාක්ෂිකරු විසින් එතැන සිටි බන්ධනාගාර නිල ඇඳුමෙන් සිටි දෙදෙනෙකුගෙන් එම අය කවුද යවන්න විමසීමේදී "මෙයා තමයි නාකොටික් එකේ රංගජීව "යනුවෙන් ප්‍රතිචාර දක්වා ඇත. මෙම සාක්ෂිකරු මෙම අය මීට පෙර දැක නැති බවත්, එතැන සිටි එක් අයෙක් කළු පාට පුද්ගලයෙක් වන අතර ඔහු අධිකරණයේ සිටින 1 වන විත්තිකරු බවට හඳුනා ගෙන ඇත. එනම් ඒ අවස්ථාවේ නිල් පාට කොට කලිසමක් සහ කහ පාට ටී ෂටර් ඇදගෙන ටෝච් එකක් අතැතිව සිටි අයව සාක්ෂිකරු විසින් 1 වන විත්තිකරු බවට හඳුනා ගෙන සාක්ෂි දී ඇත. එම පිරිස වැපැල් වාට්ටුව දෙසට ගමන් කර එතැන දණ ගස්සවා සිටි සිරකරුවන් දෙසට ටෝච් එක එල්ලකර එම අය අතුරින් මාලන්, කපිල සහ මංජුශ්‍රී, යන තිදෙනාව එතැනින් හමුදා නිලධාරින් 4 දෙනෙකු හෝ 5 දෙනෙකු සමග වැපැල් ගොඩනැගිල්ලේ ඇතුලට රැගෙන ගොස් ඇත. මේ වන විට උදෑසන 4.30 පමණ වී ඇත.

ඉන් පසුව මෙම සාක්ෂිකරු එම්. වාට්ටුව ලග පෙර කී රැඳෙවියන් තිදෙනාගේ මලසිරුරු දැක ඇත. මීට අමතරව හමුදා ඇඳුමෙන් සිටි අය කළුතුෂාර නැමැති අයව එච්. වාට්ටුව සිට වයි.ඕ වාට්ටුව වෙත රැගෙන ගිය බවත්, මේ අවස්ථාවේ කළු තුෂාර යන අය "සර්, මාව මරන්න එපා .මට ගැණු ළමයි දෙන්නෙක් ඉන්නවා. මම වරදක් කලේ නැහැ "යනුවෙන් උස් හඩින් ප්‍රකාශ කරනු සාක්ෂිකරුට ඇසී ඇත. ඒ සමග වෙඩි හඩ 2 ක් හෝ 3 ක් ඇසුන බවත් කෑගැසීම නතර වූ බවත් සාක්ෂිකරු සඳහන් කර ඇත. මේ අවස්ථාවේ තමා අසල සිටි කොඩිප්පිලි මහතා "හා, හා කළු තුෂාර ඉවරයි." යනුවෙන් ප්‍රකාශ කරනු තමාට ඇසුණු බවද සාක්ෂිකරු සඳහන් කර ඇත.

ඉන් අනතුරුව 2 වැනි විත්තිකරු එමිල් රංජන් යන අය බන්ධනාගාර හමුදා අනුකණ්ඩයේ මේජර් වරයෙකු සමග කෝවිල් අංශයේ සිට සිරකරුවෙක් වන කොණ්ඩ අමිල යන අය නැගිට්ටවා ගෙන ඇත. එසේ කොණ්ඩ අමිලව පෙන්වා දී ඇත්තේ 2 වැනි විත්තිකරු වේ. එසේ ඔහුව නැගිට්ටවා ගෙන 2 වැනි විත්තිකරු විසින් හමුදා මේජවර්රයාද සමග ප්‍රධාන කායර්ාලය පිටුපස දොරෙන් ඇතුලට රැගෙන ගොස් ඇත. එසේ ඇතුළු වුවායින් පසුව එම අය නොපෙනී ගොස් ඇත. එසේ සිදුවී ඇත්තේ 2012.11.10 දින පෙරවරු 5.55.ත් 6.15 ත් අතරය. ඉන් පසුව මෙම කොණ්ඩ අමිල නැමැති අය ඊට ඔබ්බෙන් වූ වෙරළු ගහක් යට මැරී සිටිනු සාක්ෂිකරු නිරීක්ෂණය කර ඇත.

පසුව දුරකථන කුටිය තුල බන්ධනාගාර නියාමක නානායක්කාර අවි ලේඛන ගතකරමින් රැඳෙවියන්ගෙන් ලබාගත් ගිනි අවි භාරගැනීම සිදු කරමින් සිට ඇත. ඒ අවස්ථාවේ එතැන තිබූ කිසියම් හෝ පොතක් භාවිතා කර මෙම ගිනි අවි ලේඛනගත කර භාරගැනීම නානායක්කාර විසින් සිදුකරමින් සිටිනා විට පෙරවරු 7.00 ත් 7.30 ත් අතරදී 2 වැනි විත්තිකරු එමිල් රංජන් එතැනට පැමිණ ටී. 56 තුවක්කු හතරක් නානායක්කාරගෙන් ඉල්ලා ඇත. ඒවා නිකුත් කිරීමට නානායක්කාර අදිමදි කල නමුත් එතැන සිටි කොඩිප්පිලි මහතා උස් හඬින් "ඕක දෙනවා ඉක්මනට" යනුවෙන් ප්‍රකාශ කිරීමත් සමග නානායක්කාර ගිනි අවි 4ක් 2 වැනි විත්තිකරුට භාර දී ඇත. පසුව මෙම ගිනි අවි 4 මියගොස් සිටි අය අසල දමා තිබෙනු මෙම සාක්ෂිකරු දැක ඇත. එනම් කපිල සහ මාලන් වැටී සිටි තැන සහ කළුතුෂාර සහ විජය රෝහණ යන අයගේ මලසිරුරු ආසන්නයේද අවි තිබී ඇත. මෙම සාක්ෂිකරු මුල් අවස්ථාවේ එම මලසිරුරු දකින විට තුවක්කු නිරීක්ෂණය කර නැත. නමුත් පෙරවරු 8.15න් පසුව එම මලසිරුරු අසල ගිනි අවි තිබෙනු සාක්ෂිකරු දැක ඇත.

ඔහු එදින උදෑසන 8.15 ට පසුව ඔහුගේ නිල නිවසට ගිය අවස්ථාවේ ඔහුගේ බිරිඳ දැනුම් දී ඇත්තේ යමෙකු දුරකථනයට අමතා පරිස්සමෙන් වැඩ කරන්න යනුවෙන් තජර්නය කර තිබූ බවය. සාක්ෂිකරු ඉන් පසුව නැවත බන්ධනාගාරයට පැමිණ ඇත. පසුව සිවිල් ඇඳුමෙන් පැමිණි පොලිස් නිලධාරියෙක් ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගෙන ඇත.

මෙම සාක්ෂිකරු ඉන්පසුව කොමසාරිස් වික්‍රමසිංහ ඉදිරියේද අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවටද 2015 ට පෙර ප්‍රකාශ ලබා දුන් නමුත් රැඳෙවියන්ගේ මරණයන්

සිදු කිරීමට අදාලව කිසිවක් හෙලිදරව් කර නැත. මුල් වතාවට මෙහි රුදෙවියන් 1 වැනි විත්තිකරු සහ 2 වැනි විත්තිකරුවන් විසින් රැගෙන යාම ඇතුළු කාරණා හෙලදරව් කර ඇත්තේ කපිල වෛද්‍යරත්න නැමැති ආරක්ෂක ලේකම්ට සහ ඉන් අනතුරුව විජේදාස රාජපක්ෂ යන ඇමතිවරයාට වේ. එනම් 2015 දී නව රජයක් පත්වීමත් සමග මෙම සාක්ෂිකරුට ඔහු දන්නා කරුණු හෙලිදරව් කරන ලෙස දුරකථන ඇමතුමක් ලැබී ඇත. ඒ බව සාක්ෂිකරු විසින් එවකට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් පල්ලේතැන්නට දැනුම් දී ඇත.

එසේ දැනුම් දීමෙන් අනතුරුව පල්ලේතැන්න විසින් සාක්ෂිකරුව එවකට අධිකරණ ඇමතිව සිටි විජේදාස රාජපක්ෂ වෙත රැගෙන ගොස් ඇත. ඉන් අනතුරුව මෙම රුදෙවියන් 1 සහ 2 වන විත්තිකරුවන් විසින් රැගෙන යාම සම්බන්ධයෙන් තේනබදු සහ නම්බුවසම් කොමිටිවලදී සාක්ෂිකරු විසින් කරුණු හෙලිදරව් කර ඇත. එසේම 2017 විශේෂ විමශර්න ඒකකය වෙත කල ප්‍රකාශයේද එකී කරුණු සාක්ෂිකරු විසින් සඳහන් කර ඇත. මොහුව දීසර් වශයෙන් විත්තිකරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්න වලට භාජනය කර ඇත. එහිදි 2015 දක්වා මෙම සිද්ධිය එනම් 1,2 විත්තිකරුවන් සම්බන්ධයෙන් වන කාරණා තමා විසින් කිසිවෙකුට හෙලිදරව් නොකල බවත් එය එවකට පැවති බලධාරීන් මෙම සිද්ධිය පිටුපස සිටීම සහ තමාට ලැබුන තජර්නාත්මක ඇමතුම් ඇතුළු හේතු මත තමාගේ ආරක්ෂාව සඳහා වසන් කරගෙන සිටි බවත් සාක්ෂිකරු හරස ප්‍රශ්න වලදී පිලිගෙන ඇත. ඒ අනුව මුල් අවස්ථාවේ මෙම කරුණු සඳහන් නොකිරීම මත ඌණතා ගණනාවක් මතුකර ඇත. විත්තියෙන් යෝජනා කර ප්‍රශ්න කර ඇත්තේ 2016 වසරේදී සාක්ෂිකරුට උසස් වීමක් ලැබුන බවය. සාක්ෂිකරු එය පිලිගෙන ඇත. කොණ්ඩ අමිල පිලිබඳ සිද්ධිය වික්‍රමසිංහ කොමිටියට මෙන්ම අතපත්තු කොමිටියට ප්‍රකාශ නොකල බව සාක්ෂිකරු පිලිගෙන ඇත.

**<u>පැ.සා. 3 සෙනරත් බන්දුල ලියනාරච්චි</u>**

2012.11.09 වන දින ඔහු වැලිකඩ බන්ධනාගාරයේ විශේෂ අංශයේ රඳවා සිටි අයෙකු වන බවත් එම කාලයේදී මංජුශ්‍රී, සුසන්ත, නිමර්ල අතපත්තු, ගුණ්ඩු මාමා නොහොත් මොහොමඩ් විජය රෝහණ යන නම් වලින් රුදෙවියන් සිටි බවද එදින පෙ.ව.11.30 ට පමණ මෙම වාට්ටුවේ රුදෙවියන් ව්‍යායාම සඳහා පිටතට ගත් බවද

සඳහන් කර ඇත. මේ අවස්ථාවේ වාට්ටු පරීක්ෂා කරන බවට ආරංචියක් ලැබී ඇති අතර පසුව වැපැල් අංශය දෙසින් කෑගසන ශබ්දයක් සහ ඝෝෂාවක් ඇසී ඇත. මෙය තරමක් උත්සන්න වූ බවත් දහවල් 1.30 පමණ වන විට කඳුලු ගෑස් ප්‍රහාරයක්ද එල්ල වී ඇත. මේ අවස්ථාව වන විට මෙම සාක්ෂිකරු සහ අනෙකුත් රැඳෙවියන් වාට්ටුව තුල සිට ඇති අතර කඳුලු ගෑස් ප්‍රහාරය හේතුකොට ගෙන ඇතුලත සිටීමට අපහසු වී ඇත. ඒ අවස්ථාවේ වාට්ටුවේ දොර විවෘත කර දුන් බවත් රැඳෙවියන් පිටතට පැමිණි අතර සමහර රැඳෙවියන් වි.කා.බ නිලධාරීන් වෙත ගල්මුල් වලින් පහරදීමක්ද සිදු කල බවත් රැඳෙවියන් 10 දෙනෙකු පමණ කුස්සියේ වහලයට නැග මේ ආකාරයට හැසිරුණ බවත් සාක්ෂිකරු දැක ඇත. මේ අවස්ථාවේ බන්ධනාගාර අධිකාරී ජයසිංහ මහතාත් ඇතුළු පිරිසක් සාකච්ඡා කරමින් සිට ඇති අතර කඳුලු ගෑස් සැර වැඩිවීමත් සමඟ ඔවුන් පිටව ගොස් ඇත. මේ වන විට යම් වෙඩි ශබ්දද ඔහුට ඇසී ඇත.

මේ ආකාරයට කලහකාරී තත්වය උත්සන්න වී ඇති අතර රැඳෙවියන් අත ගිනි අවි තිබෙනු සාක්ෂිකරු දැක ඇත. මාලන් නැමැති සිරකරු අතේද ගිනි අවියක් තිබී ඇත. මේ වන විට සවස 4.30 පමණ වී ඇති අතර මෙම සාක්ෂිකරු වයි.ඕ වාට්ටුව අසල සවස 4.30 වන තෙක් රැඳී සිට ඇත. ඉන් පසුව රැඳෙවියන් සියළු දෙනා වාට්ටුව තුලට ගොස් දොරට ඉබ්බෙක්ද දමා ගෙන ඇතුලට වී සිට ඇත.

රාත්‍රී 11.30 ට 11.45 ත් අතර යුධ හමුදා නිලධාරීන් මෙම වාට්ටුව දෙසට පැමිණ ඇති අතර ඉන් එක් අයෙකු වෙඩි පහර 3 ක් බිත්තිය වෙත එල්ලකර අවි ඇත්නම් භාරදෙන ලෙස ප්‍රකාශ කර ඇත. වාට්ටුව තුල සිටි රැඳෙවියන් කිසිවෙකු අත ගිනි අවි තිබී නැත. එසේ පැමිණි හමුදා නිලධාරියෙක් ගේට්ටුවේ ඉබ්බාට වෙඩි තබා ගේට්ටුව විවෘත කර රැඳෙවියන් එලියට ගෙන අත් රෙදි පටි වලින් ගැට ගසා පෝලිම් කර ඇත. ඒ අවස්ථාවේ රැඳෙවියන් 28 දෙනෙකු සිටි බවත් මේ වන විට රාත්‍රී 12.00ත් 1.00 ට ත් අතර වූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. වාට්ටුව තුල විදුලි ආලෝකය තිබී ඇත. මෙසේ සිටිනා විට විනාඩි 15 කින් පමණ පසුව තිදෙනෙකු පැමිණි බවත් ඉන් දෙදෙනෙකු සිවිල් ඇඳුමෙන්ද එක් අයෙක් බන්ධනාගර නිල ඇඳුමකින්ද සැරසී සිටි බවත් එසේ පැමිණි එක් අයෙකු මෙම අධිකරණයේ සිටින 1 වන විත්තිකරු වන නාකොටික් එකේ රංගජීව බවටත්ද සාක්ෂිකරු විසින් හඳුනා ගෙන ඇත. 1 වන විත්තිකරු ඒ අවස්ථාවේ නිල් කලිසමක් සහ ටී ෂටර් එකක් ඇඳ සිට බවත් හඳුනා නොගත් අනික් අය කළු කලිසමක් සහ කළු ටී ෂටර් එකක් ඇඳ සිටි බවත් සාක්ෂිකරු නිරීක්ෂණය කර ඇත. නිල ඇඳුමෙන් පැමණි අය බන්ධනාගාර

ගේට්ටුවේ රාජකාරී කරන අයෙක් බව සාක්ෂිකරු ඊට පෙර දැක ඇති නමුත් අනෙක් පුද්ගලයා ඊට පෙර දැක නැති අයෙකු බව ප්‍රකාශ කර ඇත.

1 වන විත්තිකරු සාක්කුවෙන් කොලයක් ගෙන නම් කිහිපයක් කතා කර ඇති අතර එම නම් කතාකරන ලද අයගෙන් 3 දෙනෙකු එතැන සිට නැත. එම නම් අතර තුෂාර, උක්කුවා, අතපත්තු, මාල සුසන්ත සහ ගුණ්ඩු මාමා යන අයගේ නම්ද ඩොල්පින් චන්දන යන අයගේ නම්ද තිබී ඇත. මෙසේ නම් කතා කරන විට එතැන සිටි අතපත්තු, මාලසුසන්ත සහ ගුණ්ඩු යන තිදෙනා නිශ්ශබ්දව සිට ඇති නමුත් 1 වන විත්තිකරු ජංගම දුරකථනයක ආලෝකයෙන් පරීක්ෂා කරමින් මෙම අය අසලට පැමිණ ඔවුන් හඳුනා ගෙන ඔවුන්ව වාට්ටුව තුලට රැගෙන ගොස් ඇත. තවද ඩොල්පින් චන්දන නැමැත්තෙකුද මේ ආකාරයට රැගෙන ගොස් ඇත. පොන්න කපිල නැමැත්තා සම්බන්ධයෙන් විමසූ නමුත් ඔහු එතැන සිට නැත. ඉන් පසුව 1 වැනි විත්තිකරු සහ හමුදා නිලධාරීන් විසින් සුසන්ත, ගුණ්ඩු සහ නිමර්ල අතපත්තු යන තිදෙනා රැගෙන ඔවුන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමට ඇති බව ද සඳහන් කරමින් එම තිදෙනාම පරණ ඉස්ටෝරුව පැත්තට රැගෙන ගොස් ඇත.

මෙසේ මෙම තිදෙනා රැගෙන යන විට අළුයම 1.30 ට පමණ වූ බවත් ඊට විනාඩි 15 ක් හෝ 20 කට පමණ පසුව වාට්ටුවට පිටුපසින් වෙඩි ශබ්ද 5 ක් 6 ක් මෙම සාක්ෂිකරුට ඇසී ඇත. ඊට ටික වේලාවකට පසුව නැවත වරක් 1 වැනි විත්තිකරු මුහුණ ආවරණය කරගත් අයෙකු සමග පැමිණ යම් අයෙකු සම්බන්ධයෙන් පරීක්ෂා කර ඇත. මංජු නැමැති අයෙකුට අවශ්‍යනම් යාමට හැකි බවට ප්‍රකාශ කර ඇත. එසේ වුවද මංජු නැමැත්තා හෙට දින යන බව දැනුම් දී ඇත. අළුයම 4.00 ත් 4.15 ට පමණ යුධ හමුදාවේ දෙදෙනෙකු පැමිණ "වැටිලා ඉන්න එකෙක්ට පණ තිබෙනවා. ඔහු වතුර ඉල්ලනවා. ඕකව ඉවරයක් කරපන්. නැතිනම් අපිට ප්‍රශ්නයක් ඇති වෙනවා" යනුවෙන් ප්‍රකාශ කරනු සාක්ෂිකරුට ඇසී ඇත. පසු දින උදේ වාට්ටුවේ ඇති කවුළුවෙන් පිටත නිරීක්ෂණය කිරීමේදී ගුණ්ඩු මාමා, නිමර්ල අතපත්තු සහ සුසන්ත යන තිදෙනා වැටී සිටින සාක්ෂිකරු දැක ඇත. කළුතුෂාර නැමැත්තාද ඒ ආසන්නයේ වැටී සිටිනු සාක්ෂිකරු නිරීක්ෂණය කර ඇත. තවද 3 වැනි විත්තිකරු ලෙස නම් කර ඇති ඉන්දික යන නිලධාරියා විසින් ගිනි අවි එම වැටී සිටි අය ආසන්නයේ තබා යනු සාක්ෂිකරු නිරීක්ෂණය කර ඇත. 3 වන විත්තිකරු වන ඉන්දික යන අය පැ. 37 ඡායා රූපයේ සිටින පුද්ගලයා ලෙස සාක්ෂිකරු විසින් හඳුනා ගෙන ඇත.

මෙම සිද්ධිය සම්බන්ධනේ මුලින්ම කමිටුවකට සාක්ෂි දුන් බවත් ඊට පසුව අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවට ප්‍රකාශයක් මෙම සාක්ෂිකරු ලබා දී ඇත. කමිටුව ඉදිරියේ සාක්ෂි දීමෙන් අනතුරුව තමාට විවිධ ආකාරයේ තජර්න සහ බලපෑම් සිදු වුන බවත් එමිල් රංජන් නැමැති 2 වැනි විත්තිකරු තමාව විවධ ස්ථාන වලට මාරුකල අතර සාක්ෂි දුන්නොත් වෙඩි කන්න වන බවට තජර්නය කල බවද සාක්ෂිකරු සඳහන් කර ඇත. කිරිබත්ගොඩ පොලිසියටත්, පොලිස් කොමිසමටත් මේ සම්න්ධයෙන් සාක්ෂිකරු විසින් පැමිණිලි කර ඇත.

**<u>පැ.සා. 04. ඉන්දික පෙරේරා</u>**.

මොහු මිණීමැරිමක් සම්බන්ධයෙන් වරදකරු වී වැලිකඩ බන්ධනාගරයේ ඔහුගේ සහෝදරයා වන කපිල නැමැත්තාද සමග වැපැල් අංශයේ සී. 3 වාට්ටුවේ රඳවා සිට ඇත. 2012.11.09 වන දින ප.ව.2. 00ට විතර වි.කා.බ. නිලධාරීන් 30 ක් 40 ක් පමණ කණ්ඩායමක් වාට්ටුව තුල සිට අය එලියට ගෙන අත් ගැට ගැසූ බවත් මෙසේ පරීක්ෂා කිරීම හේතුවෙන් රැදෙවියන්ද කලහකාරී ලෙස හැසිරුනු අතර සවස්වන විට කලහකාරී කලබලකාරී තත්වයක් ටිකෙන් ටික වධර්නය වූ බවත් පසුව කඳුළු ගෑස් ගැසීමක්ද සිදු වූ බවත් සාක්ෂිකරු සඳහන් කර ඇත. සවස 4. 00 පමණ වන විට රැදෙවියන් මුහුණ සෝදා ගෙන වාට්ටුව තුලට වී රාත්‍රි 12. 00 පමණ වන තෙක් සිට ඇත.

ඉන් අනතුරුව අනෙකුත් රැදෙවියන් නැවත වාට්ටුව තුලට දමා ඇත. සවස 3.00 සහ 4.00 අතර කාලයේදී කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ලවීමෙන් අනතුරුව රැදෙවියන් සියළු දෙනා වාට්ටුව තුලට ගොස් සිටි බවත් ඉන් අනතුරුව රාත්‍රි 12.00 ට පමණ නැවත වරක් හමුදාවේ පිරිසක් වැපල් වාට්ටුව දෙසට පැමිණි බවත් සාක්ෂිකරු සඳහන් කර ඇත. එසේ එනවාත් සමගම වෙඩි ශබ්දයක් ඇසී ඇති අතර එම කණ්ඩායම වෙඩි තබමින් ඉදිරියට පැමිණි බව මෙම සාක්ෂිකරු නිරීක්ෂණය කර ඇත. එසේ පැමිණි හමුදා පිරිස එතැන සිටි මාලන් නැමැති රැදෙවියාව ඔවුන්ගේ භාරයට ගෙන ඇත. ඉන්පසුව වාට්ටුව තුල සිටි අය පිටතට ගෙන ඒ ආසන්නයේ පිහිටි කෑම ශාලාව ඉදිරිපිට සියළු දෙනා දණ ගස්සවා ඇත. මේ වන විට වේලාව අළුයම 2.00 පමණ වූ බවත් ගොඩනැගිල්ල තුල විදුලි ආලෝකය තිබූ බවත් සාක්ෂිකරු සඳහන් කර ඇත.

ඒ අවස්ථාවේ 1 වන විත්තිකරු කැමරාවක් වැනි දෙයක් රැගෙන විත් එහි ආලෝකය මෙම සාක්ෂිකරුගේ මුහුණට එල්ල කර ඇත. මේ ආකාරයටම ඔහුගේ සහෝදරයාගේ මුහුණටද එය එල්ල කර ඇත. මෙසේ සිදු කිරීමෙන් අනතුරුව 1 වන විත්තිකරු එලියට ගොස් නැවත පැමිණ තම සහෝදරයාව එලියට ගෙන ඇත. මුලින්ම සහෝදරයාව එලියට ගන්නා විට සහෝදරයා "රංගජීව මහත්තයා අපිට එලියේ ඉන්න දෙන්නෙත් නැහැ. ඇතුලේ ඉන්න දෙන්නෙත් නැහැ." යනුවෙන් ප්‍රකාශ කල බවත් රංගජීව සමග තව දෙදෙනෙක් එම ස්ථානයේ සිටි බවත් සාක්ෂිකරු නිරීක්ෂණය කර ඇත.

තම සහෝදරයාගෙන් ආයුධ සම්බන්ධයෙන් ප්‍රශ්න කල බවත් ආයුධ නොමැති බව සහෝදරයා ප්‍රකාශ කල අවස්ථාවේ ඔහුට පිහියකින් බඩට සහ පපු ප්‍රදේශවලට රංගජීව විසින් ඇන්න බවත් සාක්ෂිකරු ප්‍රකාශ කරයි. පසුව සිවිල් ඇඳුමෙන් සිටි අයෙකු තම සහෝදරයාව කොලරයෙන් අල්ලා එස්.පී මහත්තයාගේ කන්තෝරුවට රැගෙන යනු මෙම සාක්ෂිකරු දැක ඇත. තම සහෝදරයා රැගෙන යන විට රංගජීව යන 1 වන විත්තිකරුද ඒ සමග ගිය බවත් එසේ රැගෙන යන අවස්ථාවේ මෙම සාක්ෂිකරු කිසිවක් නොකියා නිශ්ශබ්දව සිටි බවත් ඔහුගේ සාක්ෂියෙන් සඳහන් වේ. එසේ නිශ්ශබ්දව සිටියේ එම අය විසින් තමාවද මරණු ඇතැයි යන සැකය මත බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මේ අවස්ථාවේ තම සහෝදරයා පමණක් රැගෙන යනු දුටු බවද, 1 වන විත්තිකරු මීට පෙර දැක ඇති නමුත් රංගජීව වශයෙන් හඳුනා ගත්තේ තම සහෝදරයා රංගජීවගේ නම ප්‍රකාශ කිරීම නිසා බව සාක්ෂිකරු පිලිගෙන ඇත. ඊට අමතරව 1 වන විත්තිකරුගේ මුහුණද තමා නිරීක්ෂණය කල බව සාක්ෂිකරු ප්‍රකාශ කරයි. 1 වන විත්තිකරු ඒ අවස්ථාවේ ඇද සිටියේ කළු පාට දිග කලිසමක් සහ කළු පාට බැනියමක් බව මෙම සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. සහෝදරයා රැගෙන යාමට හේතුව වශයෙන් සඳහන් කලේ කටඋත්තරයක් ගැනීමට බවත් ෙමෙම සාක්ෂිකරු වැඩිදුරටත් හෙලිදරව් කර ඇත.

නැවත පිරිස පෙරවරු 4.00 ට පමණ වාට්ටුව තුලට දැමූ බවත් තම සහෝදරයා රැගෙන ගිය පසු වෙඩි ශබ්ද දෙකක්ද මෙම සාක්ෂිකරුට ඇසී ඇත. තම සහෝදරයා රැගෙන ගිය දෙසින් එම ශබ්දය ඇසෙන විට ඔහුව රැගෙන ගොස් පැය කාලක් පමණ ගතවී තිබී ඇත. පසුව අළුයම 5.00 ට පමණ තම සහෝදරයා මරා දමා ඇති බවට මෙම සාක්ෂිකරුට දැන ගැනීමට ලැබී ඇත. තම සහෝදරයා මරා දමා ඇති බව දැනගත් නමුත් එම ස්ථානය හෝ මිනිය මෙම සාක්ෂිකරුට පෙන්වා නැත.

මෙම අධිකරණයේ සාක්ෂි දෙමින් පැ.07 ඡායා රූපයේ සිටින්නේ ඔහුගේ මියගිය සහෝදරයා බවට සාක්ෂිකරු විසින් හඳුනා ගෙන ඇත. පැ. 11 ඡායා රූපයේ සිටින්නේ මාලන් නැමැති අය බවද පැ. 09 ඡායා රූපයේ සිටින්නේ හාමුදුරුවෝ මරපු කෙනා වන නිලමේ නැමැති අය බවට සාක්ෂිකරු හඳුනා ගෙන ඇත. ඉන්පසුව ඔහුගේ මූලික සාක්ෂිය අවසන් කර ඇත.

හරස් ප්‍රශ්න වලදී පිලිතුරු දී ඇති ආකාරය අනුව සිද්ධිය සිදු වී සති 2 ක් 3 ක් අතර සී.අයි.ඩී යෙන් කටඋත්තර ලබා ගත් අවස්ථාවේ ඔහු ඉදිරිපත් වී නැත. ඊට හේතුව වශයෙන් සාක්ෂිකරු සඳහන් කර ඇත්තේ පසු ගිය රජයෙන් තම සහෝදරයා මැරූ බවත් එබැවින් සාක්ෂිදීමෙන් ප්‍රයෝජනයක් නොවන බව තමාට වැටහී ගිය නිසා බවත්ය. ඊට යම් කලකට පසුව තමාගෙන් කටඋත්තරයක් ගත් බවත්, නම්බුවසම් කමිටුවේ සාක්ෂි දුන් බවත් ඔහු පිලිගෙන ඇත. ඔහුගේ සාක්ෂියේදී මතු කර ඇති ඌණතා සහ පරස්පරතා වන්නේ,

01. මාලන් ගාව පමණක් T- 56 ක් ඇති බවට සාක්ෂි දී ඇති නමුත් 2017 අ.ප.දේ. වට කල ප්‍රකාශයේ T- 56 80 ක් පමණ තිබුන බව සඳහන් කර තිබීම 1 වි. 18 වශයෙන් ලකුණු කර ඇත. බන්ධනාගාර කුස්සියේ වහල උඩ පේන්නේ නැති බවට සාක්ෂි දී ඇතත් ප්‍රකාශයේ " කුස්සියේ වහලට උඩ සිරකාරයෝ තුවක්කු තියාගෙන සිටියා "යනුවෙන් සඳහන් කර තිබීම 1 වි. 19 වශයෙන් පරස්පරයක් ලෙස ලකුණු කර ඇත. හරස් ප්‍රශ්න අතරතුරදී තම සහෝදරයා වන කපිලට දුරකථන ඇමතුමක් තවත් සිරකරුවෙකුගේ දුරකථනය මගින් ලැබුණ එක පිලිගෙන ඇත. කපිල එම ඇමතුමට කතා කල බවත් පසුව මෙම සාක්ෂිකරුටද දුරකථන ඇමතුමක් ලැබී ඇත. එය එස්.ටී.එෆ් එකේ රණවන මහතා විසින් තම සහෝදරයා සම්බන්ධයෙන් කල විමසීමක් වේ.

02. තවද නම්බුවසම් කොමිටියේදී සිරකරුවන් අත තුවක්කු 80 ක් පමණ තිබූ බව දී තිබූ සාක්ෂියේ පරස්පරයක් වශයෙන් 1 වි. 18 ලකුණු කර ඇත. තවද මොහු සිටි ස්ථානයේ සිට සිරකරුවන් නැග සිටි වහලය පෙනෙන්නේ නැති බව ප්‍රකාශ කර ඇත. එසේ වුවද බන්ධනාගාර කුස්සිය උඩ වහලෙන් සිරකරුවෝ තුවක්කු අතැතිව සිටි බව නම්බුවසම් කොමිසමට දුන් සාක්ෂි කණ්ඩය 1 වි. 19 ලෙස පරස්පරයක් ලෙස ලකුණු කර ඇත. තවද සිරකරුවන් වෙඩි තබනු දුටුවේ නැති

බවට සාක්ෂි දී නැති නමුත් නම්බුවසම් කොමිටියේදී බන්ධනාගාරය ඇතුලේ සිට එලියටත් එලියේ සිට ඇතුලටත් වෙඩි තබනවා දැක්කා යනුවෙන් සඳහන් කොටස 1 වි. 20 වශයෙන් පරස්පරයක් ලෙස ලකුණු කර ඇත. 1 වන විත්තිකරු වෙනුවෙන් යෝජනා කර ඇත්තේ කපිල නැමැති සහෝදරයාව 1 වන විත්තිකරු රැගෙන ගිය බවට දුන් සාක්ෂිය අසත්‍යයක් බවය. එසේම මියගිය කපිල යන අය "රංගජීව මහත්තයා අපිට එලියේ ඉන්න දෙන්නෙත් නැහැ, ඇතුලේ ඉන්න දෙන්නෙත් නැහැ "යනුවෙන් සඳහන් කරුණ සී.අයි.ඩී. ප්‍රකාශයේ සඳහන් නොකල බව මෙම සාක්ෂිකරු පිලිගෙන ඇත.

03. 2 වන විත්තිකරු වෙනුවෙන් හරස් ප්‍රශ්න අතරතුරදී 2017.08.17 වන දින සී.අයි.ඩී එකට ප්‍රකාශය ලබා දුන්නේ අනුරාධපුර බන්ධනාගාරයේ සිටියදී බව පිලිගෙන ඇත. ප්‍රකාශයක් ගත් බව පිලිගෙන ඇති අතර එය නැවත කියවා දීමක් සිදු වූයේ නැති බව සාක්ෂිකරුගේ ස්ථාවරය වේ. ලොකු නැමැති අය තුවක්කුවක්ද රැගෙන තුෂාරව මරන්න හොයපු බව ආරංචි වී ඇත. තවද එදින වෙනදා මෙන් බන්ධනාගාරයේ කටයුතු කෙරුනේ නැති බවත් වාට්ටු සවස 5.00 ට වැසුවේ නැති අතර රෑට කන්න හම්බුනේ නැති බව ප්‍රකාශ කර ඇත. මේ හැර 2 වන විත්තිකරු වෙනුවෙන් කිසිදු ස්ථාවරයක් යෝජනා කර නැත.

<u>පැ.සා. 1. නන්දිමාල් සිල්වා.</u>

සිද්ධිය වන විට බන්ධනාගාරගතව සිටි අයෙකු වන අතර ඔහු සිරකරුවන්ගේ අයිතිවාසියකම් සම්බන්ධයෙන් ක්‍රියාකාරීව කටයුතු කරන අයෙකුද වේ. 2012.11.09 වන දින ඔහු පන්සල් වාට්ටුවේ සිටින විට දහවල් 12.00 ටපමණ යම් කලබලයක් දැක ඇත. හමුදා ඇඳුම් ඇඳගත් අය ඇතුලට එන එක දැක ඇත. එතැන් පටන් ඔහු පෙර සාක්ෂිකරුවන් සඳහන් කරන ලද ආකාරයේ සිද්ධි මාලාව සම්බන්ධයෙන් සාක්ෂි දී ඇත. ඉන් පසුව යුධ හමුදාව පැමිණීමත් සිරකරුවන් සමහර අය හට ආයුධ තිබුණ බවත් කුඩා බණ්ඩා එම අවි එක් රැස් කිරීමට කටයුතු කිරීම ඇතුළු කාරණා සම්බන්ධනේද සාක්ෂි දී ඇත. රාත්‍රී 12.00 ට පමණ ආර්.සී. ඔෆිස් එකේ සිටිනා විට ලෙස්ටර් නැමැත්තෙකුට වෙඩි වැදුන බවත් ඉන් අනතුරුව යුධ හමුදාව පැමිණි අතර වෙඩි හුවමාරුවක් ඔහු දැක ඇත. ඉන් පසුව පැමිණි හමුදා නිලධාරීන් අවි අයුධ ඇති අය සම්බන්ධයෙන් විමසූ බවද කළු තුෂාර නැමැත්තාද ඒ අසල රැඳෙවියන් සමග

සිටිනු මෙම සාක්ෂිකරු දැක ඇත. කුඩා බණ්ඩා විසින් විස්තර කරන ලද සිද්ධි මාලාවද විස්තර කර ඇත. පාන්දර 4 ට පමණ සිවිල් ඇඳුමෙන් පිරිසක් පැමිනි බවද එම අය ඇද සිටි ඇඳුම්ද සාක්ෂිකරු විස්තර කර ඇත. එසේ සිවිල් ඇඳුමෙන් පැමිණි අය අතර සිටි මෙම 1 වන විත්තිකරු කළුතුෂාර සම්බන්ධයෙන් විමසා ඇත. කළුතුෂාරව 1 වන විත්තිකරු විසින් හඳුනා ගෙන " අම්මට හුඩු මේ ඉන්නේ භාණ්ඩය" යනුවෙන් ප්‍රකශ කර ඇති අතර කළු තුෂාර විසින් "රංගජීව මහත්තයා මාව මරන්න එපා මට දරුවෝ ඉන්නවා. " යනුවෙන් ප්‍රකාශ කල බව සාක්ෂිකරු පවසා ඇත. කළුතුෂාරව හමුදා නිලධාරින්ද සමග ඇදගෙන ගිය බවත් පහරදීමක්ද සිදු වූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එසේ රැගෙන යාමෙන් අනතුරුව වෙඩි ශබ්ද කිහිපයක් ඇසුන බවත් මේ අවස්ථාවේ කොඩිප්පිලි සහ ඉන්දික යන අයද ඒ අවට සිටි බවත් සාක්ෂිකරු දැක ඇත. තවද කොණ්ඩ අමිල යන අයද 2 වැනි විත්තිකරු විසින් රැගෙන යනු සාක්ෂිකරු දැක ඇත. අළුයම 6.00 ට පමණ එසේ රැගෙන යාමෙන් අනතුරුව වෙඩි ශබ්ද 2 ,3 ක් සාක්ෂිකරුට ඇසී ඇත. 1 වන සහ 2 වන විත්තිකරුවන් පිලිවෙලින් රංගජීව සහ එමිල් එරංජන් ලෙස අධිකරණයේදී සාක්ෂිකරු හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරු දීඝර් සිදුවීම් මාලාවක් ප්‍රකාශ කර ඇති අතර හරස් ප්‍රශ්න වලදී ඌනතා සහ පරස්පරතා විශාල ප්‍රමාණයක් මතුකර ඇත. මෙම ඌනතා අතුරින් කොණ්ඩ අමිල යන අය රැගෙන ගිය අවස්ථාවේ එමිල් රංජන් ඊට සහභාගි වූ බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එසේ වුවද කෝණ්ඩ අමිලව රැගෙන යන විට එමිල් රංජන් පස්සෙන් ගිය බව මෙම සාක්ෂිකරු විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් පෙර කරන ලද ප්‍රකාශ සහ දිවුරුම් ප්‍රකාශ ඇතුලත් අවස්ථා 6 කදී සඳහන් නොකිරීම ඌනතාවයක් වශයෙන් පෙන්වා දී ඇත. එනම් එමිල් රංජන් විසින් කොණ්ඩ අමිලව රැගෙන යාම පලමු වතාවට මෙම සාක්ෂිකරු හෙලිදරව් කර ඇත්තේ මෙම අධිකරණයේ සාක්ෂි දීමේදීය. මේ අකාරයටම කරුණු ගණනාවක් සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂියේ ඌනතා විශාල ප්‍රමාණයක් මතුකර ඇත.

**<u>පැ.සා.09 සමයක්කාරගේ මාලනී</u>**

මෙම සාක්ෂිකාරිය නිමර්ල අතපත්තු නැමැති මරණකරුගේ මව වේ. තම පුතා 2012.11.10 වැනිදා උදේ මියගිය බවත්, වැලිකඩ බන්ධනාගාරයේදී එය සිදු වූ බවත් සාක්ෂිකාරිය ප්‍රකාශ කර ඇත. ඔහු 2011 වසරේ සී.අයි.ඩිය මගින් අත්අඩංගුවට ගෙන මෙසේ රඳවා සිටි බවත් පුතා රැගෙන යාමට පැමිණි පිරිස සිවිල් ඇඳුමෙන් සිටි

අතර ඔවුන් සී.අයි.ඩී එකේ යනුවෙන් ප්‍රකාශ කල බව සාක්ෂිකාරිය සඳහන් කර ඇත. ඉන් පසුව තම පුතාගේ අත් පා බැද පොල්ලකින් පහරදී පසුදින අළුයම 2.00ට පමණ මෙසේ රැගෙන ගිය බවත් එම පිරිස පුතාට පහර දුන් බවත් සාක්ෂිකාරිය ප්‍රකාශ කර ඇත. එසේ නොකරන ලෙස ඇය ආයාචනා කර ඇත. එතැන සිට එක් අයෙක් පුතාගේ කම්මුලට පහර දුන් බවත් එසේ පහර දුන් පුද්ගලයා 1 වන විත්තිකරු බවටත් සාක්ෂිකාරිය හඳුනා ගෙන ඇත.

**<u>පැ.සා. 11 ජයන්ත ආරච්චිගේ මලරීන්</u>**

මෙම තැනැත්තිය මියගිය සමීර පෙරේරා නොහොත් කොණ්ඩ අමිල යන අයගේ මව වේ. තම පුතා 2012.11.10 දින මියගිය බවත් ඒ වන විට ඔහු වැලිකඩ බන්ධනාගරයේ රඳවා සිටි බවත් සාක්ෂිකාරිය ප්‍රකාශ කර ඇත. ඔහු හෙරොයින් නඩුවකට හසුවී මැගසින් බන්ධනාගරයේ සිට බන්ධනාගරය තුල දුරකථනයක් තිබීම හේතුවෙන් වැලිකඩ බන්ධනාගාරයට මාරුකල තැනැත්තෙකි. තම පුතා නිතර බැලීමට යන බවත් 2012.11.09 වන දින දහවල් බන්ධනාගාරයට ගිය නමුත් එදින තිබූ වාතවරනය හේතුවෙන් පුතා බැලීමට අවස්ථාවක් සාක්ෂිකාරියට ලැබී නැත. පසුව නිවසට ගොස් සිටියදී සවස් කාලයේ තුලින් බන්ධනාගාරයේ යම් සිද්ධියක් සිදු වනු සාක්ෂිකාරිය රූපවාහිණියෙන් දැක ඇත. එදින රාත්‍රියේ 9.00 ත් පසු දින අළුයම 1.00 ත් අතර තම පුතා වන අමිල අවස්ථා කිහිපයක තමාට දුරකථනයෙන් කතා කර බන්ධනාගාරය තුල යම් සිදුවීමක් සිදු වන බව සාක්ෂිකාරියට දන්වා ඇත. ඒ අවස්ථාවේ ඔහු වාට්ටුව තුල උඩ තට්ටුවක සිටින බව ප්‍රකාශ කර ඇත.

බන්ධනාගාරය තුල සිටිනා කාලයේදී එමිල් රංජන් නැමැති නිලධාරියාගෙන් යම් කරදර සිදුවන බවත් ඊට අදාලව පැමිණිල්ලක් කරන ලෙස අමිල මෙම සාක්ෂිකරුගෙන් ඉල්ලා ඇත. ඒ අනුව මෙම සාක්ෂිකරු බොරැල්ල පොලිසියට මෙන්ම මානව හිමිකම් කොමිෂමට පැමිණිලි කර ඇත. එම පැමිණිලි ඉදිරිපත් කිරීමේදි තම පුතා සමග යම් සම්බන්ධයක් තිබූ ටානියා දිලානි යන අයගේ සහාය ලබාගෙන ඇය මගින් එම පැමිණිලි ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එසේ වෙන අයෙක් භාවිතා කලේ මෙම සාක්ෂිකාරයට එතරම් ලිවීමට හෝ කියවීමට හැකියාවක් නොතිබීම සහ ටානියාට එම හැකියාව තිබීම හේතුවෙන් බව ප්‍රකාශ කර ඇත. මානව හිමිකම් පැමිණිල්ල පුතා මියයැමට පෙර යම් පරීක්ෂණයක් කල අතර මෙම සිද්ධියෙන් පසුවද එක් වතාවක් එම පරීක්ෂණය පවත්වා ඇත. පුතාගේ මරණින් පසුව

එම පරීක්ෂණය අවසන් වී ඇත. බොරැල්ල පොලිසියට කරන ලද පැමිණිල්ලද විමශර්නය යම් ආකාරයකට සිදු වුන බවක් ඇය දැනගෙන ඇත. මෙම ටානියා නැමැත්තිය දවසක් දෙකක් තම නිවසේ නතර වී ඇති නමුත් නිවසේ ස්ථිරව පදිංචි තැනැත්තියක් නොවන බව පිලිගෙන ඇත. සිද්ධිය වුන 10 වැනිදා අළුයම දුරකථනයෙන් ඇමතුම ලැබෙන විට ටානියා යන අයද තම නිවසේ සිටි බව ප්‍රකාශ කර ඇත.

එසේම හරස් ප්‍රශ්න වලදී දිනපතා දවල්ට සහ රෑට කෑම රැගෙන යන බව පිලිගෙන ඇත. විත්තියෙන් ප්‍රශ්න කර ඇත්තේ බන්ධනාගර නිලධාරින් එකතු වෙලා කෑම බීම දියර ගෙන්වා ගන්නේද යන්නයි. ඒ සම්බන්ධයෙන් දැනුමක් නොමැති බව ඇය ප්‍රකාශ කර ඇත. හරස් ප්‍රශ්න අතරතුරදී ඇය විසින් නම්බුවසම් කොමිටියට මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කල දෙය එනම්, අපි හිතනවට වඩා හොදින් සැප සම්පත් ඇතිව සල්ලි තිබෙන මිනිස්සු එලියට වඩා හොදට ජීවත් වෙනවා. ''සමහර ඉරිදා දිනවල ෆයිඩ් රයිස්, කොත්තු රොටී එහෙම බන්ධනාගාර මහත්වරුන්ට කියලා පුතාලා ගෙන්වා ගන්නවා'' යනුවෙන් සඳහන් වී ඇති බවද අවධානයට ලක්කල අවස්ථාවේ එවැනි අයෙක් පුතා සල්ලි දීලා කර ගන්නා බවත් ෆෝන් වලින් හොදට කතා කරන එක ඇත්ත බව පිලිගෙන ඇත. එසේම සෑම දිනකම එම දුරකථනයෙන් කතා කරන බව ද පිලිගෙන ඇත. තවද තම පුතා 2009 වසරේ රංගජීව මහතා විසින් රැගෙන ගිය බවත් මුලින් වෙලේ සුදා නැමැති අය ආශ්‍රය කල නමුත් පසුව එම සම්බන්ධය නොතිබූ බව ප්‍රකාශ කරයි. විත්තියෙන් යෝජනා කර ඇත්තේ පුතා කරපු අනීතික සහ නීති විරෝධි ක්‍රියා එමිල් රංජන් විසින් නවත්තපු හින්දා මෙසේ බොරු පැමිණිල්ල සිදු කල බවය. එය ප්‍රතික්ෂේප කරමින් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ ඔහු මරණ තජර්න කරන බවත් විවිද දේ කියන බවය. මරණ තජර්නය කල බවට කියන්නේ බොරු බවත් මානව හිමිකම් කොමිෂමට කරපු පැමිණිල්ලේ මරණ තජර්නයක් සම්බන්ධයෙන් සඳහන් නොවන බවට සඳහන් කර ඇත. අවසානයේ තම මියගිය පුතා කුඩු බිස්නස් කල බව පිලිගෙන ඇත.

මෙම සාක්ෂිකාරියට යෝජනා කරනු ලැබුවේ මානව හිමිකම් එකට කරන ලද පැමිණිල්ලේ 2 වැනි විත්තිකරුගේ නම සඳහන් කර නැති බවය. පැ. 78 ලෙස ලකුණු කර ඇති අදාල පැමිණිල්ල පරීක්ෂා කිරීමේදී 6 වැනි ඡේදය යටතේ වගකිය යුතු අයගේ නම් යටතේ බන්ධනාගාර අධිකාරී සඳහන් කර ඇත. ඔහු නව මැගසින් බන්ධනාගාරයේ අධිකාරීතුමා බවද එහි සඳහන් වේ. ඒ අනුව එවකට නව මැගසින්

බන්ධනාගාර අධිකාරිවරයාව කටයුතු කර ඇත්තේ 2 වැනි විත්තිකරු වේ. ප්‍රකාශි.ව නම සඳහන් කර නැතත් පැහැදිලිව 2 වැනි විත්තිකරු සම්බන්ධයෙන් මෙම පැමිණිල්ල කර ඇති බව ගම්‍ය වේ. ඍජුව මණර් තජර්නයක් ගැන සඳහන් කර නැතත් විවිධ අකටයුතු අසත්‍ය චෝදනා ඉදිරිපත් කිරීම වශයෙන් කාරණ ගණනාවක් හෙලිදරව් කර ඇත. ඊට අනුරූපිව බොරැල්ල පොලිසියට සනිදු කරන ලද පැමිණිල්ලේ පැහැදිලිව මරණ තජර්නයක් සම්බන්ධයෙන් සඳහන් වන අතර එය සිදු කල අය 2 වැනි විත්තිකරු බව එහි සඳහන් වේ. ඒ අනුව මානව හිමිකම් එකට කල පැමිණිල්ලේ මෙම මරණ තජර්නය ඍජුව සඳහන් කර නොමැති නමුත් ඒත් සමග එකටම බොරැල්ල පොලිසියට සිදුකල පැමිණිල්ල අදාල මරණ තජර්නය සම්බන්ධයෙන් සිදු කර තිබීම හේතුවෙන් මෙම සාක්ෂකරුගේ සාක්ෂියෙහි කිසිදු ඌනතාවවයක් හෝ ඒකාකාරීභාවයකින් තොරවීමක් ඒ තුලින් හට ගන්නේ නැත. ඒ හැර මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය තුලදී කිසිදු සැලකිය යුතු පරස්පරයක් හො ඌනතාවයක් මතු වී නැත. ඇයගේ සාක්ෂිය හෙලිදරව් වන ප්‍රදාන කරුණක් වන්නේ 9 වැනිදා රාත්‍රී 9.00. පසුදින අළුයම 1.00ත් අතර ඇමතුම් ලබාගත්ත යන කරන වේ. එය හරස්ප්‍රශ්ල වලදී හබ කරද නැත. එම කරුණ සම්බන්ධයෙන් කිසිදු පරස්පරතාවයක් හෝ ඌනතාවයක් මතුකර නැත. හරස් ප්‍රශ්නවලදී මෙම කොණ්ඩ අමිල නැමැති අය දුරකථනයක් බන්ධනාගාරය තුලදී භාවිතා කල බවට සාක්ෂි හෙලිදරව් වී ඇති අතර විත්තියෙන්ද ප්‍රශ්න කර ඇත්තේ මීට අමතරව විවධ පහසුකම් ආහාර ලබා ගැනීම් කොණ්ඩ අමිල මුදල් ගෙවා ලබා ගෙන ඇති බවය. ඒ අනුව මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය පිලිගත හැකි සත්‍ය සාක්ෂියක් බව තීරණය කරනු ලැබේ.

**<u>පැ.සා. 100. ටානියා දූලාරි ජයවීර.</u>**

**සමීර පෙරේරා නොහොත් කොණ්ඩ අමිල මෙම සාක්ෂිකාරියගේ ස්වාමි පුරුෂයාගේ මිතුරෙකු වන බවත් මීට අමතරව කොණ්ඩ අමිල සමග යම් වැඩකටයුතු කිරීමක්ද මෙම තැනැත්තිය සිදු කර ඇත. එසේම කොණ්ඩ අමිල සමග යම් අනියම් සම්බන්ධයක් තිබුන බව හෙලිදරව් වී ඇත. එම සම්බන්ධතාවය හේතුකොට ගෙන අමිල බන්ධනාගාර ගත වීමෙන් අනතුරුව ඔහු බැලීමටත් දවසට 2 වරක් පමණ ආහාර රැගෙන යාමත් සිදු කර ඇත. මෙසේ මැගසින් බන්ධනාගාරයේ අමිල සිට ඇති අතර ඒ වකවානුවේ මේ ආකාරයට ආහාර රැගෙන යාම සිදු කර ඇති අතර පසුව බන්ධනාගාරය තුල යම් සිද්ධියක් හේතුවෙන් පරීක්ෂන මණ්ඩලයක තීරණය අනුව**

වැරදිකරු වී වැලිකඩ බන්දනාගාරයට මැරුකර ඇති අතර එසේ මාරු කර දින 2 කට පමණ පසුව 2012 නොවැම්බර් මස 11 වන දින බන්ධනාගාර කැරුල්ල වූ දින මියගොස් ඇත. ඇගේ සාක්ෂියෙන් ඉහත කරුණු හෙළිදරව් වන අතර මෙම සිදුවීම වූ දින මෙම සාකෂිකාරිය අමිලගේ මව වන මලරීනි නැමැත්තියගේ නිවසේ සිට ඇත. එසේ සිටියදී ඔහු මියගිය බව ආරංචි වුන දින උදෑසන උදේ 6 වත් 6.10 වත් අමිලගේ දුරකථනය සමග සම්බන්ද වීඇමතුම් ගෙන ඇත. එසේ වුවද 6.20 පමණ වන විට දුරකථනය නිවා තිබූ අතර 6.30ට පමණ අමිලට පහරදීමක් සිදුවන බවට ඇමතුමක් අමිලගේ අයියාට ලැබී ඇත.

ඊට අමතරව මෙම සාක්සිකාරියක් හෙළිදරව් වන කරුණක් වන්නේ අමිලට බන්ධනාගාරය තුලදී යම් ආකාරයක තජර්න සහ අකටයුතු බන්ධනාගාර අධිකාරීගෙන් සිදු වෙන බව ඇයට දැන්වීමෙන් අනතුරුව අමිලගේ ඉල්ලීම අනුව ඒ සම්බන්ධයෙන් මානම හිමිකම් එකට සහ බොරැල්ල පොලිසියට පැමිණිලි කර ඇත. මානව හිමිකම් පැමිනිල්ල පැ 78 ලෙසත්, බොරැල්ල පොලිසියට සිදු කරන ලද පැමිනිල්ලට අදාලව නඩු කටයුත්තේ සම්පූණර් පිටපතක් ඊට පෙර සාකෂිකරු මගින් පැ 76 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම සාක්ෂිකාරියට අදාල කරදර කරන ලද අධිකාරීවරයා හමුවූ බවත් එසේ හමුවූයේ කෑම රැගෙන යාමට අවසරයක් ලබා ගැනීමටය. එසේ ගිය අවස්ථාවේ මෙම අමිල යන අය දගලනවා වැඩි බවත් පාඩුවේ සිටීමට උපදෙස් ලෙස ලෙස දැනුම් දී ඇත. ඒ අනුව අමිලට තජර්නය කලා යැයි සඳහන් පුද්ගලයා මෙම අධිකරණයේ සිටින 2 වැනි විත්තිකරු බවට හඳුනා ගෙන ඇත.

1 සහ 3 විත්තිකරුවන් වෙන්වෙන්ව හරස් ප්‍රශ්න කර නැත. 2 වැනි විත්තිකරුවෙන් හරස් ප්‍රශ්න අතරතුරදී අමිල විසින් ගණන් හිලව් ලියන ලද පොත් පත් කිහිපයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කර ඇත. කළුබෝවිල අමිලගේ අම්මාගේ ගෙදර ජීවත් වූ බවක් ඇය සඳහන් කර ඇත. රැදෙවියකුට දිනකට එක් වරක් පමණක් බලන්න දෙන නමුත් ඇය දෙපාරක් අධිකාරීවරයාගේ නියෝගයක් මත ගිය අතර එම පහසුකම පසුව නැවතූ බවත් පැමිණිලි කිරීමට හේතුවූ එක් කරුණක් එය බවද පිලිගෙන ඇත.

මෙම සාක්ෂිකාරියගේ සාක්ෂි අතරතුරදි කිසිදු සැලකිය යුතු පරස්පරතාවයක් හෝ ඌණතාවයකත් මතු වී නැත හරස් ප්‍රශ්න වලදීද ඇයගේ සාක්ෂියෙන් හෙළිදරව් වූ ප්‍රධාන කරුණු එනම්, 2 වැනි විත්තිකරුට එරෙහිව පැමිණිලි කිරීම 2 වැනි විත්තිකරු

විසින් යම් ආකාරයක තජර්න කිරීම මෙන්ම මෙම සාක්ෂිකාරියට ප්‍රකාශ කර කරුණක් වන දගලනවා වැඩියි යන කරුණ හෝ 2 වැනි විත්තිකරුව මෙම සාක්ෂිකාරියව මුණගැසීම යන කරුණු කිසිවක් හබ කර නැත. මරණකරු මියගියා යැයි සඳහන් දින උදෑසන 6.00 ත් 6.10 ත් අතර දුරකථනයෙන් සම්බන්ධ වී ඇති බව තහවුරු වී ඇත. ඇය සාක්ෂිදුන් විලාශය කිසිදු ඌණතාවයයක් හෝ පරස්පරතාවක් නොමැතිව ඒකාකාරීව සාක්ෂි දීම යන කරුණු පොදුවේ සලකා බැලීමේදී ඇයගේ සාක්ෂිය පිලිගත හැකි සාක්ෂියක් බවද තීරණය කරනු ලැබේ.

<u>සාක්ෂි අංක 20. බන්ධනාගාර නියාමක නිමල් ශාන්ත</u>.

මෙම සාක්ෂිකරු 2012.11 මස වෙන කොට මැගසින් බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් වශයෙන් කටයුතු කර ඇත. ඒ වන විට මැගසින් බන්ධනාගාරයේ අධිකාරි වශයෙන් 2 වැනි විත්තිකරු එමිල් රංජන් කටයුතු කල බවත්, 2012.11.09 වන දින තමන් උදෑසන 7.00 ට සේවයට වාතර්ා කර සේවයේ යෙදී සිටියදී සවස 3.30 ට පමණ වැලිකඩ බන්ධනාගාරය තුල යම් කලහකාරී තත්වයක් ඇති බව දැනගෙන ඇත. සවස 6.00 වන විට එමිල් රංජන් මහතාගෙන් අවශ්‍ය වුවහොත් වැලිකඩ බන්ධනාගාරයට සහාය දීමට නිලධාරින් රැස් කරන ලෙස දැනුම් දී ඇත. වැලිකඩ බන්ධනාගාරය තුල කඳුළු ගැස් ගැසීමක් තිබුන බවක් බන්ධනාගාරය ඉදිරිපිට පොලිසිය, හමුදා භටයින් සිටීම නිරීක්ෂණය කර ඇත. මේ අවස්ථාව වන විට තම නිල නිවසේ 2 වැනි විත්තිකරු ඇතුළු අධිකාරීවරුන් කිහිප දෙනෙක් එක් රැස්ව සිටි බවද මීට අමතරව යුධ යමුදා නිලධාරීන් කිහිප දෙනෙක්ද සිට ඇත. මෙතැන සිටි අය නිල ඇඳුමෙන් මෙන්ම සිවිල් ඇඳුමෙන් සැරසී සිට ඇත. මෙතැන ත්‍රිවිධ හමුදාවේ මෙන්ම පොලිස් නිලධාරීන් සිටි බව ප්‍රකාශ කරයි. කොමසාරිස් ජනරාල් කොඩිප්පිලි මහතාවද අසල නිල නිවසක සිට මෙම ස්ථානයට රැගෙන ආ බවත් මෙසේ රාත්‍රී 10. 11.00 පමණ වන තෙක් මෙම නිවසේ සිට සාකච්ඡා කල බවත් සිට ඇත. වැලිකඩ බන්ධනාගාරය තුල සිටි කුඩා බණ්ඩා යන නිලධාරියා සමග දුරකථනයෙන් සම්බන්ධ වී ඇත. රාත්‍රී 12.30 ට පමණ පිරිස තම නිවසෙන් පිටව ගිය බවත් මෙම සාක්ෂිකරු

අළුයම 5.30 ත් 6.00 ත් අතර වැලිකඩ බන්ධනාගාරය තුලට ගොස් ඇත. එමිල් රංජන් මහතා රාත්‍රී 12.30 ට පමණ පිටව ගිය බවත් ප්‍රකාශ කරයි. තමා 6.00 ට පමණ වැලිකඩ තුලට ගිය අවස්ථාවේ 2 වැනි විත්තිකරු අධිකාරී කායර්ාලය ඉදිරිපිට සිටින එක නිරීක්ෂණය කර ඇත. එතැන තව අධිකාරිවරුන් කිහිපදෙනෙක් සිට ඇත. මේ වන විට තත්වය සමනය වී තිබූ අතර සිරකරුවන් ගණන් කිරීමට ඔහු සහාය වී ඇත. පරිශ්‍රය තුල කළු තුෂාර සහ කොණ්ඩ අමිල යන නම් වලින් හැදින්වූ සිරකරුවන් දෙදෙනා මියගොස් සිටින එක දැක ඇත. කළු තුෂාර නැමති රැදෙවියා 2011 මැගසින් බන්ධනාගාරය තුල වූ කෝලාහලයකට සම්බන්ධ අයෙකු බව පිළිගෙන ඇත. කොණ්ඩ අමිල යන අයද මැගසින් බන්ධානාගාර කරැල්ලට සම්බන්ධ අයෙකු බව පසුව ප්‍රකාශ කර ඇත. මීට අමතරව අමිල යන අය ජංගම දුරකථන ලග තබා ගැනීම හේතුවෙන් විශේෂයෙන් හඳුනා ගෙන ඇත. අමිල යන අය සම්බන්ධයෙන් කටයුතු කිරීම ගුණතුංග සහ එමිල් රංජන් මෙන්ම මෙම සාක්ෂිකරුද මැදිහත්ව සිදු කල බවත් රැදෙවියන් සහ 2 වැනි විත්තිකරු අතර මැගසින් බන්ධනාගාරයේ කැරැල්ල හේතුකොට ගෙන යම් විරසකයක් සහ ප්‍රශ්න තිබුන බව ප්‍රකාශ කර ඇත. 2 වැනි විත්තිකරු බන්ධනාගාරයේ පාලන කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා මාගර් ගැනීමේදී යම් අඩත්තේට්ටම් සිදු වී හැලහැප්පීම්ද සිදු වූ බව ප්‍රකාශ කර ඇත. කොණ්ඩ අමිල 2 වැනි විත්තිකරු ගෙනාපු වෙනස් කිරිම් හේතුවෙන් යම් තාඩන පීඩන වලට ලක්වූ අයෙකු බව ප්‍රකාශ කර ඇත.

2 වන විත්තිකරු වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න කර ඇත. එහිදි අමිල යන අය මැගසින් බන්ධනාගාර කැරැල්ලට අදාල නඩුවේ 5 වන විත්තිකරු බවට ප්‍රශ්න කර ඇත. මීට අමතරව 2 වැනි විත්තිකරු ගත් ක්‍රියාමාගර් බන්ධනාගාරය පාලනය කිරීමට ගත් ඒවා බවට යෝජනා කර ඇත.

<u>සිද්ධිමය සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල පිලිගත හැකි භාවය සලකා බැලීම</u>

මෙම නඩුවේදී චෝදනාවේ නම් සඳහන් මරණකරුවන්ගේ මරණ සම්බන්ධයෙන් සිද්ධිමය සාක්ෂිකරුවන් වශයෙන් පැ. සා 2 කුඩා බණ්ඩා. පැ.සා. 3 ලියනාරච්චි, පැ.සා. 4 ඉන්දික, පැ.සා 9 මාලන්, පැ.සා. 11 මලරීන් සහ පැ.සා. 100 ටානියා යන අයගේ සාක්ෂි ඉදිරිපත් කර ඇත. එම අයගෙන් පැ.සා 2,3,4 යන අය 9 වනදා සහ 10 වනදා වූ සිදුවීම සම්බන්ධයෙන් සෘජු සාක්ෂි දෙන ලද පුද්ගලයන් වේ. ඒ අනුව මුලින්ම එම තිදනොගේ සාක්ෂිවල පිලිගත හැකි හවය සලකා බලනු ලැබේ.

එම සාක්ෂිකරුවන් තිදෙනාම මුල් අවස්ථාවේ සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරිපත් වී හෙළිදරව් කිරීමක් කර නැත. එනම් විත්තිකරුවන් විසින් මියගිය අය සම්බන්ධයෙන් සිදුකල කී දේ 2015 වන තෙක් හෙළිදරව් කර නැත. මෙයට හේතු විශේෂයෙන්ම පැ.සා 2 ගේ සාක්ෂියෙන් හෙළිදරව් වී ඇත. එය මීට පෙර සලකා බලා ඇත. ඒ අනුව මෙම සාක්ෂිකරුවන් අතර සාක්ෂිවල පරස්පරතා ඇත්දැයි දැන් සලකා බලනු ලැබේ.

විත්තියේ දේශනය අතරතුරදී ඉතා දැඩි ලෙස ඉදිරිපත් කරන ලද තකර්යක් වූයේ පැ.සා. 2 කුඩා බණ්ඩා 1 වැනි විත්තිකරු වැලිකඩ බන්ධනාගාරය තුලට පැමිණීම නිරීක්ෂණය කලේ 2012.11.10 වනදා අළුයම 4.30 ට වන නමුත් පැ.සා. 3 ලියනාරච්චි යන සාක්ෂිකරු මෙන්ම පැ.සා. 4 ඉන්දික යන සාක්ෂිකරු රාත්‍රී 12.00 ත් 2.00 ත් අතර 1 වැනි විත්තිකරු දුටු බවට සාක්ෂි දී තිබීම වේ. ඒ අනුව පැ.සා. 2 ගේ සාක්ෂියට අනුව 1 වැනි විත්තිකරු අළුයම 4.30 ට ඇතුළු වූයේ නම් 1 වැනි විත්තිකරු රාත්‍රී 12.00 ත් 2.00 ත් අතර පැ.සා. 3 සහ පැසා. 4 දුටුවේ කෙසේ දැයි යන ගැටළුව මතුවන බවට සැල කරන ලදී. පැ.සා. 2 1 වැනි විත්තිකරු අළුයම 4.30ට වැලිකඩ බන්ධනාගරයේ ගේට්ටුවෙන් ඇතුළු වන එක දැක ඇත. ඒ අවස්ථාවේ 1 වැනි විත්තිකරු දිග කලිසමක් ඇද සිටි බව ඔහුගේ ස්ථාවරය වේ. ලියනාරච්චිගේ සාක්ෂියට අනුව 1 වැනි විත්තිකරු ඩේනිම් කලිසමක් සහ ටී ෂටර් එකක් ඇද සිටි ඇත. 1 වැනි විත්තිකරු ලියනාරච්චි දකින්නේ 12.15 ට පමණ වේ. එසේ නම් ලියනාරච්චි කියනා විදියට 1 වැනි විත්තිකරු රාත්‍රි 12.15 වන විට වැලිකඩ භූමිය තුලට පැමිණ සිට ඇත. එසේ නම් කුඩා බණ්ඩා නැමැති 2 වැනි සාක්ෂිකරු ඔහු 1 වැනි විත්තිකරුව නැවත වරක් 10 වැනිදා අළුයම 4. 30ට වැලිකඩ තුලට පැමිණීම නිරීක්ෂණය කල හැකි දෙය සලකා බැලිය යුතුවේ. ලියනාරච්චිගේ සාක්ෂියට අනුව 1 වැනි විත්තිකරු රාත්‍රි 12.00 ත් 1.30 අතර තව අය සමග පැමිණ රැගෙන යන සිරකරුවන් වන්නේ නිමර්ල අතපත්තු, ගුණ්ඩු සහ මාලසුසන්ත යන අය වේ.

එසේ වුවද කුඩා බණ්ඩා අළුයම 4.30 ට 1 වැනි විත්තිකරු විසින් රැගෙන යන ලද නිරීක්ෂණය කරන්නේ මාලන්, පොන්න කපිල, මංජුශ්‍රී සහ කළු තුෂාර යන අය වේ. ඒ අනුව මෙම සාක්ෂිකරුවන් දෙදෙනා නිරීන්ෂණය කර ඇත්තේ අවස්ථා දෙකක වූ සිදුවීම් දෙකකි. එම සාක්ෂිකරුවන් දෙදෙනා මෙම නිරීක්ෂණයක් සිදු කර ඇත්තේ වෙන් වෙන්ව වේ. කිසියම් අවස්ථාවක පැ.සා. 2 සහ පැ.සා. 3 එක විට එකට සිටිමින් තම තමන් නිරීක්ෂණය කල බව ප්‍රකාශ කරන්නේ නැති අතර පැහැදිලිව

කිසිදු සැකයකින් තොරව අවස්ථා 2 ක මෙම නිරීක්ෂණයන් වෙන් වෙන්ව සිදු කර ඇත. එම සාක්ෂිය එකට සලකා බැලීමේදී ඒකායන ලෙස ගම්‍ය වන කාරණාව සහ එළඹිය හැකි ප්‍රබල අනුමියක් වන්නේ 1 වැනි විත්තිකරු අළුයම 12.15 ට වැලිකඩ භූමියේ සිට ඇති නමුත් ඉන්පසුව පිටතට ගොස් නැවත අළුයම 4.30 ට පැමිණ ඇති බවය. ඒ අනුව මෙම සාක්ෂිකරුවන් දෙදෙනාට සාක්ෂියේ පරස්පරයක් හෝ නොගැලපීමක් මතු වන්නේ නැත.

එසේ වුවද සාක්ෂි අංක 4 ඉන්දික සහ පැ.සා. 2 කුඩා බණ්ඩා යන දෙදෙනාගේම සාක්ෂියෙන් පොන්න කපිල නැමැති මරණකරු පැහැරගෙන යාම සම්බන්ධයෙන් සාක්ෂි දී ඇත. ඉන්දිකගේ සාක්ෂියට අනුව 1 වැනි විත්තිකරු පැමිණ ඔහුගේ සහෝදරයා මෙම කපිල රුගෙන යාම ඔහු දැක ඇත. හමුදාවෙන් පැමිණ 10 වැනිදා අළුයම 2.00ට පමණ වාට්ටුව තුල සිටි අය එලියට ගෙන දණ ගැස්සවූ බවත් එසේ සිටිනා විට ටික වේලාවකට පසුව 1 වැනි විත්තිකරු එතැනට පැමිණි බව ඔහුගේ සාක්ෂිය වේ. කපිල යන අයව 1 වැනි විත්තිකරු විසින් රගෙන යන විට අළුයම 3.00ට විතර ඇති බව ඔහුගේ සාක්ෂිය වේ. සිරකරුවන් වාට්ටුවෙන් එලියට ගැනීම පොන්න කපිල නැමැති අයව 1 වැනි විත්තිකරු විසින් හඳුනා ගෙන ඔහුව රැගෙන යාම යන කාරණා මෙම සාක්ෂිකරුවන් දෙදෙනාගේම ගැලපීමකින් යුතුව ඉදිරිපත් වී ඇත. නොගැලපීමක් ලෙස මතු වන්නේ රුගෙන ගිය වේලාව එනම් අළුයම 3.00 සම 4. 30 යන වේලාවන් දෙක වේ. ඒ අනුව පැය 1 හමාරක වේලාවේ වෙනසක් දෙදෙනාගේ සාක්ෂියෙන් මතු වී ඇත. මෙම සාක්ෂිකරුවන් සාක්ෂි දෙනු ලැබූ සිද්ධිය සලකා බැලීමේදී පැය 18, 24 ක් පමණ කාලයකට දිව යන බරපතල සිද්ධි මාලාවක් සම්බන්ධයෙන් සාක්ෂි දී ඇත. කලහකාරී ගැටුම්කාරී සිද්ධීන් තුල මෙම දෙදෙනාම සිටිමින් ඔවුන් නිරීක්ෂණය කල දේ සම්බන්ධයෙන් මෙසේ වසර 09 කට පමණ පසුව සාක්ෂි දී ඇත. මෙම අය සාක්ෂි දෙනු ලැබුවේ මතකයෙන් වේ. එවනි පසුබිමකදී සිද්ධිය වෙන අවස්ථාවේදී ඔරලෝසුවකින් වේලාව බලා වේලාව දැනගෙන සාක්ෂි දීමක් සිදු කර නැති අතර ඒ අවස්ථාවේ ඔවුන්ගේ මනස පැවති වේලාව සම්බන්ධයෙන් වූ අවබෝධය සහ අදහස මත මෙම වේලාවන් සම්බන්ධයෙන් සාක්ෂි දී ඇත. එවැනි පසුබිමකදී අළුයම 3.00ත් 4.30 යන කාලපරාසය තුල මෙම සාක්ෂිකරුවන් සිදුවීම දුටු වේලාව මෙසේ නිශ්චය කොට සාක්ෂි දීමෙදි මේ ආකාරයේ වෙනසක් ඇති වීම අසාමාන්‍ය නොවේ. ප්‍රායෝගිකව මෙවැනි සිද්ධියට මුහුණ දෙමින් සිදුවීම් වූ වෙලාව සඳහන් කිරීමේදී මෙවැනි

වෙනසක් සිදුවීම අසත්‍ය ප්‍රකාශ කිරීමක් හේතුවෙන් නොව ඉහත සඳහන් කල ආකාරයේ ඒ ඒ පුද්ගලයාගේ මනසේ අනුමාන වශයෙන් වේලාව තිරණය කර ප්‍රකාශ කිරීම මත සිදුවූවක් බව ප්‍රබල ලෙස ගම්‍ය වන කරුණක් වේ. තාකරීකව සහ ප්‍රායෝගිකව සලකා බැලීමේදී ඔරලෝසුවකින් වේලාවක් බැලුවේ නම් මිස එකම වේලාව සඳහන් කිරීම සාක්ෂිකරුවන් දෙදෙනෙකුගෙන් මෙවන් වාතාරවරණයක බලාපොරොතතු විය නොහැක. විශේෂයෙන්ම සුළු වෙලාවක් තුලදී සිදුවූ එක් සිද්ධියක් සම්බන්ධයෙන් සාක්ෂි දුන්නේ නම් යම් හෙයකින් මීට වඩා ස්ථිර ලෙස වේලාව සිද්ධිය සම්බන්ධයෙන් විස්තර සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ ඒකාකාරීව බලාපොරෙත්තු විය හැකි නමුත් පැය 18 ක එහා ගිය ඉතා සංකීරණ සිද්ධි මාලාවක් තුල එම සිද්ධීන්ට මුහුණ දෙමින් සාක්ෂිකරුවන් සාක්ෂි දීමේදී මෙවන් වෙනස්කම් ඇතිවීම අසාමාන්‍ය නොවේ.

තවද මෙම නඩුවේදී 1 වැනි විත්තිකරු ඇද සිටි ඇඳුම සම්බන්ධනේ මෙම සාක්ෂිකරුවන් අතර යම් නොගැලපීමක් ඇති බව නිරීක්ෂණය විය. එනම් ඉන්දික නැමැති සාක්ෂිකරුට අනුව 1 වැනි විත්තිකරු කළු කොට කලිසමක් ඇද සිට ඇත. කුඩා බණ්ඩා සහ ලියනාරච්චි ගේ සාක්ෂියට අනුව දිග කලිසමක්මක් ඇද සිටි ඇත. මෙතැන පැහැදිලිව බැලූ බැල්මට ඇද සිටි ඇඳුම සම්බන්ධයෙන් පරස්පරයක් මතු වි ඇත. මෙම කරුණද සලකා බැලීමේදී මීට පෙර විශ්ලේෂණය කල ආකාරයටම මෙම සිද්ධි නිරීක්ෂණය කිරීම අහබු එක සිද්ධියක් නොව දීඝර් කාල පරාසයක් තුල සිදුවීම් මාලාවක් බව සැලකිල්ලට ගත යුත වේ. මෙදින 1 වැනි විත්තිකරු ලෙස සාක්ෂිකරුවන් සඳහන් කල පුද්ගලයා සහ තවත් දෙදෙනකු සිවිල් ඇඳුමෙන් සිටි ඇති බවට පොදුවේ සාක්ෂි සලකා බැලීමේදී හෙලිදරව් වේ. එවන් අවස්ථාවකදී දීඝර් කාලයකට පසුව සාක්ෂි දීම හේතුවෙන් එක් එක් පුද්ගලයාගේ මතක ශක්තිය, ධාරන ශක්තියන් හි ඇති වෙනස්කම් සලකා බැලීමේදී මෙම පරස්පරතාවය හිතාමතා අසත්‍යයක් ප්‍රකාශ කිරීමෙ හේතුවෙන් නොව මතකයේ දුවර්ලතාවන් සහ මෙම සිද්ධිය අදාල පරිවේශයන් හේතුවෙන් සිදු වූවක් බවට ප්‍රබල ලෙස ගම්‍ය වන කරුණක් වේ. ඒ අනුව මෙම පරස්පරතාවය සාකෂිකරුවන්ගේ සාක්ෂි සලකා බැලීමේදි හරයට කිදා බසින කරුණක් නොවන බවට ඉහත හේතු මත තීරණය කරණු ලැබේ.

මෙම නඩුවේ පැමිණිල්ල විසින් කැදවන ලද සාක්ෂි අංක **පැ.සා. 1 නන්දිමාල් සිල්වා** යන අයගේ සාක්ෂියේදී පිලිගත හැකි භාවය දැන් ද සලකා බලනු ලැබේ. මෙ සාක්ෂිකරු සිද්ධිය වූ අවස්ථාවේ බන්ධනාගාරය අසල සිටි අයෙකු වන

අතර ඔහු බන්ධනාගාරය තුලදී ම මෙන්ම නිදහස් වීමෙන් අනතුරුවද හිරකරු අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාකාරීව කටයුතු කල අයෙකු වේ. ඔහු සාක්ෂි දිමේදී සාක්ෂි දිමේ විලාසයත් ඔහු දිගින් දිගටම සිරකරු අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත් වීම, විවිධ ආයතන වලට පැමිණිලි, නඩු කටයුතු ගොනු කරමින් ඉතා සංවේදිව ක්‍රියා කරන දැඩි මතදාරියෙක් බව ප්‍රබල ලෙස ගම්‍ය වන කරුණු ඔහුගේ සාක්ෂිය තුලින් හෙලිදරව් වී ඇත. ඔහු මෙම පැ. 18 ට එහා ගිය සිද්ධි මාලාවේ මෙම චෝදනාවන්ට අදාල අයගේ මරණ සම්බන්ධයෙන් එනම් පැහැරගෙන යාම්, සහ අනුසාංගික සිද්ධින් විස්තරාත්මකව දුටු බවත් ඒවා විස්තරාත්මකව විස්තර කර ඇත. මෙම අය අවම වශයෙන් මෙම සිද්ධියට අදාලව සාක්ෂි දීමට පෙර අවස්ථා 6 කදී පොලිසිවලට,කොමිටිවලට මානව හිමිකම් කොමිසමට මෙන්ම අභියාචනාධිකරණයට දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. මෙම කිසිදු ස්ථානයක ඔහු 2 වැනි විත්තිකරු කොණ්ඩ අමිල නැමැති අය රැගෙන යන විට පස්සෙන් ගිය බව සඳහන් කර නැත. එසේ වුවද එසේම 2013. පොලිස් ප්‍රකාශයේ කළු තුෂාර රැගෙන යන අවස්ථාවේ 2 වැනි වත්තිකරු එතැන සිටි බව සඳහන් කර නැත. මේ ආකාරයට මෙම සාක්ෂිකරු ඔහු ඇත්ත වශයෙන්ම දුටු දේවල් ප්‍රකාශ කරන අතර ඔහු යම් කාරණා සම්බන්ධයෙන් ඔහු දුටු දෙය අතිශයෝක්තියකින් වැඩි කර ප්‍රකාශ කිරීමේ ස්වභාවයක් සාක්ෂි දෙන අවස්ථාවේදීම අප නිරීක්ෂණය කරන ලද. එපමණක්ද නොව දීඝර් කාලයකට පසුව සාක්ෂි දෙන විට ඔහු සෘජුව දුටු දේවල් මෙන්ම යම් අයකුගෙන් දැනගත් දේ ඔහු දුටු කරුණු සේ විස්තර කර සාක්ෂිදෙන ස්වභායවක් ඔහුගේ තිබෙන බව අප නිරීක්ෂණය කරන ලදී. ඔහු සම්පූණර්යෙන් අසත්‍ය ප්‍රකාශ කරන අයෙකු ලෙස සැලකීමට නොහැකි වුවත් ඔහු අතිශයොක්තියක් සාක්ෂි දීම යන කරුණ සමග ඔහු වෙන අයගෙන් දැනගත් කොටස් තමා දුටු දේට ඈදා සාක්ෂිදෙන ස්වභාවය සලකා බැලීමේදි ඔහුගේ සාක්ෂිය මත විශ්වාසය තැබීම දැඩි අනාරක්ෂිත, අනුවණකාරී බව මෙම අධිකරණයේ මතය වේ.

මෙම සාක්ෂිකරු චෝදනාවන්හි නම සඳහන් මරණයට පත් වූවන් අතර සෘජු පුද්ගලික සම්බන්ධතාව නොමැති වේ වුවද පෙර දී ආකාරයේ මෙම සාක්ෂිකරුගේ හිරකරුවන් සම්බන්ධයෙන් වන ක්‍රියාකාරී කතර්ව්‍ය හේතු කොට ගෙන මෙසේ අතිශයෝක්තියෙන් සාක්ෂිදෙන අයෙකු බව තරණය කරනු ලබන අතර ඒ අනුව ඔහුගේ සාක්ෂිය කිසිදු ආකාරයක මෙම නඩුවේදි සලකා බලන්නේ නැති බව තිරණය කරනු ලැබේ.

පැමිණිල්ලෙන් කැඳවූ යම් සාක්ෂිකරුවෙකුගේ සාක්ෂිය කුමන හෝ හේතුවකට නොසලකා හැර හෝ විශ්වාස නොකර සිටින අවස්ථාවකදී වුවද එම සාක්ෂිකරුගේ එකී සාක්ෂිය හේතුකොට ගෙන පැමිණිල්ලේ අනෙක් සාක්ෂිකරුවන්ගේ සාක්ෂිය යම් බලපෑමක් හෝ විත්තියේ වාසියට යම් කරුණක් මතුවන්නේද යන්න අධිකරණයක් සලකා බැලිය යුතු වේ. ඒ අනුව මෙම පැ.සා. 1 නන්දිමාල්ගේ අතිශයෝක්තියෙන් හෝ දුබලතාවය යටත්ව එම ඉදිරිපත් කරන ලද සාක්ෂි අනෙක් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සමග යම් නොගැලපීමක් ඇතිද යන්න දැන් සලකා බලනු ලැබේ. ඔහුගේ සාක්ෂිය පොදුවේ සලකා බැලීමේදී 2012.11.09 වන දා සහ 10 වැනිදා දක්වා වන සිද්ධි මාලාව අනකෙුත් සාක්ෂිකරුවන්ගේ සිද්ධීන් සමග යම් ගැලපීමකින් යුතුව ඉදිරිපත් වී ඇත. නන්දිමාල්ගේ සාක්ෂියට අනුව කොණ්ඩ අමිල 10 වැනිදා උදෑසන 6.00ට පමණ රැගෙන යන අවස්ථාවේ 2 වැනි විත්තිකරු සහ හමුදා නිලධාරීන්ට අමතරව 1 වැනි විත්තිකරුද එතැන සිටි බව සඳහන් කර ඇත. එසේ වුවද පැ.සා. 2 කුඩා බංඩාගේ සාක්ෂියේදි කොණ්ඩ අමිල රැගෙන යාම 2 වැනි විත්තිකරු සහ හමුදා නිලධාරීන් විසින් සිදු කල බවට ප්‍රකාශ කරන නමුත් 1 වැනි විත්තිකරු ඊට සම්බන්ධ වීම හෙලිදරව් වන්නේ නැත. ඒ අනුව යම් නොගැලපීමක් මෙතැන මතුවී ඇත. එනම් 1 වැනි විත්තිකරු කොණ්ඩ අමිල රැගෙන යාමට සහභාගි වුයේද යන කරුණ සමබන්ධයෙන් වේ. මා පෙර සඳහන් කල ආකාරයට නන්දිමාන් නැමැති සාක්ෂිකරු යම් අතිශයෝක්තියක්ක් සාක්ෂි දීම හේතුවෙන් මෙම අමතර කරුණ සඳහන් කර ඇති බව පෙනී යයි. එසේ වුවද 2 වැනි විත්තිකරු කොණ්ඩ අමිල රැගෙන ගිය බව පැ.සා.2 කුඩා බණ්ඩාගේ කරුණු ඍජුව පරස්පරවීමක් සිදු වන්නේ නැත. එනම් නන්දිමාල්ගේ සාක්ෂියේදීද 2 වැනි විත්තිකරුද මෙම කටයුත්කතට සහභාගි වීම සඳහන් කර ඇත. ඒ අනුව නන්දිමාල්ගේ සාක්ෂියේ මෙම වෙනස හේතුවෙන් කුඩා බණ්ඩාගේ සාක්ෂියෙහි විශ්වසනීයත්වයට ඍජු බලපෑමක් ඉහත හේතු මත එල්ලවන්නේ නැති බව තීරණය කරනු ලැබේ. ඒ අනුව මෙම සිද්ධිමය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි පොදුවේ සලකා බැලීමේදී නන්දිමාල්ගේ සාක්ෂිය මගින් සැලකිය යුතු පරස්පරතාවයක් මතු වන්නේ නැති බව තීරණය කරනු ලබේ.

<u>කුඩා බණ්ඩාගේ සාක්ෂියේ පිලිගත හැකි භාවය සලකා බැලීම</u>

අප විසින් මුලින්ම මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ පිලිගත හැකි භාවය සලකා බැලිය යුතු වේ. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ මතුවූ ප්‍රධානතම කරුණක් වන්නේ

2012 වසරේ වූ මෙම සිදුවීම සිදුවූ වහාම සිද්ධියට අදාල සත්‍ය හෙළිදරවු නොකිරීම වේ. 2012.11.10 වනදා සිවිල් ඇඳුමෙන් සැරසුන නිලධාරියෙක්ට ප්‍රකාශයක් ඔහු ලබා දී ඇත. ඉන්අනතුරුව 2012 ත් 2015 ත් අතර බන්ධනාගාර අභ්‍යන්තර පරීක්ෂණ සහ අමාත්‍යංශය මගින් පවත්වන ලද පරීක්ෂණයකට ඉදිරිපත් වී ඇත. එම අවස්ථා තුනේහිදීම සත්‍ය සිදුවීම හෙළිදරව් වී නැති බව පිලිගෙන ඇත. 2015 න් පසුව ඔහු දුටු සියළු දේ හෙළිදරව් කිරීමට බලාපොරොත්තු වූ බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වේ. ඒ අනුව ඔහුගේ මුල් ප්‍රකාශ සහ පරීක්ෂණවලදී ඉදිරිපත් කර ඇති සාක්ෂියන්හි මෙම නඩුවේ චෝදනාවන්ට අදාල සිරකරුවන් 1 සහ 2 වැනි විත්තිකරුවන් රැගෙන යාම සහ ඔවුන් සම්බන්ධ කරුණු කාරණා සම්බන්ධයෙන් ඌනතා පෙර සඳහන් කර ඇති ආකාරයට මතු වී ඇත. මෙම සාක්ෂිකරු මේ ආකාරයට 1 සහ 2 වැනි විත්තිකරුවන්ගේ අදාල ක්‍රියාකාරකම් එනම්, චෝදනාවන්හි නම් සඳහන් මරණකරුවන්ගේ මරණය සම්බන්ධයෙන් හෙළිදරව් නොකිරිමට හේතු වූ කාරණා දැන් සලකා බැලිය යුතු වේ. සාමාන්‍යයෙන් මුල් අවස්ථාවේ අදාල කරුණු හෙළිදව් නොකිරීම හේතුවෙන් අප්‍රමාදී භාවය පරීක්ෂාවෙන් සාක්ෂිකරු අසමත් වීම සිදු වේ. එසේ වුවද මුල් අවස්ථාවේ හෙළිදරව් නොකිරීමට යම් සාධරණ හේතුවක් ඉදිරිපත් වේ නම් ප්‍රමාදයකින් පසුව හෙළිකරන සාක්ෂියක් සලකා බැලීමට හැකියාවක් ඇත.

කුඩා බණ්ඩා යන මෙම සාක්ෂිකරු ඉදිරිපත් කරන කරුණ වන්නේ මෙම සිදුවීමට සම්බන්ධ අය හෝ යම් ආකාරයකට බලධාරීන්ගේ මැදිහත් වීමක් තිබීම සහ තමාට ඇතිවූ තර්ජනයක් හේතුවෙන් සත්‍ය මුලින් හෙළිදරව් නොකල බවය. එනම් ඔහුගේ සාක්ෂිය අනුව 2012.11.10 වනදා උදෑසන 8.00 ට පමණ වැලිකඩ බන්ධනාගාරය ආසන්නයේ තම නිල නිවසට ගිය විට විනාඩි කිහිපයක් ඇතුලතදී ඔහුගේ නිවසේ දුරකථනයට යම් තර්ජනාත්මක ඇමතුමක් ලැබී ඇත. එම ඇමතුමට අනුව මෙම සිද්ධිය හෙළිදරව් කිරීම ඔහුට මෙන්ම පවුලේ අයට අනතුරුදායක විය හැකි බව සඳහන් වී ඇත. ඉන් පසුව නැවත බන්ධනාගාරය තුලට ඊට සුළු වේලාවකට පසුව ඔහු පැමිණ ඇති අතර එම දිනය තුලදී සිවිල් ඇඳුමෙන් සැරසුන නිලධාරීයෙක් විමශර්න කටයුත්තට පැමණ මෙම සාක්ෂිකරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට කටයුතු කර ඇත. එම ප්‍රකාශය ලබා ගැනීමට පැමිණි අය මෙම සාක්ෂිකරුට ප්‍රකාශ ඇත්තේ, "අපි ආණ්ඩුවේ පව් සෝදන්න ඇවිත් ඉන්නේ " යනුවෙනි. ඒ අනුව මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ උදෑසන දුරකථනයෙන් සිදුවූ තර්ජනයත් මෙම නිලධාරියා සඳහන් කල දෙයත් ඔහු සිද්ධිය පුරාවට නිරීක්ෂණය කර ලද දෙයින් ඒ

අවස්ථාවේදි සත්‍ය හෙලි කලහොත් තමාට හෝ තමාගේ පවුලේ අයට යම් හානියක් හෝ අනතුරක් සිදු වනු ඇතැයි යන බියට යන හේතුව මත සත්‍ය වසන් කල බවය. මෙම කාරණය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න අතරතුරේදී ඔහු ප්‍රකාශ කර ඇත්තේ එම අවස්ථාවේදී මෙම ප්‍රකාශය කලේ නම් අද ගරු අධිකරණයේ නොසිටින්නට තිබූ බවය. 2019.10.18( පස්වරු 2.40ට, පිටුව 2.) මෙම හේතුව ඇත්ත වශයෙන්ම පිළිගත හැකිය යන්න දැන් සලකා බලනු ලැබේ. මෙම නඩුවේදී සාක්ෂි මගින් හෙලිදරව් වී ඇත්තේ බන්ධනාගාර තුල සෝදිසි මෙහයුමක් එවකට බලධාරීන් සූදානම් කර තිබූ බවත් එම මෙහෙයුමේදී යම් කලබලකාරී තත්වයක් හට ගෙන ඇති බවත්ය. එහිදි 2 වැනි පියවරක් වශයෙන් යුධ හමුදාව කැඳවා ඇත.

යම් කලහකාරී තත්වයකින් අනතුරුව බන්ධනාගාරය තුල නැවත පාලනයට යටත් කොට තත්වය සමනය කර ගැනීමෙන් අනතුරුව කිසියම් පිරිසක් බන්ධනාගාරයට ඇතුළු වී තෝරාගත් රැඳෙවියන් කිහිපදෙනෙකු රැගෙන ගොස් ඇති අතර පසුව එම අය වෙඩි වැදී මියගොස් සිටි බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. එම සිද්ධිමය කරුණු පොදුවේ සලකා බැලීමේදී එම සිද්ධිමය කරුනු සහ මෙම සාක්ෂිකරුට ලැබුනා යැයි සඳහන් දූරකථන ඇමතුම සැලකිල්ලට ගන්නා විට එම යමෙකුට මෙම සිද්ධිය පිටුපස යම් බලධාරීන් සිටින බවට හැඟී යාම සාධාරන බව පෙනේ. මෙයට තවත් හේතුවක් වශයෙන් මතු වන්නේ මෙම සිදුවීම් අවසානයේ බන්ධනාගාරයේ ජොෂ්ඨ නිලධාරීන් කිහිපදෙනෙකු අවි ලබා ගැනීමත් එම අවි මියගිය අය අසල දමා තිබීම වේ. එමගින් බන්ධනාගාර නිලධාරීන්ද මීට සහාය දක්වන බවට යමෙකුට තේරුම් ගත හැක. ඒ අනුව එක් පසෙකින් යුධ හමදාවේ ක්‍රියාන්විතයට සම්බන්ධ මෙම සිදුවීම සිදුවී තිබීමත් එයට එතැන සිටි ආරක්ෂක අංශයේ අයගේ මෙන්ම බන්ධනාගාරයේ ඉහල නිලධාරීන්ගේ එකගත්වය හෝ සහයෝගය ලැබී තිබීම පෙනී යන ආකාරය කරුණු හමුවේ මෙම සාක්ෂිකරුට දූරකතනයෙන් සිදු වූ බවට සඳහන් තර්ජනයද සැලකිල්ලට ගැනීමේදී ඔහු දුටු දේ එ මුල් අවස්ථාවේ හෙලිදරව් නොකිරීමට සාධාරණ හේතුවක් ඉදිරිපත් කර ඇති බව සාධාරණ ලෙස පිළිගත හැකි කරුණක් බව මෙම අධිකරණයේ මතය වේ.

මෙසේ 2015 වන තෙක් සත්‍ය හෙලිදරව් නොකර හදිසියේම 2015 න් පසුව මෙම සාක්ෂිකරු ඔහු දන්නා දෙය හෙලිදරව කල බවත් ඊට හේතුව වශයෙන් ඔහු පහත සඳහන් හේතු ඉදිරිපත් කර ඇත. එනම්, 2015 දී එවකට පැවති රජයේ වෙනසක් සිදුවීමත් ඉන් අනතුරුව ඔහුට දූරකථනයෙන් යමෙකු අමතා එසේ ආණ්ඩුව වෙනස් වී

තිබෙන බවත් සිද්ධිය වූ දින ඔහු ප්‍රධාන ජේලර් බවද ඒ අනුව ඔහු දන්නා සත්‍ය හෙලිදරව් කරන ලෙසත් සත්‍ය ප්‍රකාශ නොකලොත් යම් කරදරයක් විය හැකි බවට යම් තජර්නාත්මක ඇමතුමක් ලැබුන බව සඳහන් කරයි. එය ලැබුනු පසුව ඔහු මේ සම්බන්ධයෙන් බන්ධනාගාරයේ ඉහල නිලධාරික් වන පල්ලේතැන්න මහතාටද එවකට ආරක්ෂක ලේකම්ටද දැනුම් දුන් බවත් එම අය සත්‍ය හෙලිදරව් කරන ලෙස උපදෙස් දුන් අතර ඔහුව එවකට අධිකරණ අමාත්‍යවරයා වූ විජේදාස රාජපක්ෂ අමාත්‍යවරයා වෙත පල්ලේතැන්න මහතා ඔහුව රැගෙන ගිය බව සඳහන් කරයි. එතැනදී සිද්ධිය සම්බන්ධයෙන් ඔහු දන්නා ලෙස හෙලිදරව් කරන ලෙස ඔහුට දැනුම් දී ඇත. ඒ අනුව කුඩා බණ්ඩා යන මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවටද සත්‍ය සිද්ධිය හෙලිදරව් කල බව ගෙන ඇති ස්ථාවරය වේ. මෙහිදී අප සුපක්ෂාකාරීව සැලකිල්ලට ගත යුත්තේ මුල් අවස්ථාවේදී සත්‍ය හෙලිනොකර පසුව මෙම සාක්ෂිකරු යම් දේශපාලන සම්බන්ධයක් ඇති ඇමතිවරයෙකුගේ වුවමනාවකට යම් කරුණු කාරණාවන් වෙනස් කර හෝ එක්කර හෙලිදරව්වක් කලේද නොඑසේනම් ඔහු කියනා ආකාරයට සත්‍ය හෙලිකලේද යන කරුණු දෙකෙන් කුමන කාරණාවක් විය හැකිද යන්නයි. ආණ්ඩු වෙනසක් සමග බලයට පැමිණි ප්‍රතිවාදී දේශපාලඥයෙකුට ඔහුගේ ප්‍රතිවාදී රජයේ හෝ එහි බලධාරීන්ට එරෙහිව කිසියම් හෝ ආකාරයකට අගතිදායි කරුණක් ඉදිරිපත් කිරීමේ බලවත් වුවමනාවක් තිබිය හැක. එවැන්නක් ගම්‍ය වන ආකාරයේ යම් කරුණක් හෝ ඇත්දැයි අප දැන් සලකා බලනු ලැබේ.

මෙම සාක්ෂිකරු විසින් පසුව මෙම හෙලිදරව්ව කිරීමට හේතු පාදක වූ කරුණු හා ඊට අදාලව ඔහුට කතා කල සහ මුණගැසුන අය සම්බන්ධයෙන් සම්පූණර් හෙලිදරව්වක් ඔහු විසින්ම ස්වෙච්ඡාවෙන් මෙම අධිකරණයේ සිදු කර ඇත.එය කිසිදු ආකාරයකට සැගවීමට උත්සාහ කරද නැත. බන්ධනාගාර ජොෂ්ඨ නිලධාරියෙකු විසින් අදාල ඇමතිවරයාට යොමු කිරීම එක හෙලා කිසිදු සැගවීමකින් තොරව හෙලිදරව් කර ඇත. යම් ආකාරයකට මෙම දේශපාලන චරිතය හෝ අන් අයෙකු සමග සාකච්ඡා කොට උපදෙස් මත අසත්‍යයක් නිබන්ධනය කොට ප්‍රකාශ කල අයෙකු සාමාන්‍ය කටයුතු අතරේ ඔහු එසේ මුණ ගැසුනු අය සමග කතා කල දෙය මේ ආකාරයට විවෘත ලෙස හෙලිදරව් කරනු ඇතැයි බලාපොරොත්තු විය නොහැක. එම කාරණාව සැගවීමට ක්‍රියාකිරීම සාමාන්‍යයෙන් සිදුවන දෙයකි. ඒ අනුව මෙමගින් ප්‍රබල ලෙස ගම්‍ය වන්නේ මෙම සාක්ෂිකරු ඇත්ත වශයෙන්ම සිදු වූ දෙය සහ ඔහු දුටු

දේවල් මෙසේ හෙළිදරව් කර ඇති බවය. ඒ අනුව මූලිකව මෙම සාක්ෂිකරු ප්‍රමාදයකින් පසුව වුවද සත්‍ය හෙළිදරව් කල බවත් එකී ප්‍රමාදයට දැක්වූ හේතුද පිලිගත හැකි බව මෙම අධිකරණයේ මතය සහ තීරණය වේ. මෙවන් අවස්ථාවකදී මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ පිලිගත හැකි භාවය සලකා බැලීමේදි අප්‍රමාදීභාවයේ පරීක්ෂාව හැර අන් පරීක්ෂාවන් සියල්ලම සැලකිල්ලට ගෙන සාක්ෂියෙහි පිලිගත හැකි භාවය දැන් සලකා බලනු ලැබේ.

මෙම සාක්ෂිකරු දින දෙකක් එනම්, 2012.11.09 වනදා දහවල් සිට 2012.11.10 වන දා අතර සිදුවීම් මාලාවක් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කර ඇත. මෙම නඩුවට අදාලව 8 දනෙකුගේ මරණ හෝ පැහැරගෙන යාම සම්බන්ධයෙන් ඔහු දුටු බවට සාක්ෂි ඉදිරිපත් කරයි. 1 වැනි සහ 2 විත්තිකරුවන් මෙම සියළු මරණ සඳහා සම්බන්ධ කිරීමට උත්සාහයක් ඔහු දරන්නේ නැත. 2 වැනි විත්තිකරු එක් පැහැරගෙන යාමක් සඳහා පමණක් සම්බන්ධ වූ බවටද 1 වැනි විත්තිකරු තිදෙනෙකුගේ රැගෙන යාමට සම්බන්ධ වූ බවටද මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇති අතර එක් මරණකරුවෙක් එනම් කළුතුෂාර රැගෙන යාමට 1,2 විත්තිකරුවන් සම්බන්ධ වූ බව සඳහන් කරන්නේ නැත. එමගින් ගම්‍ය වන කරුණක් වන්නේ සාමාන්‍යයෙන් කිසියම් හෝ ද්වේශ සහගත හේතුවක් මත ව්‍යාජ කතාවක් නිබන්ධනය කොට අසත්‍ය චෝදනාවක් කරන අයෙකු සාමාන්‍යයෙන් සියළු සිද්ධීන්ට අදාලව එම පුද්ගලයා සම්බන්ධ කිරීමට උත්සාහ දරන නමුත් මෙම අවස්ථාවේ බැලූ බැල්මටම පෙනී යන්නේ සහ ගම්‍ය වන්නේ මෙම සාක්ෂිකරු ඇත්ත වශයෙන්ම දුටු දේ ඒ ආකාරයෙන්ම හෙළිදරව් කරන බවය. අතිශයෝක්තියකින් අනිසි එක් කිරීමක් කරන ආකාරයක් ගම්‍ය වන්නේ නැත.

තවද මෙම සාක්ෂිකරු සාක්ෂි දෙන අතරතුරදී ඔහු සාක්ෂි දුන් විලාසය මෙන්ම විශේෂයෙන්ම මුල් අවස්ථාවේ ඔහු හෙළිදරව් නොකල කරුණු එසේ හෙළිදරව් නොකල බව ඒ ආකාරයෙන්ම පිලිගෙන ඇත. තවද මෙම මියගිය පුද්ගලයින් සහ මෙම සාක්ෂිකරු අතර කිසිදු පුද්ගලික ඥාතිකමක් හෝ සම්බන්ධයක් නොතිබීම යන කරුණු පොදුවේ සලකාබැලීමේදී ඔහු පක්ෂග්‍රාහී භාවයකින් තොරව සාක්ෂි දුන් බව ගම්‍ය වේ. එනම් ඔහු සාක්ෂි දුන් විලාශය පොදුවේ මෙම අධිකරණය නිරීක්ෂණය කලේ අසනු ලබන ප්‍රශ්නවලට නොපැකිලිව හා ඍජුව ප්‍රතිචාර දැක්වූ බවත් ඒ අනුව සත්‍ය ප්‍රකාශ කරන්නෙකුගේ විලාශයෙන් සාක්ෂිදුන් සාක්ෂිකරුවෙකු බවත්ය.

එය එසේ වුවද එම සාක්ෂිකරුගේ සාක්ෂියෙහි ඒකාකාරීභාවය දැන් සලකා බැලිය යුතුය. එහිදි මෙම සාක්ෂිකරු විසින් 2015 ට පෙර සිදු කරන ලද ප්‍රකාශ සහ ලබාදුන් සාක්ෂි වෙන්වද 2015 ට පසුව ඔහු ලබා දුන් ප්‍රකාශ සහ පෙර සාක්ෂි වලින් මතුවන පරස්පරතා ඌනතා වෙනමද වෙන් වෙන්ව සලකා බැලිය යුතුය. පෙර විශ්ලේෂණය කල ආකාරයට 2015 ට පෙර ඔහු මෙම නඩුවේ චෝදනාවන්හි නම් සඳහන් මරණකරුවන්ගේ මරණයන්ට මෙම විත්තිකරුවන්ගේ සම්බන්ධතාවය සහ ඊට අනුශාංගික කරුණු හෙලිදරව් නොකල බවට පිලිගෙන ඊට හේතු ඉදිරිපත් කර ඇත. එම හේතු පිලිගත හැකි බවට අප දැනටමත් තිරණය කර ඇත. ඊට අමතරව මෙම අධිකරණය විසින් සලකා බැලිය යුතු කරුණක් වන්නේ මෙම සාක්ෂිකරු විසින් මුලින්ම එනම් 2012.11.10 දින සිවිල් ඇඳුමෙන් සැරසුනු නිලධාරියෙකුට කල ප්‍රකාශය විත්තියට ලබා දීමට නොහැකි වීමයි. මෙවන් ප්‍රකාශයක් සිදු කර තිබූ බව නඩුව ආරම්භයට පෙර විත්තිය මෙන්ම පැමිණිල්ලද මෙම අධිකරණයේ අවධානයට යොමු කල අතර එම ප්‍රකාශය සොයා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ඒ අවස්ථාවේ ගනු ලැබූ නමුත් එය සාර්ථක වූයේ නැත. එසේම නඩුව අවසානයේ 2 වැනි විත්තිකරු වෙනුවෙන් සාක්ෂි කැඳවා එවන් ප්‍රකාශයක් සටහන් කරගෙන තිබූ බවත් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ (අ.ප.දේ )එය මුල් අවස්ථාවේ තිබී පසුව කිසියම් හෝ හේතුවක් මත එම ප්‍රකාශය සටහන් කර ගත් අපරාධ සටහන් පෑඩයේ පිටු ප්‍රකාශය සටහන් කර ගත් නිලධාරියා විසින්ම නැවත ලබාගෙන කිසියම් කායර්යකට රැගෙන ගිය බවට ලේඛන මගින් සාක්ෂි ඉදිරිපත් විය. අ.ප.දේ ස්ථානාධිපති මෙන්ම ඉහත කී ලේඛන පවත්වා ගෙන නිලධාරීන් කැඳවන ලදී. ඒ අනුව අදාල ප්‍රකාශය මේ වන විට සොයා ගැනීමට නොහැකි තත්වයකට පත්ව ඇති බව මෙම සාක්ෂි වලින් තහවුරු වී ඇත. ඒ අනුව මෙම ප්‍රකාශය කිසියම් පාශර්වයක් විසින් සගවා තැබීමක් සිදු කර නොමැති යම් ආකාරයකට එය අස්ථාන ගතවීමක් සිදුවී ඇති බව පෙනේ. එනම්, මෙම නඩුව පුරාවට හෙලිදරව් වූ එක් කරුණක් වන්නේ මුල් අවස්ථාවේ සිට මෙම සිද්ධියට අදාලව විමශර්න කටයුතු සහ පරීක්ෂණ විවිධ පොලිස් ඒකක සහ පොලිස් ස්ථාන මගින් මෙන්ම විවිධ ආකාරයේ පරීක්ෂණ කමිටු මගින් වසර ගණනාවක් තුල විවිධ ආයතන විසින් සිදු කර ඇති බවය. ඒ අතරතුර මෙම මුල් ප්‍රකාශ අස්ථාන ගත වී ඇති බව හෙලිදරව් වී ඇත. එය මෙම අධිකරණයට පිලිගත හැකි කරුණකි.

එසේ වුවද කුමන හෝ හේතුවක් මත මෙවන් මුල් ප්‍රකාශයක් අස්ථානගත වීම හේතුවෙන් යුක්තිය ඉටුවීමට ඉන් කිසියම් හෝ අගතියක් සිදු වන්නේද යන කරුණ සහ මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ පිලිගත හැකි භාවයට කිසියම් හෝ ආකාරයක නීතිමය බලපෑමක් සිදු වන්නේද යන කරුණ මෙන්ම විත්තියට යම් අගතියක් සිදුවන්නේද යන කරුණ අප දැන් සලකා බැලිය යුතුය.

මෙම නඩුවේ මුල් අවස්ථාවේ සිටම විත්ති පාශර්වය මෙවන් ප්‍රකාශයක් කර තිබූ බව දැන සිට ඇත. මෙම නඩුවේ සුවිශේෂත්වය වන්නේ මෙම සාක්ෂිකරු මූලික සාක්ෂියේදි මෙන්ම හරස් ප්‍රශ්න වලට පිලිතුරු දෙමින් ඔහු මෙවන් ප්‍රකාශයක් සිදු කල බවත් එහිදි මෙම නඩුවේ විත්තිකරුවන්ට එරෙහිව ඔහු ඉදිරිපත් කරන ලද කරුණු සහ චෝදනාවල නම් සඳහන් මරණකරුවන්ගේ මරණ සම්බන්ධයෙන් විත්තිකරුවන් සම්බන්ධ වූ බවට කිසිවක් එකී ප්‍රකාශයේ සඳහන් නොකල බව පිලිගෙන ඇත. ඒ අනුව එම ප්‍රකාශය තිබුණේ නම් යුක්තිය ඉටු වීම සම්බන්ධයෙන් විත්තියට එමගින් ලැබීමට තිබූ වාසිය මෙම නඩුවේදී විත්තියට ලැබී ඇති බව පෙනේ. එම කරුණු පොදුවේ සලකා බැලීමේදී ඉහත කී පසුබිම යටතේ මෙම සාක්ෂිකරුගේ මුල් ප්‍රකාශය නොතිබීම හේතුවෙන් විත්තියට කිසිදු සැලකිය යුතු අගතියක් හෝ මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ නිත්‍යානුකූල භාවයට කිසිදු බලපෑමක් සිදු නොවන බව මෙම අධිකරණයේ මතයයි.

ඉහත කී කරුණුවලට යටත්ව අප දැන් එම සාක්ෂිකරුගේ සාක්ෂිය අතරතුරදී මතුවූ ඌනතාවයන් සලකා බලමු. එක් ඌනතාවයක් වන්නේ ඔහු වික්‍රමසිංහ කමිටුව ඉදිරියේ සාක්ෂි දීමේදී සිවිල් ඇඳුමෙන් සැරසුන තුන්දෙනෙකු බන්ධනාගාරය තුලට පැමිණීම සම්බන්ධයෙන් සහ ටෝච් ගසා රුදෙවියන් තුන්දෙනෙකු රැගෙන යාම යන කරුණ හෙලිදරව් නොකිරීම වේ. එසේම මෙම කරුණ ඔහුගේ මුල් ප්‍රකාශයේ සඳහන් නොවීමද ඌණතාවයක් වශයෙන් මතු කර ඇත. එසේම මූලික විමශර්නවලදී සහ තේනබදු කමිටුවේදීද, නාකොටික් එකේ රංගජීව කියලා යමෙකු ප්‍රකාශ කලා යැයි සඳහන් නොකිරීම ඌනතාවයක් වශයෙන් මතුකර ඇත. මෙම ඌනතාවයන් සලකා බැලීමේදී සාක්ෂිකරු දැක්වූ හේතුත් අනෙකුත් කරුණු සමග සැලකිල්ලට ගත යුතු වෙ. එනම් මෙම කමිටු එනම් වික්‍රමසිංහ කමිටුවද මූලික විමශර්නයද ඇතුළු අනෙකුත් කමිටුවල බොහෝ විට මූලිකත්වය ගෙන ඇත්තේ බන්ධනාගාරයේ ඉහල නිලධාරීන් හෝ එවකට එම ආයතනයන්ට සම්බන්ධ අය වේ. ඒ අවස්ථාව වන විට සාක්ෂිකරු මුලින්ම ප්‍රකාශ කර ඇති ආකාරයට මෙම මෙහෙයුමට මූලික වූ

බලධාරීන්ගේ යටතේ වූ පරිපාලනයක්ද තිබී ඇත. ඒ අනුව මෙම සාක්ෂිකරු පෙර සඳහන් කල කාරණා ඉහත කමිටු ඉදිරියේදී සහ විමශර්න වලදී හෙලිදරව් නොකිරීමට හේතු වී ඇති බව පෙනේ. ඒ අනුව යම් ආකාරයකට ඌනතාවයන් තිබුනේ වුවද සාක්ෂිකරු ඊට දක්වා ඇති හේතු සැලකිල්ලට ගැනීමේදී එම හේතු සාධාරණ හා පිලිගත හැකි බවට තීරණය කරනු ලැබේ. ඒ අනුව එම කරුණු ඔහුගේ සාක්ෂියේ විශ්වසනීයත්වය බලපෑමක් නොවේ.

**<u>ගිනි අවි භාර ගැනීම සහ අනෙකුත් බන්ධනාගාර නිලධාරීන්ගේ සාක්ෂි.</u>**

**<u>පැ.සා.14. ජේලර් වසන්ත නානායක්කාර.</u>**

මෙම සිද්ධිය වූ 2012 නොවැම්බර් මස වන විට ඉහත සාක්ෂිකරු වැලිකඩ බන්ධනාගාරයට අනුයුක්තව සේවය කර ඇත. ඔහුට එහිදි තිබූ රාජකාරිය වන්නේ සිරකරුවන් අමුත්තන්ට පෙන්වීමේ රාජකාරිය වේ. ඊට අමතරව දෛනික අවි ගබඩාව භාරවද කටයුතු කර ඇත. මෙම සාක්ෂිකරු එදින සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂිකරුවෙක්ද වේ. එදින නිල පෙරෙට්ටුවක් සඳහා අවි නිකුත් කිරීමක් පෙ.ව.11. 30 ට පමණ සිදු කර ඇත. මීට අමතරව විවිධ රාජකාරී කටයුතු සඳහා අවි නිකුත් කිරීමද ඔහු විසින් සිදු කරනු ලබයි. වැලිකඩ ප්‍රධාන ජේලර් වලිසුන්දර මහතා එදින දහවල් 12.00 පමණ වන විට නිවාඩු ලබා පිටව ගිය බවත් නිල පෙරට්ටුව සඳහා නිකුත් කර අවි භාරදීමට යෝජිතව තිබී ඇත්තේ සවස 2.00ට පමණ බවත් එසේ වුවද ඒවා භාරදීමට එදින අවස්ථාවක් ලැබී නොමැති බවත් මොහුගේ සාක්ෂියෙන් හෙලිදරව් වේ.

ඊට පෙර වි.කා.බ නිලධාරී කණ්ඩායමක් බන්ධනාගරයේ පරීක්ෂණ කටයුත්තකට පැමිණ ඇති අතර ඒ සමග ඉන්දික සම්පත් නැමති ජේලර් වරයාද පැමිණ ඇත. මේ අවස්ථාවේ කුඩා බණ්ඩා මහතා කෑමට ඔහුගේ නිල නිවසට ගොස් සිට ඇත. මෙම සාක්ෂිකරු දුරකථන මගින් කුඩා බණ්ඩා සහ ජයසිංහ යන අයට මේ සම්බන්ධයෙන් දැනුම් දීමෙන් අනතුරුව කුඩා බණ්ඩා මහතා බන්ධනාගාරය තුලට පැමිණ ඇත. බන්ධනාගාරයේ ප්‍රධාන අවි ගබඩාව මෙන්ම කුඩා අවි ගබඩාවක් ද ඇති අතර ප්‍රධාන අවි ගබඩාවට විශේෂ කායර් බලකා නිලධාරීන් ආරක්ෂාවට සිට ඇත. පස්වරු 4.30 ත් 5.00 ත් අතර කමර්ාන්ත අංශය පැත්තෙක් කලබලයක් ඇසී ඇත. ඉන්

අනතුරුව කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල වී ඇත. ආපන ශාලාවේ වහලය මත ගිනි අවිද සහිතව රැදෙවියන් සිටි බවත් ජයසංහ මහතා ඔවුනට අවි බිම තබා එන ලෙසත් දන්වා ඇත. රැදෙවියන් එවිට වි.කා.බ. නිලධාරින් පිටත් කරන ලෙසත් ඊට පසුව එයට එකඟ වන බව දැනුම් දි ඇත. කුඩා බණ්ඩාගේ සාක්ෂියෙන් හෙලිදරව් වී සිද්ධි මාලාව මොහුගේ සාක්ෂියෙන්ද හෙලිදරව් වී ඇත. ඒ අනුව එම සියළු කරුණු නැවත ගෙනහැර දැක්වීමේ අවශ්‍යතාවයක් නොමැති අතර ඔහුගෙන් හෙලිදරව් වී ඇති අනෙකුත් සාක්ෂි සම්පිණ්ඩනය කරනු ලැබේ.

රාත්‍රී 11.00 ට පමණ යුද හමුදා නිලධාරියෙක් පැමිණ අවි ගබඩාවල විස්තර විමසා ඇත. සාක්ෂිකරු විසින් ඒ සම්බන්ධයෙන් තිබූ තොරතුරු දැනුම් දී ඇත. පසුව රාත්‍රී 12.00 වන විට යුද හමුදාවද බන්ධනාගරය තුලට පැමිණි සිටි බවත් වෙඩි හුවමාරු වන ශබ්දද සාක්ෂිකරුට ඇසී ඇත. පාන්දර 4.00 ත් 4.30 ත් අතර වලිසුන්දර මහතාද සමග මෙම සාක්ෂිකරු බන්ධාගාරය ඇතුලට පැමිණ ඇත. එසේ එන විට දෛනික අවි ගබඩාව කඩා තිබූ බවත් ආයුධ කිසිවක් එහි නොතිබුන බවත් සාක්ෂිකරු නිරීක්ෂණය කර ඇත. එසේ ඇතුළු වන වේලාවේදී ප්‍රධාන ගේට්ටුව ලග විදුලි ආලෝකය තිබී ඇත. කොඩිප්පිලි මහතාද ඒ අසල සිට ඇත. දෛනික අවි ගබඩාව කඩා තිබුනේ වුවද ප්‍රධාන අවි ගබඩාව සුරක්ෂිතව තිබී ඇත. මේ අවස්ථාවේදී ජයසිංහ මහතා සාක්ෂිකරුට උපදෙස් දී ඇත්තේ ඒ වචන විට යුධ හමුදාව විසින් රැදෙවියන්ගෙන් ලබාගෙන තිබූ ගිනි අවි භාරදීමේදී එම අවි නිසි ආකාරයට භාරගන්නා ලෙසයි. අබලන්ව තිබූ දුරකථන කුටිය තුල එම කටයුත්ත කිරීමට සූදානම් කර ගෙන ඇත. අළුයම 6.00 ට පමණ මෙම කටයුත්ත නිසි ආකාරයට ආරම්භ කර ඇති අතර සාමාන්‍යයෙන් භාවිත කරන අවි භාර ගැනීමේ ලේඛන ඒ අවස්ථාවේ නොතිබීම හේතුවෙන් දුරකථන කුටිය අසල වැටී තිබූ පොතක් ගෙන එහි පිටුවක් ඒ සඳහා භාවිතා කර ඇත. මෙ සඳහා නියාමක විජේරත්න සහ සුභසිංහ යන දෙදෙනාම සහාය වී ඇත. කුඩා බණ්ඩා විසින් ඔහු භාරයේ තිබූ යම් ගිනි අවි ඒ අවස්ථාවේදී භාරදී ඇත. මීට අමතරව හමුදා නිලධාරීන් විසින්ද යම් අවි බාරදී ඇත. මෙම අවි භාර ගැනීම සිදු කිරීම පැ. 31 ඡායා රූපයෙන් තහවුරු වේ. යුධ හමුදා සැරයන් තෙන්නකෝන් විසින් මෙසේ අවි බාර දීම සිදු කර ඇත. ඒ අවස්ථාවේ අදාල අවි පරීක්ෂා කොට අංකද සටහන් කර අවි භාරගෙන ඇත. එසේ අවි භාරගැනීමට පිලියෙල කල ලේඛනයේ පිටපතක් පැ. 02 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. එය ඡායා පිටපතක් වන බැවින් ඊට විරුද්ධ වී ඇති අතර ඒ සම්බන්ධයෙන් විමසීමක්

කරන ලදුව ද්විතීයික සාක්ෂි මෙහෙයවීමට පැමිණිල්ලට අවසර දී ඇත. මෙම පැ. 02 ලේඛනය සටහන් කොට ලේඛනය සමග අවි බාරදුන් පසු පරීක්ෂා කිරීම මෙම සාක්ෂිකරු සිදු කර ඇත. එසේ අවි හා අංක පරීක්ෂා කිරිමේදී සමහර සුළු වෙනස්කම් මෙම සාක්ෂිකරු විසින් නිවැරදි කර සංශෝධනය කර ඇත. අවි බාරගෙන එම අවි බාරගත් බවට අදාල ලේඛනය අත්සන් කර තෙන්නකෝන්ට බාර දී එහි ඡායා පිටපතක් මෙම සාක්ෂිකරු භාරයේ තබා ගෙන ඇත. ඊට අමතරව මෙම සාක්ෂිකරු විසින් සිද්ධිය සිදු වූ දින අස්ථාන ගත වූ අවි වල විස්තර සහිත ඔහු පිලියෙල කල ලේඛනයක්ද පැ. 38 ලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙසේ මෙම සාක්ෂිකරු විසින් උදැසන භාර ගත් අවි ලේඛන ගත කර ඇති අතර ඒ අවස්ථාවේ එමිල් රංජන් නැමැති මෙම නඩුවේ 2 වන විත්තිකරු පැමිණ ගිනි අවි 4 ක් ඉල්ලා ඇත. 2 වන විත්තිකරු එසේ ඉල්ලා සිටියේ වුවද මෙම සාක්ෂිකරු එය දීමට මැලිකමක් දක්වා ඇත. මේ අවස්ථාවේ කොමසාරිස් ජනරාල් කොඩිප්පිලි ද එම ස්ථානයේ සිට ඇත. 2 වනි විත්තිකාර එමිල් රංජන් "වෙපන් 4 ක් ඉක්මනින් දෙනවා" යනුවෙන් අවි ඉල්ලූ බවත් පෙරද කී පරිදි එසේ දීමට අදිමදි කිරිමත් සමග කොඩිප්පිලි මහතා විසින් "අයිසේ වෙපන් ටික ඉක්මනින් දෙනවා "යනුවෙන් ප්‍රකාශ කිරීම හේතුවෙන් සාක්ෂිකරු විසින් අවි 4 ක් 2 වැනි විත්තිකරු වෙත භාරදී ඇත. මේ අවස්ථාවේ කුඩා බන්ඩා නියාමක විජේරත්න සහ සුබසිංහ යන අයද එහි අවට සිට ඇත. කුඩා බණ්ඩා මහතා විසින් අතින් සංඥාවක් ඒ අවස්ථාවේ කර ඇත. 2 වැනි විත්තිකරු එම අවි ගෙන එතැනට පැමිණ නිලධාරියෙකුට භාරදී ඇති අතර එම අය එකී අවි 4 රැගෙන ගොස් ඇත. පැ. 39 ලේඛනයේ ඒ අවි ආසන්නයේ සටහනක් යොදා ඇත. ඒ ආසන්නයේ එමිල් රංජන් යනුවෙන් ලියා ඇත. පසු අවස්ථාවකදී මෙසේ එමිල් රංජන් මහතා ලබාගත් ගිනි අවි අතර මලසිරුරු අසල තිබී සොකෝ නිලධාරින් විසින් නැවත භාරයට ගෙන ඇති අවි තිබී ඇත. මලසිරුරු අසලද තිබියදී සොයාගත් ගිනි අවි වල අංක සටහන් කිරීමේදී ඒවා ඉදිරියේ සිංහල භාෂාවෙන් මල යනුවෙන් මෙම සාක්ෂිකරු පැ. 38 ලේඛනයේ සටහනක් යොදා ඇත. ඒ අනුව පැ. 39 ලේඛනයේ 2 වනි විත්තිකරුට ගිනි අවි දීම සම්බන්ධයෙන්ද පැ. 38 ලේඛනයේ ඒවා පසුව මලසිරුරු ලග තිබී හමුවීම සම්බන්ධයෙන් සටහන් යොදා ඇත.

මෙම සාක්ෂිකරුව දීසර් වශයෙන් හරස් ප්‍රශ්නවලට භාජනය වී ඇත. හරස් ප්‍රශ්නවලදීද මෙම සටහන යෙදීමට අදාලව ප්‍රශ්න කර ඇති අතර ඔහු විසින් වික්‍රමසිංහ කමිටුවට සාක්ෂි ලබා දෙන අවස්ථාවේ 2 වැනි විත්තිකරු පැමිණ තුවක්කු රැගෙන

යාම සම්බන්ධයෙන් ප්‍රකාශ නොකිරීම පිලිබඳව ප්‍රශ්න කර ඇත. එම කමිටුවේදී අවි බාරගැනීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්න කිරීමෙක් කර නැති අතර එස්.ටී.එෆ් නිලධරීන් පැමිණීම සම්බන්ධයෙන් ප්‍රශ්න කර ඇත. එසේම මොහු අනුද්‍රාහැන්නදි මහතා ඉදිරියේදීද සාක්ෂි දී ඇත. නම්බුවසම් කමිටුවේදීද සාක්ෂි දී ඇත.

**<u>පොලිස් සාක්ෂි.</u>**

මෙම නඩුවේ විමෂර්න කටයුතු පොලිස් ස්ථාන කීපයකින් සහ විවිධ ඒකක කීපයකින් සිදු කර ඇත. එනම් බොරැල්ල පොලිසිය අ.ප.දේ, කොළඹ අපරාධ කොට්ඨාශය ඇතුළු ආයතන වලින් දීඝර් කාලයක් පුරාවට දිව යන විමෂර්නයන් සිදු කර ඇත. මීට අමතරව විවිධ පරීක්ෂන කමිටුවල පරික්ෂාවටද ලක්වී ඇත.

මෙම සිද්ධිය සිදු වූ මුල් අවස්ථාවේ සිට 2015 දක්වා මෙම විමෂර්න පොලිසිය මඟින් සිදු කර ඇති අතර 2015 පසුව මෙම විමෂර්ණයන් නැවත වරක් යම් උනන්දුවකින් සිදු කල බවක් එක් සාක්ෂියකින් හෙලිදරව් විය. සාක්ෂිකරුවන්ගෙන් හෙලිදරවු වූ ආකාරයට ආණ්ඩුවල වෙනසක් සමඟ මෙම විමශර්නයේ ක්‍රියාශීලී භාවය සහ වෙනස්වීම් සිදු වී ඇති බව පෙනේ. කුමන හෝ කාරණයක් හේතු කොට ගෙන විමශර්නයක දුබලතාවයක් හෝ සැකයක් මතු වන්නේ නම් එහි වාසිය අපරාධ නඩුවකදී විත්තියට ලබා දිය යුතුය. මෙම සිද්ධාන්ත මේ අවස්ථාවේ සඳහන් කිරීමට හේතු වූයේ ඉහත කී විමශර්නයේ ස්වභාවය හේතු කොට ගෙනය.

**<u>පැ.සා. 75 පු.පො.ප. විජේවික්‍රම</u>**

ඉහත සාක්ෂිකරු 2012 නොවැම්බර් මස වන විට බොරැල්ල පොලිස් ස්ථානයේ පාලන අංශයේ ස්ථානාධිපතිව කටයුතු කර ඇත. නොවැම්බර් 09 වනදා වැඩ බලන ස්ථානාධිපති වශයෙන්ද කටයුතු කරමින් සිටියදී පැය 16.40 ට පමණ වැලිකඩ බන්ධනාගාරය තුල ගැටුමක් සම්බන්ධයෙන් තොරතුරක් ලැබී ඇත. ඒ අනුව ස්ථානයේ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් සමඟ එම ස්ථානයට ගොස් ඇත. මෙම සිද්ධිය තම

පොලිස් ස්ථානයේ බල ප්‍රදේශය තුල සිදු වී තිබුනු බැවින් එසේ බන්ධනාගාරය අසලට ගොස් ඇත. එතැනදී ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක, නියෝජ්‍ය පොලිස්පති ගුණවධර්න, සා.පො.අ. රණගල. ජේ. පො. අ රොෂාන් යන අයට දුරකථනයෙන් දැනුම් දී ඇත. මොහු එම ස්ථානයේ පසු දින එනම්, 10 වනදා පෙරවරු 07.00 පමණ වනතෙක් රැදී සිටිය නමුත් ඔහුට බන්ධනාගාරය තුලට යාමට අවස්ථාවක් ලැබී නැත. මෙම කාලය තුලදී බන්ධනාගාරය තුල කලහාකාරී තත්ත්වයක් තිබූ බව නිරීක්ෂනය කර ඇත. පසුව නැවත පොලිස් ස්ථානයට පැමිණ ස්ථානාධිපතිතුමාට දැනුම් දී ඇති අතර ඉන් පසුව විමෂර්නයන්ට ඔහු සම්බන්ධ වී නැත. මෙදින වි.ක.බ. නිලධාරීන් බන්ධනාගාරයේ සිටි බව දැක ඇත. වි.ක.බ. නියෝජ්‍ය පොලිස්පති රණවන මහතාට තුවාලයක් සිදු වුනු බවද පසුව දැනගෙන ඇත. පැවති කලහාකාරී තත්වය හේතුවෙන් යම් අනතුරක් වේ යැයි සිතූ බැවින් ඇතුලු වීමෙන් වැලකී සිටි බවද සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. යුධ හමුදා හට පිරිස් පැමිණියේ ඔහු එම ස්ථානයට ගිය පසුව බවද සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

SOCO නිලධාරීන් කැදවීම ඔහු සිදු කර ඇති අතර යම් ප්‍රකාශ ලබා ගැනීමක් බොරැල්ල පොලිසියේ නිලධාරීන් විසින් සිදු කල බවද දැනගෙන ඇත.

<u>**පැ.සා. 77 පු.පො.පා. ඉද්දමල්ගොඩ.**</u>

ඉහත සාක්ෂිකරු විශේෂ පුහුණුවක් ලැබූ අපරාධ ස්ථාන පරීක්ෂන නිළධාරියෙක් වේ. 2012.11.09 වන දා බොරැල්ල වැඩ බලන ස්ථානාධිපතිගේ දැනුම් දිම අනුව වැලිකඩ බන්ධනාගාරය වෙත පැමිණ ඇත. එසේ වූවද පැවති වාතාවරණය හේතුවෙන් එදින බන්ධනාගාරය තුලට නොගිය බවත්, පසු දින 08.30 ට පමණ ජොෂ්ඨ නිලධාරීන්ගේ උපදෙස් අනුව බන්ධනාගාරය තුලට ගොස් පරීක්ෂන කටයුතු ආරම්භ කර ඇත. කණ්ඩායම් තුනක් වශයෙන් මෙම භූමියේ කොටස් 03 කට වෙන් කර ගෙන පරීක්ෂන කටයුතු කර ඇත. වැලිකඩ බන්ධනාගාර භූමියේ දළ සැලැස්මක් ඔහු පිලියෙල කර ඇති අතර එය පැ. 56 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. කණ්ඩායම් 03 වෙන් වෙන්ව පරික්ෂා කල භූමි ප්‍රදේශ පිලිවෙලින් පැ. 56 A, B සහ C වශයෙන් ලකුණු කර ඇත. අපරාධ ස්ථානයේ සොයා ගත් යම් භාණ්ඩ කොළඹ අපරාධ කොට්ඨාශයේ පරීක්ෂන නිලධාරීන්ට භාර දී ඇත.

<u>**පැ.සා 78 පො.ප. පේදුරුආරච්චි.**</u>

ඉහත සාක්ෂිකරු කොළඹ දකුණ අපරාධ ස්ථාන පරීක්ෂනාගාරයට අනුයුක්තව සේවය කර ඇත. ජේ.පො.අ. ගේ නියෝග අනුව 10 වනදා පැය 0600ට අපරාධ ස්ථානයට වාතර්ා කර ඇත. එහිදී ප්‍ර.පො.ප ඉද්දමල්ගොඩ ඇතුළු අනෙක් ස්ථාන වලින් පැමිණි නිලධාරීන් මුන ගැසී එම අය සමඟ අපරාධ ස්ථාන පරික්ෂාවට සහභාගී වී ඇත. තම අංශයේ පො.කො.15019 ජයසුන්දර ඡායාරූප නිලධාරියා වශයෙන් කටයුතු කල බවද, තමන් යටතේ සිටි කණ්ඩායම පැ. 56 A ලෙස ලකුණු කරන ලද කොටස පරික්ෂා කර ඇත. මෙම ප්‍රදේශයේ තිබූ තාවකාලික අවි ගබඩාව, අමුත්තන් මුණ ගැසෙන කාමරය, දුරකතන කුටිය යන ගොඩනැගිලිවලට අලාභ හානි සිදු කර තිබීම නිරීක්ෂනය කර ඇත. තවද පන්සල් භූමිය නැමැති ස්ථානයක් ඇති බවත්, එහි දකුණු පසින් බන්ධනාගාරයේ මුලුතැන්ගෙය තිබුනු අතර එහි වහලට, ජල ටැංකි වලට හානි කර තිබුනු අතර තැන තැන හිස් සහ ජීව පතුරම් වැටී තිබෙනු නිරීක්ෂනය කර ඇත. තවද පන්සල් වාට්ටුව අසල සහ E වාට්ටුව තුල මෘත දේහ තිබෙනු නිරීක්ෂනය කර ඇත. එනම් තිස්ස කුමාර සහ අන්වර් ඩීන් නැමැති අයගේ දේහ බව ඔවුන්ගේ සිරකරු අංක මඟින් හදුනා ගෙන ඇත.

E වාට්ටුවේ මල් පාත්ති අසල T 56 හිස් උන්ඩ ගැබ් 03 ක් සඟවා තිබීම නිරීක්ෂනය කර ඇත. ඔහු විසින් පිලියෙල කල දළ සැලැස්ම පැ. 57 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. තවද හානි වී තිබූ ගොඩනැගිලි පෙන්නුම් කරන දල සැලැස්ම පැ. 58 ලෙස ලකුණු කර ඇත. අවි ගබඩාව කඩා තිබුනු බවත්, එම ගබඩාවට ඇතුලු වූ විට ඇති තාවකාලික අවි ගබඩාවේ බිත්තියද කඩා තිබීම නිරීක්ෂනය කර ඇත. දුරකථන කුටියට අලාභ හානි සිදුවී තිබෙනු නිරීක්ෂනය කර ඇත. එම කුටියේ දල සැලැස්ම පැ. 59 ලෙස ලකුණු කර ඇත.

හරස් ප්‍රශ්න අතරතුරදී බන්ධනාගාරයේ ප්‍රවේශ මාගර්යේ ගඩොල් කැබලි, හිස් පතුරම් කොපු, වෙඩි වැදුනු ත්‍රීවීල් රථයක් නිරීක්ෂනය කර ඇත. 10 වනදා අලුයම 06.00 වන විට යුධ හමුදා රථ වාහන, සන්නද්ධ රථ තිබී ඇත. ඒ අනුව මෙම ස්ථානයේ යුධ හමුදා මෙන්ම පොලිස් නිලධාරීන් විශාල පිරිසක් සිට ඇත. ඔහු බන්ධනාගාරයට ඇතුලු වන අවස්ථාවේ බන්ධනාගාර නිලධාරීන්ට දැනුම් දී අවසරය ලබා ගෙන ඇත. මෙම විමෂර්නය අතරතුරදී T 56, M 16 සහ 9mm හිස් පතුරම් කොපු විශාල ප්‍රමාණයක් සොයා ගෙන ඇත. එදින පෙරවරු 08.30 වන විට සිරකරුවන් සිර මැදිරි තුල සිටි බව නිරීක්ෂනය කර ඇත.

**<u>පැ.සා. 80 කා.පො.ප සුමනලතා</u>**

මෙම නිලධාරිණී SOCO නිලධාරීන්ට සහාය වී ඇත. මාලන් නැමැති මරණකරු සමඟ වැටී තිබූ දේහයන් අසල හිස් පතුරම් කොපු තිබී ඇත. ජේදුරුආරච්චි ඇතුලු කණ්ඩායමටද සහාය වී ඇත. මැය විසින් පරික්ෂාවට භාජනය කර ඇත්තේ 56C කොටස වේ. එහි M සහ J ගොඩනැගිලි අතර මෘත ශරීර 03 ක් තිබී ඇත. එම දේහ 03 පැ. 05 ජායාරූපයේ තිබෙන දේහ 03 බව හදුනාගෙන ඇත. එනම්, ජෝතිපාල, මංජු ශ්‍රී සහ මාලන් යන අයගේ දේහයන් වේ. එම දේහයන් වල වෙඩි වැදීමකින් සිදු වූ බවට සැක කෙරෙන තුවාල නිරීක්ෂනය කර ඇත. තවද T 56 වගර්යේ ගිනිඅවියක් ඒ අසල තිබී ඇත. එහි පතුරම් ගැබ තුල ජීව උන්ඩ 10 ක් තිබී ඇත. එම අවියේ අංකය 21-534010 වන අතර, එය නඩු භාණ්ඩයක් වශයෙන් භාරයට ගෙන ඇත. තවද මෙම මෘත දේහයන් 03 ආසන්නයේ ඩ්‍රැගන් වගර්යේ කළු පාට හැඩලය සහිත විදුලි පන්දමක් වැටී තිබී සොයා ගෙන ඇත.

මෙම දේහ 03 වැටී තිබූ ස්ථානය අසල බිත්තියේ ලේ නිරීක්ෂණය කර ඇත. ජායාරූප වල එය පෙන්වා හදුනාගෙන ඇත. මෙම ලේ පැල්ලම් පොලොවේ සිට අඩි 1 ½ ක් පමණ උඩින් තිබී ඇත. ඉන් අනතුරුව පැ. 56 C ලෙස සලකුණු කරන ලද ප්‍රදේශයේ බන්ධනාගාර අධිකාරී කායර්ාලයේ දකුණු පස ලෙස්ටර් ද සිල්වා යන අයගේ මෘත දේහය නිරීක්ෂනය කර ඇත. ඒ අනුව මෙම සාක්ෂිකාරිය පැ.56 C ලෙස ලකුණු කල ප්‍රදේශයේ මෘත දේහ 04 ක් නිරීක්ෂනය කර ඇත. හරස් ප්‍රශ්න අතරතුරදී බේස්ලයින් පාරේ දකුණු පැත්තට වන්නට වෙඩි වැදුනු ත්‍රීවීලරයක් ඇය නිරීක්ෂනය කල බව ඇය පිලිගෙන ඇත.

**<u>පැ.සා. 79 පො.ප සුසන්ත</u>**

මෙම සාක්ෂිකරු කොළඹ උතුර අපරාධ ස්ථාන පරික්ෂනාගාරයේ නිළධාරියෙකි. ඔහුද පෙර සඳහන් සාක්ෂිකරුවන් සමඟ අපරාධ ස්ථානය පරික්ෂාවට පැමිණි අයෙකි. පැ. 56 B ලෙස සටහන් කරන ලද ප්‍රදේශය ඔහුගේ පරික්ෂාවට ලක් කර ඇත. බන්ධනාගාරයේ කමර්ාන්ත අංශය ඊට ඇතුලත්ය. ඔහු පරික්ෂා කල එම ප්‍රදේශයේ දළ සැලැස්ම පැ. 66 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රදේශය ජායාරූප ගත කිරීමද කර ඇත. මළ සිරුරු 05 ක් නිරීක්ෂනය කර ඇත. දොර ආසන්නයේ කළු තුෂාර නැමැත්තාගේ දේහයද, එම දේහය අසල T56 අංක 56-21558631 දරණ ගිනි අවියක්ද තිබී ඇත. ඒ අසල හිස් පතුරම් කොපුද තිබී ඇත. ඊට තරමක් දුරින් නිමර්ල අතපත්තු නැමැති අයගේ මලසිරුර තිබී ඇත. ඔහුගේ කකුල ආසන්නයේ T 56 අංක 56-21533278 දරණ අවිය තිබී ඇත. පැ. 19 ජායාරූපයේ

ඇත්තේ එම මල සිරුර බව හඳුනාගෙන ඇත. ඉන් අනතුරුව පැ. 27 ඡායාරූපයේ ඇති දේහය ඊට තරමක් එහායින් වැටී තිබීම නිරීක්ෂනය කර ඇත. ඒ දේහය අසල අංක 56-21532857 දරණ T 56 අවිය තිබී ඇත. මීට අමතරව කමර්ාන්ත අංශයේ ගොඩනැගිල්ලේ ඉදිරිපසට වන්නට පැ. 21 ඡායාරූපයේ ඇති දේහය නිරීක්ෂනය කර ඇත. එය ගුන්ඩු නැමැති මරණකරුගේ බව පසුව දැනගෙන ඇත. මෙම මෘත දේහයන් තුනේම තුවාල තිබුනු බව සහ ඒ අවට හිස් පතුරම් කොපු නිරීක්ෂනය කර ඇත. ඉන් අනතුරුව කමර්ාන්ත අංශ ගොඩනැගිල්ලටත්, වාට්ටුව දෙසට ඇති තාප්පයත් අසල තවත් මෘත ශරීරයක් තිබුනු බවත්, එය පැ. 12 දරණ ඡායාරූපයේ ඇති මලික් සමීර නැමැත්තාගේ දේහය බවටත් හඳුනාගෙන ඇත. එම දේහය අසල මන්නා පිහියක් තිබී ඇත. ඒ අනුව මෙම සාක්ෂිකරු දේහ 05 ක් එනම් නිමර්ල අතපත්තු, විජය රෝහන, සුසන්ත පෙරේරා ඇතුලු 05 දෙනෙකුගේ දේහ දැක ඇත. ඔහු විසින් නිරීක්ෂනය කරන ලද නඩු භාණ්ඩ භාරයට ගෙන පො.කො. 39282 ජයරත්නට භාර දී ඇත.

**<u>පැ.සා. 85 පො.සැ.13242 ප්‍රියදශර්න</u>**

මොහු අපරාධ ස්ථාන පරීක්ෂනයේදී අදාල ඡායාරූප ගත කිරීම සිදු කර ඇත. වැලිකඩ බන්ධනාගාරය තුල SOCO නිළධාරීන් නිරීක්ෂනය කරන විට, පෙර සාක්ෂිකරුවන් සාක්ෂි දෙන විට හඳුනාගත් ඡායාරූප අතර මෙම සාක්ෂිකරු ගත් ඒවාද තිබී ඇත. ඔහු ඡායාරූප 395 ක් පමණ ගෙන ඇති අතර එම ඡායාරූප DSC 01 සිට 395 දක්වා අංකනය කර ඇත. ඡායාරූප ගත් උපකරණය එහි ක්‍රියාකාරීත්වය පිටපත් කර පොලිසියට භාර දීම සම්බන්ධයෙන් විස්තරාත්මකව සාක්ෂි දී ඇත. ඔහුගෙන් හරස් ප්‍රශ්න කිරීමක් සිදු කර නැත.

**<u>පැ.සා 86 පො.සැ.39682 ජයරත්න.</u>**

ඔහුද SOCO නිලධාරීන්ට සහාය වූ ඡායාරූප ශිල්පියෙක් වේ. ඔහු විසින් DSC 6387 සිට 6747 දක්වා අංකනය කර ඇති ඡායාරූප 340 ක් රූප ගත කර ඇත. මෙම නඩුවේ ඉන් ලකුණුකර ඉදිරිපත් කරන ලද ඡායාරූප හඳුනාගෙන ඇත. ඔහුගෙන්ද හරස් ප්‍රශ්න කිරීමක් සිදු කර නැත.

**<u>පැ.සා. 90 පො.කො.15019 ජයසුන්දර</u>**

ඔහුද පෙර සාක්ෂිකරු මෙන් 56 A ලෙස ලකුණු කර ඇති ප්‍රදේශය ජායාරූප ගත කර ඇත. ඔහු විසින් DC 450 සිට 714 දක්වා අංකනය කර ඇති ජායාරූප 264 ක් රූපගත කර ඇත.

ඉහත සදහන් කරන ලද ජායාරූප ගත කරන ලද සාක්ෂිකරුවන් මෙම අපරාධ ස්ථානයට උදෑසන ලඟා වී පස්වරු 09.00 ට පමණ බන්ධනාගාර පරිශ්‍රය තුලට ගොස් ජායාරූප ගත කිරීම සිදු කර ඇත. මෙම සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න කිරීමක් සිදු කර නැත.

**<u>පැ.සා. 93 පු.පො.ප බාලසූරිය.</u>**

ඔහු බොරැල්ල පොලිස් ස්ථානයේ වත්මන් ස්ථානාධිපති වේ. විමශර්නය තම පොලිස් ස්ථානයෙන් ආරම්භ කලේ වුවද මරණ පරීක්ෂන කටයුතු සිදු කිරීම සහ මහේස්ත්‍රාත් වෙත කරුණු වාතර්ා කිරීම, විමශර්නය අවසන් කිරීමක් සිදු කර නැති අතර, පසුව එනම් 2017.10.25 වන දින වාතර්ාවට අනුව අපරාධ පරීක්ෂන දෙපාතර්මේන්තුවට අදාල වාතර්ා භාර දී ඇති බවත්, ප්‍රකාශ සටහන් කර ගෙන ඇත්තේ දේහ හදුනා ගැනීමට බවත් ප්‍රකාශ කර ඇත. විමශර්න කටයුත්ත අවසන් කිරීම තම පොලිස් ස්ථානයෙන් සිදු වී නැති බව පිලිගෙන ඇත. මේ ආකාරයට වසර ගණනාවක් මෙම පරීක්ෂන පැවැත්වීමට තිබූ ප්‍රමාදය කවරේදැයි විමසීමේදී එම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ විමශර්න කණ්ඩායම් කීපයක් මෙම විමශර්නය කිරීම ඊට හේතු වූ බවය. මරණ පරීක්ෂණද පැවැත්වීමට දීඝර් කාලයක් ගතවීමට නිශ්චිත හේතුවක් ප්‍රකාශ කිරීමට නොහැකි බව සාක්ෂිකරු සදහන් කර ඇත. මෙම සැකකරුවන් සම්බන්ධයෙන් කිසිවක් අනාවරණය කරගෙන නැති බවත්, ඔහු අවසානයේ පිලිගෙන ඇත්තේ නිසි විමශර්නයක් මේ සම්බන්ධයෙන් සිදු කර නොමැති බවත්, ඊට නිශ්චිත හේතුවක් පොත් පත් පරික්ෂාවෙන් ප්‍රකාශ කිරීමට නොහැකි බවත්ය. තවද මෙම පරීක්ෂණය සිදු කර ඇති ආකාරය සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි බවත්, මෙම සිද්ධියෙන් පසුව කායර්ක්ෂම යම් විමශර්නයක් සිදු වී නැති බව ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්න අතරතුරදී මෙම විමශර්නය බොරැල්ල පොලිසිය අ.ප.දේ සහ කොළඹ අපරාධ කොට්ඨාශය මඟින් සිදු කර ඇති බව පිලිගෙන ඇත.

**<u>පැ.සා. 94 පු.පො.ප. එරංග ප්‍රනාන්දු.</u>**

මොහු කොළඹ අපරාධ කොට්ඨාශයේ වත්මන් ස්ථානාධිපති වන අතර මෙම සිද්ධියට අදාල ලේඛන අනුසාරයෙන් සාක්ෂි දීමට කැදවා ඇත. ඒ අනුසාරයෙන් ඔහු

ප්‍රකාශ කර ඇත්තේ පො.ප නෙවිල් ද සිල්වා ඇතුලු කණ්ඩායමක් විමශර්නයට සහභාගී වූ බවයි. අවි 25 ක් භාරයට ගෙන ඊට අදාලව වි.ක.බ සහ හමුදා නිළධාරීන්ගේ ප්‍රකාශ 30 ක් සටහන් කරගෙන ඇති බවද, තුවාල කරුවන් දෙදෙනෙකුගේද ප්‍රකාශ සටහන් කරගෙන අධිකරණයට කරුණු වාතර්ා කිරීම හැර වෙන විමශර්නයක් සිදු කර නැති බව පිලිගෙන ඇත.

<u>**පැ.සා. 92 පො.අ වික්‍රමසේකර.**</u>

මෙම සාක්ෂිකරු 2012 වසරේ අ.ප.දේ විශේෂ විමශර්න අංශ 01 හි ස්ථානාධිපති වශයෙන් කටයුතු කර ඇත. වැලිකඩ බන්ධනාගාරයේ සිද්ධිය සම්බන්ධයෙන් විමශර්නය භාරව කටයුතු කර ඇත. 10 වන දා පෙරවරු 09.00 ට අපරාධ ස්ථානයට ගොස් ඇත. එසේ යන විට හමුදා සහ  වි.ක.බ ඇතුලු පොලිස් නිලධාරීන්  එතැන සිටි බවත්, නි.පො.ප. අනුර සේනානායක මහතාද සිටි බවත් සාක්ෂිකරු සඳහන් කර ඇත. ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ මෙම විමශර්නය කණ්ඩායම් 04 කට බෙදා සිදු කල බවයි.

බොරැල්ල පොලිසියට අමතරව තමන්ව කැඳවා තිබුනේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ දැනුම් දීම අනුව මෙම සිද්ධියේ සංකීණර් භාවය හේතු කොට ගෙන බව ප්‍රකාශ කොට ඇත. එදින ස්ථාන පරීක්ෂණයක් කරමින් දේපල අලාභ හානි සම්බන්ධයෙන් නිරීක්ෂණයන් සටහන් කර ඇත. මළ සිරුරුද නිරීක්ෂණය කර ඒ සම්බන්ධයෙන්ද නිරීක්ෂණ සටහන් කර ඇත. දින දෙකක් පමණ කඩින් කඩ රැදී සිටිමින් පරීක්ෂණ පැවැත්වූ බවත්, මෙම විමශර්නයේ සංකීණර්භාවයත් විශාලත්වයක් නිසා තම අංශයට නිසියාකාරව මෙම විමශර්නය සිදු කිරීමට නිලධාරීන් ප්‍රමාණවත් නොවූ බව  සාක්ෂිකරු සඳහන් කර ඇත. ඔහු යටතේ මෙම විමශර්නය 2012.11.09 සිට වසර 1 ½ ක් පමණ කාලයක් සිදු කල නමුත් නිලධාරීන් ප්‍රමාණවත් නොවීමත් තම ඒකකය යටතේ වෙනත් විමශර්න ගණනාවක් තිබීමත් නිසා  නිසියාකාරව විමශර්නය සිදු කෙරුනේ නැති බවත් පිලිගෙන ඇත.

එසේ වූවද රැඳෙවියන් 1342 ක ගේ ප්‍රකාශය, බන්ධනාගාර නිලධාරීන්ගේ ප්‍රකාශයද ඇතුලුව සම්පූණර්යෙන් ප්‍රකාශ 2916 ක් සටහන් කරගෙන ඇත. තුන්වන විත්තිකරු ඉන්දික සම්පත්ගේ ප්‍රකාශයක් සටහන් කර ගත් නමුත් දෙවන විත්තිකරු මැගසින් බන්ධනාගාරයේ නිළධාරියෙකු වීම හේතුවෙන් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කරගෙන නැත. එසේම ගිනි අවි 167 ක් පමණ භාරයට ගෙන එම නිළධාරීන්ගේ

ප්‍රකාශ සටහන් කරගෙන අදාල අවි රස පරීක්ෂක වෙත යොමු කිරීමට පියවර ගෙන ඇත. 2014.03.30 මෙම සාක්ෂිකරුට උසස් වීමක් ලැබීමෙන් අනතුරුව මෙම විමෂර්ණ කටයුත්තෙන් ඉවත් වී ඇත. ඉන් අනතුරුව පො.ප. රණසිංහ එම අංශයේ ස්ථානාධිපති වශයෙන් විමශර්න කටයුතු භාර ගෙන ඇත. හරස් ප්‍රශ්න වලදී දීසර් වශයෙන් අපරාධ සටහන් පොත් පවත්වාගෙන යන ආකාරය සම්බන්ධයෙන් ප්‍රශ්න කර ඇත. තමන් විමශර්නය කල කාලයේදී නීතිපතිතුමාට ගොනු යොමු කිරීමක් සිදු වූයේ නොමැති බව ප්‍රකාශ කර ඇත.

**<u>පැ.සා. 96 පූ.පො.ප. දික්ඕවිට.</u>**

මෙම සාක්ෂිකරු 2012 නොවැම්බර් මස වන විට කොළඹ අපරාධ කොට්ඨාශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කර ඇත. නොවැම්බර් 09 වනදා සවස 04.00 ට ලද පණිවිඩයක් අනුව බන්ධනාගාර සිද්ධිය සම්බන්ධයෙන් විමශර්නයට එම ස්ථානයට ගොස් ඇත්තේ සවස 04.45 – 05.00 ත් අතර. එතැනට ගිය නමුත් බන්ධනාගාරය තුලට ඇතුලු වීමට හැකියාවක් ලැබී නැත. බන්ධනාගාරයේ කලහාකාරී තත්ත්වයක් පැවති අතර පසුදින අලුයම 04.00 වන තෙක් එතැන රැදී සිට ඇත. ජොෂ්ඨ නිලධාරීන් ගණනාවක් එතැන සිට ඇත. ඉන් පසුව විවේකය වාතර්ා කර නැවත පෙරවරු 06.30 ට බන්ධනාගාරය තුලට යාමට කටයුතු කර ඇත. බන්ධනාගාරය තුල වි.ක.බ, යුධ හමුදා, පොලිස් නිලධාරීන්ද සිට ඇති අතර සිවිල් ඇඳුමෙන් සිටි පුද්ගලයින්ද සිට ඇත. එදින හමුදාවෙන් සහ වි.කා.බ යෙන් ගිනි අවි භාර ගැනීමක් සිදු කර ඇත. ඊට අදාල ප්‍රකාශ සටහන් කර ගෙන ඇති නමුත් ජීවිත හානි සම්බන්ධයෙන් විමශර්නයක් සිදු කර නැත. ජීවිත හානි සම්බන්ධයෙන් විමශර්නය කිරීමට උපදෙස් නොලැබීම හේතුවෙන් විමශර්නයක් සිදු කර නැත. මීට අමතරව මරණ පරීක්ෂනයේදී බොරැල්ල පොලිසියට යම් සහායක් ලබා දී ඇත. ඒ හැර වෙන සාක්ෂි සටහන් කිරීමක් ඔහු සිදු කර නැත.

**<u>පැ.සා. 82 පූ.පො.ප.හරසිංහ ආරච්චි.</u>**

මොහු අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවට අනියුක්තව සේවය කර ඇති අතර වැලිකඩ සිද්ධිය සම්බන්ධයෙන් නම්බුවසම් කමිටුවේ නිදෙර්ශය මත මෙම සිද්ධිය විමශර්නය කිරීමට නැවත අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වන ලෙස උපදෙස් ලැබී ඇත. ඒ අනුව පොලිස්පතිගේ අධීක්ෂණය යටතේ අලුත් කණ්ඩායමක් විමශර්නය සඳහා පත් කර ඇත. එම කණ්ඩායමේ නායකත්වය මෙම සාක්ෂිකරු දරා ඇත. එසේ

2017.07.18 මෙම පරීක්ෂණ කටයුතු සඳහා නියෝග කරන අවස්ථාව වන විට මෙම සිද්ධිය සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාශය, බොරැල්ල පොලිසිය මෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින්ද සිදු කරන ලද පරීක්ෂණයන් පැවතිමින් තිබී ඇති අතර ඒ විමශර්නයන් සම්බන්ධයෙන් තොරතුරු කැඳවා පරික්ෂා කර ඇත. එම විමෂර්ණ අවසන් කර තිබුනේ නැති බව නිරීක්ෂණය කර ඇත.

හුදෙක් ප්‍රකාශ 3000 කට ආසන්න ප්‍රමාණයක් සටහන් කිරීම පමණක් සිදු වී ඇත. ඒ අනුව ලද උපදෙස් අනුව නව විමශර්නයක් ආරම්භ කර ඇත. එසේ වූවද පෙර සිදු කර ඇති විමශර්නයන් වලදී අනාවරණය වූ කරුණුද මෙම විමශර්නයට යොදා ගෙන ඇත. පරීක්ෂණ කමිටුවලට ලබා දී තිබූ සාක්ෂිද පරික්ෂා කර එහි හෙලිදරවු වී ඇති රැඳවියන් 15 දෙනෙකුගේ පමණ ප්‍රකාශ මෙම සාක්සිකරු සටහන් කරගෙන ඇත.

මීට අමතරව බන්ධනාගාර නිලධාරීන් වන කුඩා බණ්ඩා, නානායක්කාර, ගුණවධර්න ඇතුලු නිලධාරීන්ගෙන්ද, යුධ හමුදා නිලධාරීන්ගෙන්ද ප්‍රකාශ සටහන් කරගෙන ඇත. බන්ධනාගාර ජායාරූප ශිල්පියා විසින් ලබා ගත් ජායා රූප ඇතුලත් දත්ත ගබඩා කර තිබූ පරිඝණකය භාරයට ගෙන ඇත. මෙම නඩුවේ සැකකරුවන් වන එමිල් රංජන්, රංගජීව සහ ඉන්දික සම්පත් යන අයගේ ප්‍රකාශ ලබා ගත් නමුත් ඔවුන්ව අත් අඩංගුවට ගැනීමක් සිදු කර නැත. රංගජීව නැමැත්තාගේ දුරකතන ඇමතුම් විස්තර සහ කුළුනු වාතර්ා ලබා ගැනීමට කටයුතු කර ඇත. 2018.03.28 රංගජීව සහ ළමාහේවා යන 01 සහ 02 විත්තිකරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර 03 වන විත්තිකරු ඒ වන විට විදේශ ගත වී සිටි බැවින් අත් අඩංගුවට ගෙන නැත.

හරස් ප්‍රශ්න අතරතුරදී කුඩාබණ්ඩා යන අයගේ ප්‍රකාශ 04 ක් ලබා ගත් බවත්, 2012.11.10 වන දින කුඩාබණ්ඩා විසින් සිදු කරන ලදැයි සඳහන් ප්‍රකාශයක් සොයා බැලූ නමුත් එවැන්නක් සොයා ගැනීමට නොහැකි වී ඇත. තවද මෙම නැවත විමශර්නය සිද්ධියෙන් වසර 05 කට පසුව ආරම්භ කල බවත්, බන්දුල ලියනආරච්චි සහ ඉන්දික පෙරේරා යන අයගේ ප්‍රකාශ ඊට පෙර සටහන් කර තිබුනේ නැති බවත් පිලිගෙන ඇත. විත්තියෙන් යෝජනා කර ඇත්තේ 2012.12.01 දින යතුරුලියනය කරන ලද කුඩා බණ්ඩා යන අයගේ ප්‍රකාශය පො.ප ප්‍රේමතිලක විසින් එම ගොනුවෙන් ඉවත් කල බවය. සාක්ෂිකරු එවැන්නක් නොදන්නා බැවින් එය ප්‍රතික්ෂේප කර ඇත. මේජර් අල්විස් කෙනෙකු සම්බන්ධයෙන් විමශර්නය කල බවත් සුරේෂ් නන්දිමාල් යන අයගේ ප්‍රකාශය 2017.07.14 දින සටහන් කර ගත් බව පිලිගෙන ඇත.

**<u>පැ.සා. 84 පො.සැ 4697 නන්දලාල් යසරත්න.</u>**

මෙම සාක්ෂිකරු 2017 වසරේ විමශර්න කටයුත්තට සහාය වී ඇත. ප්‍රකාශ 40 ක් පමණ ඔහු සටහන් කරගෙන ඇත. ඒ අනුව සුදේශ් නන්දිමාල්, කුඩාබණ්ඩා, ලලිත් වසන්ත නානායක්කාර, දුෂ්‍යන්ත ගුණවර්ධන යන අයගේ ප්‍රකාශද සටහන් කර ගෙන ඇති අතර බන්ධනාගාර ජායාරූප ශිල්පියාගේ දත්ත සැපයුම් ඒකකය තම භාරයට ගෙන ඇත. මෙම පරිසනකය රජයේ රස පරීක්ෂක වෙත යොමු කර ඇත. පලවන විත්තිකරු රංගජීව යන අයගේ ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. එමිල් රංජන් ළමාහේවාගේ ප්‍රකාශයද සටහන් කර ගැනීමට සහාය වී ඇත. 01 සහ 02 විත්තිකරුවන් අධිකරණයේදී හදුනාගෙන ඇත. ඊට අමතරව යුධ හමුදාවෙන් අවි භාර ගැනීමක් මෙම විමශර්නයට අදාලව සිදු කර ඇත. හරස් ප්‍රශ්න අතරතුරදී කුඩා බණ්ඩාගේ ප්‍රකාශයක් සටහන් කර ගත් බවත් එම ප්‍රකාශය මත. වැඩිදුර විමශර්නයක් ඔහු සිදු කර නැති බවද ප්‍රකාශ කර ඇත. ඊට අමතරව බන්ධනාගාර නියාමකවරුන්ගේ ප්‍රකාශ සටහන් කර ගත් නමුත් වෙන් වෙන්ව ඒ අයගේ නම් මේ අවස්ථාවේ මතක නැති බව පිලිගෙන ඇත. විත්තියෙන් යෝජනාකර ඇත්තේ මෙම පරීක්ෂණය ඉතා පක්ෂග්‍රාහීව සිදු කල බවය. සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇත. තවද කොඩිප්පිලි යන අයගේ ප්‍රකාශය 2017.11.24 සටහන් කර ගත් බව පිලිගෙන ඇත. තමා විමශර්න කණ්ඩායමේ කණිෂ්ඨ නිලධාරියෙක් වූ බවත් විමශර්න භාර නිලධාරියාගේ උපදෙස් අනුව කටයුතු කල බවද සඳහන් කර ඇත.

**<u>පැ.සා.101 නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා.</u>**

මොහු මත්ද්‍රව්‍ය නාශක කාය‍ර්ංශයේ අධ්‍යක්ෂක වශයෙන් 2012.09.17 සිට දෙසැම්බර් මස 1 වැනිදා තෙක් කටයුතු කර ඇත. ඔහුගෙන් මූලිකව පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවා ඇත. විමශර්න සිදු කිරීම පැමිණිමේ සහ පිටවීමේ සටහන් යෙදීම සම්බන්ධයෙන් චක්‍රලේඛ රෙගුලාසි පොලිස් දෙපාතර්මේන්තුවේ ඇති අතර ඉන් පරිබාහිරව ක්‍රියා කිරිමට අවසරයක් කිසිවෙකුට ලබා දී නැති බව ඔහු ප්‍රකාශ කර ඇත. මත්ද්‍රව්‍ය ආවේශන රාජකාරි සිදු කිරීමේදී

විවිධ පාශර්වයන්ගේ අවධානයට ලක්වීම වැලැක්වීම සඳහා හෝ අසත්‍ය සටහන් යෙදීමට අවසරයක් ලබා දී නැති බව ඔහුගේ ස්ථාවරයයි. එසේ අසත්‍ය සටහන යෙදීමට අධ්‍යක්ෂක වශයෙන් අවසර දුන්නේ නැති බවත් මත්ද්‍රව්‍ය කායර්ංශයේ රථ භාවිතා කොට කොළඹ දිස්ත්‍රික්කයෙන් පිට ගමන් කරන්නේ නම් අවසරයක් ලබාගත යුතු බවත් හදිසියේ යාමට අවශ්‍ය නම් දුරකථන මගින් දැනුම් දීම සිදු කල හැකි බව ඔහු පැහැදිලි කර ඇත. හරස් ප්‍රශ්න අතරතුරදී මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධයෙන් තොරතුරු වෙලේසුදා නැමැති ජාවාරම්කරුට කායර්ංශයේ යම් නිලධාරියෙක් ලබාදුන් අවස්ථා ඇති බව පිලිගෙන ඇත. එවැනි දේ සිදු කල නිලධාරීන්ගේ නම් විත්තියෙන් යෝජනා කරන ලදුව ඔහු පිලිගෙන ඇත. 1 වැනි විත්තිකරුට මෙන්ම තව නිලධාරින්ට මරණ තජර්න තිබුන බව දැනගෙන ඇත. එසේම 1 වැනි විත්තිකරුට ඝාතනය කිරීමට උත්සාහයක් තිබුන බවද ඔහු පිලිගෙන ඇත.

<u>පොලිස් සාක්ෂිවල පිලිගත හැකි භාවය</u>

මෙම නඩුවේදී හෙලිදරව් වූ කරුණක් වන්නේ ඉතා දීඝර් කාලයක් විවිධ පොලිස් ස්ථාන සහ ඒකක මගින් මෙම විමශර්නය සිදු කර ඇති බවයි. ඒ අනුව මෙම සිදුවීම වූ 2012.11.10 වනදා බොරැල්ල පොලිස් ස්ථානයද, අපරාධ පරීක්ෂන දෙපාතර්මේන්තුවද, කොළම අපරාධ කොට්ඨාශයද විමශර්නය කිරීම සඳහා යොදවා ඇත. එසේ වුවද මෙම නඩුවේ පොලිස් සාකෂිකරුවන් පිලිගන්නා ආකාරයට විවිධාකාර ප්‍රකාශ එනම් බන්ධනාගාර යුධ හමුදා සහ පොලිස් නිලධාරීන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීමත් අනුසාංගික අනෙකුත් කරුණු එනම් ස්ථාන පරීක්ෂණ, සිදු වී ඇති අලාභාහානි, ගණනය කිරීම මෙම චෝදනාවන්ට අදාලව මියගිය රැදෙවියන්ට අමතරව තවත් මියගිය රැදෙවියන් ගණනාවකගේ මරණ පරීක්ෂණ කටයතු සිදු කිරිම මෙම අය විසින් සිදු කර ඇත. එම කටයුත්ත 2012 සිට 2017 දක්වා ඉතා මන්දගාමී ස්වරූපයකින් සිදු වී ඇති අතර කුමන හෝ හේතුවකට නිසි ආකාරයට විමරශනයක් සිදු වී නැති බව සාක්ෂිකරුවන් පිලිගන්නා අතර එය ඉදිරිපත් වූ සාක්ෂි පොදුවේ සලකා බැලීමේදීද මනාව ගම්‍ය වන කරුණක් වේ.

ඉන් පසුව 2017 වසරේදි පමණ මෙම විමශර්නය නැවත නව මුහුණුවරකින් විශේෂ උනන්දුවකින් සිදු වී ඇති බව සහ එසේ 2 වැනි වරට අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින් සිදු කල විමශර්නයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම අධිකරණයේ ඇති නඩු කටයුතු ගොනු වී ඇති බවද හෙලිදරව් වේ. පොලිස් නිලධාරින් ඍජුව පිලිගන්නේ නැති නමුත් විශේෂයෙන්ම කුඩා බණ්ඩා යන අයගේ

මෙන්ම පැ.සා. 4 ඉන්දික යන අයගේ සාක්ෂියෙන් හෙළිදරව් වන්නේ මුල් අවස්ථාවේ සිදු වූ දෙය සම්බන්ධයෙන් සත්‍ය හෙළිදරව් කිරීමට ඔවුන් මැලිවූ බවත් යම් බයක් හේතුකොට ගෙන එසේ වූ බවත්ය. එම සිද්ධියට මූලික වූ බන්ධනාගාර පරිශ්‍රය පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය ඒ අවස්ථාවේ සිටි යම් බලධාරින්ගේ තීරණ මත සිදු වී ඇති අතර එම තීරණය ගැනීමේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේදී ඉතා ඉහල බන්ධනාගාර නිලධාරීන් මෙන්ම යුද හමුදා සහ පොලිස් විශේෂ කායර් බලකායේ පිරිස්ද සම්බන්ධ වී ඇත. අදාල අමාත්‍යංශයේ ඉහල නිලධාරීන්ද මෙම තිරණ ගැනීමේදි මැදිහත් වී ඇති බව සාක්ෂියේදී හෙළිදරව් විය. එවැනි පසුබිමකදී මුල් අවස්ථාවේ සිදු කරන ලද පරීක්ෂණ කටයුතු ඇත්ත වශයෙන්ම සිදු කර ඇත්තේ එම සිද්ධියේදි අවස්ථාවෙන් ප්‍රයෝජනයට ගෙන යම් අපරාධමය කටයුත්තක් කරන ලද පුද්ගලයින් අනාවරණය කර ගැනීමට නොව තාක්ෂණික වශයෙන් විමශර්නයක් සිදු කල බව පමණක් හුවා දැක්වීමට බව මනාව ගම්‍ය වේ. මෙම කාරණාවට අදාලව මරණ පරීක්ෂණ කටයුතුද අවසන් කිරීම සඳහා වසර ගණනාවක් ගතකර තිබීම එය සනාථ කරන එක් කරුණකි. මෙසේ එක් පසෙකින් විමශර්නය නිසි ආකාරය සිදු නොකිරීමක් අනෙක් පසින් මෙම සිදුවීම ඇත්ත වශයෙන්ම දුටු අය එය නිවැරදිව හෙළිදරව් නොකිරීම ද සිදු වී ඇත. එය එසේ වූ අතර කුඩා බණ්ඩා, ඉන්දික යන අයගේ සාක්ෂියෙන්ද පොලිස් සාක්ෂියෙන්ද හෙළිදරව් වන ආකාරයට බලධාරීන්ගේ වෙනස් වීමකින් පසුව සහ ආණ්ඩු මාරුවකින් අනතුරුව මෙසේ 2 වැනි වතාවට අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව යම් උනන්දුවකින් මෙම විමශර්නය සිදු කර ඇති බව පෙනී යයි. ඉහත සිදුවීම් සහ සිද්ධි මාලාව සැලකිල්ලට ගැනීමේදී මෙසේ මුල අවස්ථාවේ සිට නිසි ආකාර විමරශනයක් සිදු නොවීම හේතුවෙන් යම් අගතියක් පැමණිල්ලට සිදු වී ඇති නමුත් එවැනි බරපතල බලපෑමක් විත්තියට සිදුවි නැත. කුමන හෝ හේතුවක් මත විමශර්නයක් නිසි ආකාරයව සිදු නොවීම මත හටගන්නා දුබලතාවයේ වාසිය විත්තියට ලබාදිය යුතුය.

ඉහත සඳහන් කල කරුණු සැලකිල්ලට ගනිමින් මෙම නඩුවේ විමශර්න කටයුතු සම්බන්ධව සාක්ෂි සලකා බැලීමේදී විත්තියට දැඩි අගතියක් සිදු වී නැති බව පෙනේ. මෙම නඩුවේ විමශර්නය විත්තියට අගතිදායි ලෙස සිදු කල බවට දැඩි ස්ථාවරයක්ද විත්තිය විසින් ගෙන නැත. පොලිස් නිලධාරින්ගේ සාක්ෂි වෙන් වෙන්ව සහ පොදුවේ ගත් කලද සැලකිය යුතු පරස්පරයක් හෝ නොගැලපීමක් මතු වන්නේද නැත. ඒ අනුව මෙම නඩුවේ පොලිස් සාක්ෂි වෙන් වෙන්ව සහ පොදුවේ

සලකා බැලීමේදි එකී සාක්ෂි විශ්වාසදායි සහ පිලිගත හැකි සාක්ෂි බව තීරණය කරනු ලැබේ.

**<u>වෛද්‍ය සාක්ෂි.</u>**

මේ අවස්ථාවේ කොණ්ඩ අමිල නැමැති මරණකරුට අදාල වෛද්‍ය සාක්ෂිය පමණක් සලකා බලනු ලබන අතර ඉදිරියේදී අවශ්‍යතාවය මතුවන්නේ නම් අනෙකුත් මරණකරුවන්ගේද පශ්චාත් මරණ පරීක්ෂණ වාතර්‍ා සම්බන්ධ සාක්ෂි සලකා බලනු ලැබේ.

මෙහි දෙවන විත්තිකරු වෙනුවෙන් වාචික සැල කිරීම් ඉදිරිපත් කිරීමේදී දේවමුල්ලගේ මලිත් සමීර පෙරේරා නොහොත් කොණ්ඩ අමිල යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාතර්‍ාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී. විභාගයේදී ඉදිරිපත් වූ සාක්ෂි අනුව ඉහත සඳහන් කොණ්ඩ අමිල යන අය මරණයට පත් කර ඇත්තේ, පෙ.ව.6.00 ට පමණය. කුඩාබණ්ඩා නමැති සාක්ෂිකරු සඳහන් කර ඇත්තේ, දෙවන විත්තිකරු සහ බන්ධානාගාර අනුබණ්ඩයේ සිටින යුධ හමුදා මේජවර්රයෙකු එල් ශාළාව තුල පෝලිම් ගස්සවා සිටි සිරකරුවන් සිටින ස්ථානය දෙසට ඇවිද ගිය අවස්ථාවේදී එම ස්ථානයේ වාඩිවී සිටි මෙම කොණ්ඩ අමිල නමැත්තාව දෙවන විත්තිකරු විසින් පෙන්වා සිටි බවයි. එවිට කොණ්ඩ අමිල නමැති අය නැගී සිටි අතර, දෙවන විත්තිකරු සහ හමුදා නිලධාරියා විසින් කොණ්ඩ අමිලව එතනින් රැගෙන ගොස් ඇත. ඒ වන විට පෙ.ව.6.00 ට පමණ බව සාක්ෂිකරු සඳහන් කර ඇත. නමුත් කොණ්ඩ අමිල යන අයව කුමන ස්ථානයකට රැගෙන ගියාද යන්න සාක්ෂිකරුට දැනීමක් තිබී නොමැත.

2012.11.10 දින එළිය වැටුණ පසු සාක්ෂිකරු බන්ධානාගාර පරිශ්‍රය පරීක්ෂා කරන අවස්ථාවේදී කොණ්ඩ අමිලගේ මෘතශරීරය වෙරලු ගහ යට තිබෙනු දැක ඇත.

පැ.47 ලෙස ලකුණු කර ඇති කොණ්ඩ අමිල නැමැත්තාගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාතර්‍ාවෙහි ආමාශයෙහි ජීණර්ය නොවූ බත් තිබෙන බවට සඳහන්ව ඇත.

අදාල පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කල වෛද්‍ය ප්‍රසන්න බණ්ඩාර දිසානායක මහතාගේ සාක්ෂියට අනුව ආමාශයෙහි ආහාර තිබීම මත පමණක් පිහිටා මරණය සිදු වූ වෙලාව නිගමනය කිරීම නිවැරදි ක්‍රමයක් නොවන බව පැහැදිලි වේ.

කුඩාබණ්ඩා යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව බන්ධානාගාර රැදවියන්ව සවස 5.00 ට වාට්ටු වලට ඇතල් කරන අතර එසේ වාට්ටුවලට දැමීමට පෙර ඔවුනට කෑම දෙනු ලබයි. නැවත කෑම දෙනු ලබන්නේ උදේ 6.00 ට එළියට ගත් පසුවය.

නමුත් 2009.11.09 දින ප.ව.1.35 පමණ වන විට විශේෂ කායර් බලකා නිලධාරීන් බන්ධනාගාරය තුලට ඇතුල් වී ඇත. එදිනම සවස 4.30 වන විට ආයුධ ගබඩාව කඩා සිරකරුවන් ආයුධ ලබාගෙන ඇති බවටද කරුණු තහවුරු වේ. තවද මෙම කුඩාබණ්ඩා යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව සිරකරුවන් ගිනිඅවි අතැතිව බන්ධනාගාර කුස්සියෙහි වහලයෙට සිටින අයුරු දැක ඇත. සිරකරුවන් විසින් ගඩොල් සහ උළු ආදියෙන් විශේෂ කායර් බලකා නිලධාරීන්ට පහරදීමට පටන් ගෙන ඇත.

තවද ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව ඒ වන විට බන්ධානාගාර කුස්සිය, ඩිස්පෙන්සරිය, දුරකථන හුවමාරුව, විනය අංශය, අතිරේක අධිකාරි කායර්ාලය ආදිය විනාශ කර තිබී ඇත. එසේම ඩිස්පෙන්සරිය කඩා මානසික ආබාධ වලට දෙන බෙහෙත් සිරකරුවන් විසින් රැගෙන යනු මෙම සාක්ෂිකරු විසින් දැක ඇත. තවද, විශේෂ කායර් බලකා නිලධාරීන් පිටව ගිය පසු සිරකරුවන් ආයුධ අතැතිව තමන්ට හිතුමනාප පරිදි ක්‍රියා කර ඇති බවද, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි මගින් තහවුරු වේ.

තවද පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබා දුන් අසරප්පුලිගේ ඉන්දික පෙරේරා නමැති අයගේ සාක්ෂියෙහිද සදහන් වනුයේ එදින සවස 5.00 ට පමණ තමන්ට කෑම නොලැබුනු බවයි. මෙම ඉන්දික පෙරේරා යන අය ඒ අවස්ථාවේදී සිරදඬුවම් විදිමින් සිටි අයෙකි.

ඉහත සියලු කරුණු සැලකීමේදී 2012.11.09 දින සුපුරුදු ක්‍රියාපටිපාටිය පරිදි සවස 5.00 ට සිරකරුවන් හට කෑම ලබා දීම සිදු කිරීමට හැකියාවක් තිබී නොමැති බව අපහසුවකින් තොරව නිගමනය කල හැකිය. එබැවින්, කොණ්ඩ අමිල නමැති අය බත් ආහාරය ලෙස ගෙන ඇත්තේ, සවස 5.00 ට නොව ඊට පසු කිසියම් අවස්ථාවකදී බවට අනුමිතියකට එලැඹීමට ප්‍රමාණවත් කරුණු ඇත.

ඉහත සිද්ධි සියල්ල සැලකීමේදී කොණ්ඩ අමිල නැමැති සිරකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාතර්ාවට අනුව ආමාශය තුල බත් තිබීම මත ඔහු අවසන්වරට ආහාර

ලබාගත් වේලාව නිශ්චිතව නිගමනය කල නොහැක. තවද ඉහත කරුණු සමස්තයක් ලෙස ගත්කල බන්ධනාගාරයේ දෛනික ක්‍රියාපටිපාටියට අනුව සිද්ධිය සිදු වූ දින සවස 5.00 ට සුපුරුදු පරිදි සිරකරුවන්ට ආහාර ලබාදීමට එදින අවස්ථාවක් තිබී නොමැති බව තහවුරු වේ. එබැවින් කොණ්ඩ අමිලගේ ආමාශයෙහි ආහාර තිබූ පමණින් මරණයට පත් වූ වේලාව නිගමනය කිරීමට නොහැකි බව පැහැදිලි වේ.

තවද විශේෂයෙන් සඳහන් කල යුතු වනුයේ, මෙම නඩුවට අදාල මියගිය අනිකුත් රැදවියන් වන මලින්ද නිලේන්ද්‍ර පැල්පොල (මාලන්), නිමර්ල අතපත්තු, තුෂාර චන්දන (කලු තුෂාර), රයිගමගේ සුසන්ත පෙරේරා යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාතර්ා පරීක්ෂා කිරීමේදී සඳහන් වනුයේ ඔවුන්ගේ ආමාශයෙහි කිසිවක් නොතිබූ බවයි.

තවද, මියගිය අනිකුත් රැදවියන් වන මොහොමඩ් විජේරෝහණ (ගුන්ඩු), අසරප්පුලිගේ ජෝතිපාල, හෂර් මංජු ශ්‍රී මනිකීතරී යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාතර්ාවන් අනුවද ඔවුන්ගේ ආමාශයන්හි නිරීක්ෂණ සඳහා යමක් තිබී නොමැත. මෙම මරණකරුවන් සියළු දෙනා රාත්‍රී 12.00ත් පසු දින පෙරවරු 4. 30ත් අතර ඝාතනය කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත.

එබැවින්, 2012.11.09 දින සවස 5.00 ට මෙම සිරකරුවන් හට ආහාර ලබා ගැනීමට අවස්ථාවක් තිබී නොමැති බව තවදුරටත් තහවුරු වේ. කලින් දින සවස 5.00 ට ලැබෙන ආහාර වේල නොලැබී ඇති අවස්ථාවක ගැටුම්කාරී තත්වය යම් දුරකට සමනය වූ පසු යම් ආහාරයක් සිරකරුවෙකු විසින් ලබා ගන්නට ඇති හැකියාව බැහැර කල නොහැක. පැමිණිල්ලේ සාක්ෂි අනුව 2012.11.10 දින පෙ.ව.6.00 පමණ වන විට කැරලිකාර තත්වය බොහෝදුරට පාලනය වී ඇත. එබැවින් මෙම කොණ්ඩ අමිල නමැති අයට ඒ අවස්ථාවේදී ආහාර ගැනීමට අවස්ථාවක් තිබී ඇති බව සාධාරණව නිගමනය කල හැක.

අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් දුන් සාක්ෂිය සැලකීමේදී ආමාශ තුල තිබූ ආහාර මත මරණය සිදු වූ වේලාව නිවැරදිව නිගමනය කිරීම කල නොහැකි වුවද, යමෙකු ගත් ආහාර සාමාන්‍ය තත්වය යටතේදී පැය හයකට පසු ආමාශයෙන් සම්පූණර්යෙන්ම බැහැර වන බව නිගමනය කල හැක. මෙහිදී 2 වන විත්තිකරු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද වාචික සැලකිරීම් වලදී අවධාරනය කර ඇත්තේ, සවස 5.00 ට ආහාර ලැබුණා නම්, කොණ්ඩ අමිල නමැති අය පසුදා උදේ 6.00 ට පමණ

රැගෙන ගොස් ඝාතනය කලේ යැයි යන කරුණ ඔහුගේ ආමාශයෙහි බත් තිබීම මත විය නොහැකි බවයි. නමුත්, කලින් සඳහන් කල කරුණු අනුව 2012.11.09 දින සවස 5.00 ට සිරකරුවන්ට ආහාර දිමට අවස්ථාවක් තිබී නොමැති හේතුව මත කොණ්ඩ අමිල නැමැති අය සවස 5.00 ට ආහාර ගෙන ඇතැයි යන්න නිගමනය කල නොහැක. එබැවින්, කොණ්ඩ අමිල යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන අවස්ථාවේදී ඔහුගේ ආමාශය තුල ජීර්ණය නොවූ බත් තිබීම මත ඔහු සවස 5.00 ට ආහාරගත් පසු පැය හයක් ගතවීමට පෙර මරණයට පත් වූ බවක්, නිගමනය කල නොහැක. තවදුරටත් පැහැදිලි කරන්නේ නම්, කොණ්ඩ අමිලගේ ආමාශය තුල බත් තිබීම මගින් කොණ්ඩ අමිල යන අයව උදේ 6.00 පමණ රැගෙන ගොස් ඝාතනය කලා යැයි යන සාක්ෂිය අසත්‍ය සාක්ෂියක් බවට කිසිවිටෙක නිගමනය කල නොහැක.

**<u>දූරකථන කුලුණු වාතර්ා.</u>**

072 212 2379 දරණ අංකයෙන් යුත් දූරකථන සම්බන්ධතාවය එටිසෙලාට් සමාගම විසින් මෙම නඩුවේ 1 වූදිත වෙත ලබාදෙන ලද දූරකථන සම්බන්ධතාවයක් බවත්, එම සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා 1 වූදිත විසින් ඔහුගේ අංක 731811156 V දරණ ජාතික හැඳුනුම්පතේ පිටපතක් අදාල දූරකථන සමාගම වෙත ලබාදුන් බවත්, ඉහත කී දූරකථන සම්බන්ධතාවය 2012.11.09 සහ 2012.11.10 යන දින වල 1 වූදිත විසින් භාවිත කල බවත්, පැ. 69 ලෙස සලකුණ කර ඉදිරිපත් කරන ලද දූරකථන විස්තර වාතර්ාවේ සඳහන් කරුණුත් විත්තිය විසින් පිලිගන්නා ලදුව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 420 වගන්තිය යටතේ පිලිගැනීම් ලෙස සලකුණු කර ඇත.

හච් ආයතනයේ විද්‍යුත් ජාල සැකසුම් පිලිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරු ලෙස සේවය කරන සසංග චාමර ගමගේ නැමති සාක්ෂිකරු සාක්ෂිදෙමින් පවසා ඇත්තේ හච් ආයතනය විසින් එටිසෙලාට් ආයතනය 2018 වසරේ දී අත්පත්කර ගත් බවත්, පැ. 69 දූරකථන විස්තර වාතර්ාව 072 2122379 දරණ දූරකථන සම්බන්ධතාවයට අදාල 2012.11.01 දින සිට 2012.12.01 දින දක්වා වූ දූරකථන විස්තර වාතර්ාව බවත්ය. එම වාතර්ාවේ සඳහන් දත්ත විස්තර කරමින් මෙම සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ එහි 6 වන තීරයේ අදාල දූරකථන ඇමතුම සම්බන්ධ වන කුලුණ

දක්වා ඇති බවත්, එවන් කුලුණකට ඇන්ටනා තුනක් සවිකර ඇති බවත්, කිසියම් දුරකථන ඇමතුමක් සම්බන්ධ වී ඇති ඇන්ටනාවද එහි සඳහන් වන බවත්ය.

මෙම සාක්ෂිකරු පැ. 69 දුරකථන විස්තර වාතර්ාවේ සඳහන් 2012.11.09 සහ 2012.11.10 දින වලට අදාල දුරකථන ඇමතුම් කිහිපයක් පිලිබඳව විස්තරාත්මකව සාක්ෂි දී ඇත. ඒ අතුරින් 2012.11.09 දින පැය 22.26 ට, පැය 22.30 ට, පැය 22.31 ට , පැය 22.33 ට, පැය 22.34 ට , පැය 22.55 ට, පැය 23, 21 ට, පැය 23.23 ට , 2012.11.10 දින පැය 00.06 ට, පැය 00.43 ට, පැය 1.10 ට සහ පැය 2.15 ට 1 වූදිතගේ ඉහත කී දුරකථන සම්බන්ධතාවය සමග සම්බන්ධ වී ඇති දුරකථන ඇමතුම් මැගසින් බන්ධනාගාරය ඉදිරිපිට මාගර්යේ සංඥා පහන් කණුව අසල පිහිටි ගොඩනැගිල්ලක සවිකර තිබූ කුලුණ හරහා සම්බන්ධ වී ඇති බව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

පැ. 70 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලද රූප සටහන ඇසුරෙන් කරුණු පැහැදිලි කරමින් මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ ඉහත කී කුලුණ මගින් බේස්ලයින් පාරේ දෙමටගොඩ දිශාවේ සිට බන්ධනාගාරය ඉදිරිපසින් බොරැල්ල හංදියේ මැද ප්‍රදේශය දක්වා වූ කලාපය ආවරණය වන බවයි. ඒ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කිරීමේදී මෙම අධිකරණයට එලඹිය හැකි අනුමිතිය වන්නේ 2012.11.09 දින පැය 22.26 සහ 2012.11.10 දින පැය 2.15 අතර කාලය තුල 1 වූදිත ඉහත කී කලාපය තුල සිටි බව පමණි. ඔහු එම කාලය තුල වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රය තුලම සිටි බවක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් නිශ්චිතව අනාවරණය නොවේ. අනෙක් අතට ඉහත කාලය තුල තමා නාලන්ද විදුහල අසල ස්ථානයක සිටි බවට 1 වූදිත ගෙන ඇති ස්ථාවරය බැහැර කිරීමේ හැකියාවක් ද මෙම සාක්ෂිය අනුව මෙම අධිකරණයට නැත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් අනාවරණය වන තවත් කරුණක් ඇත. එනම් 2012.11.10 දින පැය 3.25 ට ඩීන්ස් පාරේ පිහිටි කුලුණක් හරහා 1 වූදිතගේ දුරකථනය ඇමතුමකට සම්බන්ධ වී ඇති බවයි.ඒ සම්බන්ධයෙන් සාක්ෂි දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එම ඇමතුම වැලිකඩ බන්ධනාගාරය අසල සිටින තැනැත්තෙක් සන්තකයේ තබාගෙන සිටින දුරකථනයකින් නිකුත් වීමේ සම්භාවිතාව බෙහෙවින් අඩු බවයි. එසේ නම් 2012.11.10 දින පැය 3.25 වන විට 1 වූදිත වැලිකඩ බන්ධනාගාරය අසල නොවන වෙනත් ස්ථානයක සිට ඇති බවද පෙනේ.

ඉහත කරුණු සමස්තයක් ලෙස සැලකීමේදී පෙනී යන්නේ අදාල කාලය තුල 1 වූදිත වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රය තුලම සිටි බවක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් නිශ්චිතව තහවුරු නොවන බවයි.

**<u>ඡායාරූප සාක්ෂි:</u>**

**<u>පැ.සා 19 ගුණවර්ධන</u>**

මෙම සාක්ෂිකරු බන්ධනාගාරයට අනියුක්ත නිලධාරියෙක් වන අතර, 2011.11.10 වෙනිදා අළුයම 6.00 ට සේවයට වාතර්ා කර ඇත. කොමසාරිස් ජනරාල්ගෙන් ලද දැනුම් දීමටකට අනුව, ඡායාරූප ගත කිරීම සිදු කර ඇත. ඔහුට මෙම දැනුම් දීම ලැබී ඇත්තේ, උදේ 5.50 ට පමණ දුරකථනයෙන් වේ. ඒ අනුව, ඔහු එවකට නිතර භාවිතා කර කැමරාව භාවිතා කර උදැසන 7.30 පමණ වන විට ඡායාරූප ගැනීම සිදු කර ඇත. බන්ධනාගාරය තුල මියගොස් සිටි අය සහ අලාභ හානි වී තිබූ ස්ථාන ඇතුළු සිද්ධිය සම්බන්ධයෙන් ඡායාරූප 270 ක් පමණ ගෙන ඇත. ඉන් ඡායාරූප 34 ක් පැ.3 සිට පැ.37 වශයෙන් පැමිණිල්ලෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ඡායාරූප අතර උදැසන 7.37 සිට 7.47 දක්වා ගන්නා ලද ඡායාරූප පැ.5 සිට පැ.18 දක්වාද, ඉන්පසුව 8.59 සිට ප.ව 2.00 පමණ දක්වා ගන්නා ලද ඡායාරූප ලකුණු කර ඉදිරිපත් කර ඇති අනෙකුත් ඡායාරූප වේ. මෙම ඡායාරූප ගැනීමේදී සාක්ෂිකරු ඔහුගේ කැමරාව භාවිතා කර ඇත.

මුල් අවස්ථාවේ, මල සිරුරු ඡායාරූප ගත කර ඇති අතර, එසේ ඡායාරූප ගත කිරීමෙන් අනතුරුව, යම් මල සිරුරු කිහිපයක් මග හැරී තිබීම හේතුවෙන් නැවත වරක් සියලුම මල සිරුරු ඡායාරූප ගත කර ඇත. ඒ හේතුව මත උදැසන 7.37 සිට උදැසන 8.00 පමණ දක්වා අතර කාලයේ ඡායාරූප කිහිපයක්ද අනෙකුත් ඡායාරූප පෙරවරු 9.00 සිට පස්වරු 2.00 අතර කාලයේ ලබා ගන්නා ලද ඡායාරූප වශයෙන් ඉදිරිපත් කර ඇත. මෙම ඡායාරූප වලින් පැමිණිල්ල පෙන්වා සිටියේ උදේ වරුවේ මුල් අවස්ථාවේ මල සිරුරු අසල තුවක්කු නොතිබුනු නමුත්, පෙරවරු 9.00 න් පසුව ඡායාරූප ගත කල එම මල සිරුරු අසල ටී 56 තුවක්කු 4 ක් තිබීම වේ. විත්තිය විසින් මෙම ඡායාරූප වල සඳහන් වේලාවන් යම් වෙනසක් කර ඇති බව යෝජනා කර ඇත. යෝජනාව කිරීමේදී පදනම් කරගෙන ඇත්තේ, විත්තිය විසින් හරස් ප්‍රශ්න අතරතුර දී 1 වන විත්තිකරු වෙනුවෙන් 1 වී 3 සිට 1 වි 16 දක්වා ඡායාරූප 13 ක් ලකුණු කර ඇති

අතර, එම ඡායාරූප වල මරණ පරික්ෂණයට පැමිණි උගත් මහේස්ත්‍රාත්තුමිය දේහ පරික්ෂා කරන ඡායාරූප ඇතුලත් වේ. එම ඡායාරූප වල දේහයන්ට අනුරූපීව ඡායාරූපය ගත් වේලාව සමඟ උගත් මහේස්ත්‍රාත්තුමිය විසින් පිළියෙල කරන ලද මරණ පරික්ෂණ සටහන් සන්සංදනය කොට ඡායාරූප වල අනුපිළිවෙලත් උගත් මහේස්ත්‍රාත්තුමියගේ සටහන් වල අනුපිළිවෙලත් අතර නොගැලපීම් ඇත යන කාරණය මතු කර ඒ හේතුවෙන් මෙම ඡායාරූප වල වේලාවන් හබ කිරීමට විත්තිය උත්සාහ කර ඇත. මෙම කරුණ සලකා බැලීමේදී පෙනී යන්නේ උගත් මහේස්ත්‍රාත්තුමිය අපරාධ ස්ථානයේදී මල සිරුරු නිරීක්ෂණය කර ඇති නමුත් ඊට අදාල සටහන් යතුරු ලියනය කිරීමක් සිදු කරන ආකාරය කිසිදු ඡායාරූපයක දිස් නොවන බවය. ඉන් ගම්‍ය වන්නේ,උගත් මහේස්ත්‍රාත්තුමිය ස්ථානයේදී නිරීක්ෂණ සටහන් කර ගෙන මරණ පරික්ෂණ සටහන් පසුව යතුරු ලියනය කර ඇති බවයි. එසේ කිරීමේදී, උගත් මහේස්ත්‍රාත්තුමිය දේහයන් නිරීක්ෂණය කල අනුපිළිවෙලටම සටහන් යතුරු ලියනය කර නැති බව පෙනේ. ඒ අනුව, මෙම නොගැලපීම මතු වී ඇත. එසේ වුවද, ඡායාරූප වල කාල පරාසය සහ උගත් මහේස්ත්‍රාත්තුමියගේ සටහන් වල කාල පරාසය අතර කිසිදු පරස්පරයක් හෝ නොගැලපීමක් නැත. තවද පැ. 32 ඡායාරූපයේ දුරකථන කුටිය ඡායාරූපගත කර ඇත. එම ඡායාරූප ගත කිරිම පෙරවරු 7.27 සිදුකර ඇත. මෙම ඡායාරූපයේ දිස්වන කුටිය තුල බිත්ති ඔරලෝසුවක්ද දක්නට ඇත. එම ඔරලෝසුවේ වේලාව ලෙස සඳහන් වන්නේ 7.24 බව පෙනේ. එමගින්ද තහවුරු වන්නේ ඡායාරූපවල දිස්වෙන වේලාව ඇත්ත වශයෙන්ම ඒ අවස්ථාවේ පැවති වේලාව බවය. ඒ අනුව, මෙම ඡායාරූප වෙනස් කිරීමකින් තොරව, ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර ඇති බව තහවුරු වේ.

ඒ අනුව, මෙම ඡායාරූප ශිල්පියාගේ සාක්ෂිය පිළිගත හැකි සාක්ෂියක් බව තීරණය කරනු ලැබේ.

**<u>පැමිණිල්ලෙන් ඔප්පු කළ යුතු දේ.</u>**

මෙම අධි චෝදනා පත්‍රයෙහි 113 අ. වගන්තිය යටතේ වන කුමන්ත්‍රණය කිරීමේ චෝදනාවක් ඇත. එවන් චෝදනාවක් ඔප්පු කිරීම සඳහා මෙම විත්තිකරුවන් අතර එම චෝදනාවේ සඳහන් වරද සිදු කිරීමට අනුබල දීම හෝ අනුබල දීමේ පොදු අරමුණක් සහිතව කලින් සම්මතයක් ඇතිව හෝ නැතිව දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් එක්ව එම චෝදනාවේ සඳහන් පුද්ගලයින් තෝරා ගෙන ඔවුන්ගේ මරණය

සිදු කිරීම සඳහා ක්‍රියාකල බව ඔප්පු කල යුතුය. මෙවන් චෝදනාවක් ඔප්පු කිරීම සඳහා සියළුම අය එකට එක් අවස්ථාවක කුමන්ත්‍රණය කල බව හෝ සියළු දෙනාම එකිනෙකා සමග එක් අවස්ථාවක සාකච්ඡා කල බව ඔප්පු කිරීමේ අවශ්‍යතාවයක් නැත.

එසේම මෙම නඩුවේ දණ්ඩ නීති සංග්‍රහයේ 140 සහ 146 වගන්තිය යටතේ වන චෝදනාද ඇත. එනම් නීති විරෝධී රැස්වීමක සාමාජිකයෙකු වීම සහ එසේ සිටියදී යම් අපරාධයක් සිදු කිරීම වේ. මෙවන් චෝදනාවකදී මූලිකව යම් අපරාධයක් සිදු කිරීමේ පොදු අරමුණකින් යුතුව 5 දෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් ඒ සඳහා සහභාගි වී කටයුතු කල බව ඔප්පු කල යුතුවේ.

තවද දණ්ඩ නීති සංග්‍රහයේ 433 වගන්තිය යටතේ වන සාපරාධී අයුතු ඇතුළු වීමේ චෝදනාවක්ද ඇත. මෙම චෝදනාව ඔප්පු කිරීම සඳහා යම් වරදක් කිරීමේ අදහසින එනම් මෙම නඩුවේදී නිශ්චිත සිරකරුවන් පිරිසකගේ මරණය සිදු කිරීම සඳහා වැලිකඩ බන්ධනාගරයට ඇතුව වූ බව පැමිණිල්ල විසින් ඔප්පු කල යුතුවේ.

එසේම මෙම නඩුවේ දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය සමග කියවිය යුතු 296 වන වගන්නිය යටතේ වන චෝදනා ඔප්පු කිරීමට මිනී මැරීමේ පොදු චේතනාවකින්ම යුතුව විත්තිකරුවන් එක් එක් අය වෙන් වෙන්ව මරණකරුගේ මරණය සිදු කිරීමට සම්බන්ධ වූ බවත්, විත්තිකරුවෙකු හෝ වැඩිදෙනෙකු විසින් මිනී මැරීමේ චේතනාවකින්ම යුතුව සිදු කළ ක්‍රියාවකින්ම මරණකරුගේ මරණය සිදු වූ බවත්, එම මරණය සිදු වූ ක්‍රියාව සිදු කළ අවස්ථාවේ මිනී මැරීමේ චේතනාවෙන් යුතුව ක්‍රියාකාරීව එකාවන්ව එම පොදු චේතනාව බෙදා ගනිමින් එක් එක් විත්තිකරු කටයුතු කළ බව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුතු වේ.

එසේම දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය සමග කියවිය යුතු 355 වගන්තිය යටතේ වන චෝදනාවන් ඔප්පු කිරීම සඳහා චෝදනාවේ නම සඳහන් වින්දිත තැනැත්තාව යම් තැනකින් යාමට එම තැනැත්තාට බලහත්කාරකමින් බලකිරීමක් කල බව හෝ යම් වංචා සහගත ක්‍රමයක් මගින් හෝ බලය අනිසි ලෙස පාවිච්චි කරමින් හෝ වෙනත් බලකිරීමේ මාගර්යකින් එකී වින්දිත තැනැත්තා පෙළඹවූ බවත් එසේ රැගෙන ගිය තැනැත්තාගේ මරණය පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායකට භාජනය විය හැකි ලෙස දැමීම සඳහා පොදු චේතනාවකින්ම යුතුව විත්තිකරුවන් එක් එක් අය වෙන් වෙන්ව එසේ රැගෙන ගිය

බව පැමිණිල්ලෙන් ඔප්පු කල යුතු වේ. මෙසේ පැහැර ගැනීමේ පොදු චේතනාවෙන් යුතුව ක්‍රියාකාරීව එකාවන්ව එම පොදු චේතනාව බෙදා ගනිමින් එක් එක් විත්තිකරු කටයුතු කළ බව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුතු වේ.

<u>පැමිණිල්ල ප්‍රබල නඩුවක් ගොඩනගා ඇත්දැයි සළකා බැලීම.</u>

මෙම නඩුවේ 1 සහ 2 විත්තිකරුවන් දෙදෙනාට එරෙහිව ඉහත සාක්ෂි මත චෝදනා සම්බන්ධයෙන් ප්‍රබල නඩුවක් ගොඩනගා ඇත්ද යන්න අප දැන් සලකා බලනු ලැබේ. ඉහත සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුසාරයෙන් කිසිදු හබයකින් තොරව 2012.11.10 වන දින අළුයම කාලයේ එනම් මධ්‍යම රාත්‍රී 12.00 ත් පෙවරු 6.30 ත් අතර මෙම චෝදනාවන්හි නම් සඳහන් මරණකරුවන් පැහැරගෙන යාමත්, ඝාතනයට ලක්වී සිට සොයා ගැනීමත් සිදුවී ඇති බවට සාක්ෂි හෙළිදරව් වී ඇත. පැ.සා. 2 කුඩා බණ්ඩා යන අයගේ සාක්ෂියෙන් සහ පැ.සා 3 ලියනාරච්චි යන අය මෙන්ම පැ.සා 4 ඉන්ධික යන අයගේ සාක්ෂිද පොදු වේ ගත් කල මාලන්, පොන්න කපිල සහ මංජුශ්‍රී යන මරණකරුවන් තිදෙනා අළුයම 4. 30 ට පමණ සිවිල් ඇඳුමෙන් සැරසුන දෙදෙනකු සහ එදින මෙම මෙහෙයුමට පැමිණි හමුදා නිල ඇඳුමෙන් සිටි කිහිප දෙනකු සමග රැගෙන ගිය බවට සාක්ෂි හෙළිදරව් වී ඇත.

ඊට සුළු වේලාවකට පසුව ඔවුන්ගේ මල සිරුරු එක් ස්ථානයක තිබී හමුවී ඇති. වෛද්‍ය සාක්ෂියට අනුව ඔවුන් තිදෙනාගේම මරණයන් සිදුවී ඇත්තේ ගිනි අවියකින් නිකුත් වූ වෙඩි පහරකට ලක්වීම මගින් බව තහවුරු වී ඇත. මේ ආකාරයටම කළු තුෂාර යන අයද එච්. වාට්ටුවේ සිටියදී හමුදා ඇඳුමෙන් සැරදුන අය රැගෙන ගිය බවත් එසේ රැගෙන යාමෙන් අනතුරුව ඒ දෙසින් කෑගසන හඩක් සහ වෙඩි තබන හඩක් ඇසුන බව ට සාක්ෂි ඇත. ඊට අමතරව සුසන්ත පෙරේරා නොහොත් මාල සුසන්ත යන අයව 10 වැනිදා එළිවන්නට එනම් 10 වැනිදා අළුයම 12.00 ත් 1. 30 ත් අතර හමුදා ඇඳුමෙන් සැරසුන අය සමග පැමිණි 1 වන විත්තිකරු රැගෙන ගිය බවත් පසුව මියගොස් සිටි බවටත් පැ.සා 3 ලියානාරච්චි සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

මාලන්, පොන්නකපිල සහ මංජුශ්‍රී තිදෙනාව රැගෙන යාමට කටයුතු කලේ 1 වන විත්තිකරු බවට කුඩා බණ්ඩාගේ සාක්ෂියේද සඳහන් වේ . මීට අමතරව කුඩා

බන්ඩාගේ සාක්ෂියෙන් හෙළිදරව් වන අනෙක් කාරණය වන්නේ සමීර පෙරේරා නොහොත් කොණ්ඩ අමිල යන අයව 2 වැනි විත්තිකරු හමුදාමේජර් වරයෙක්ද සමග පැමිණ 10 වැනිදා 5.55ටත් 6.15ටත් අතර වේලාවකදී රැගෙන ගිය බවය. ඊට සුළු වේලාවකට පසුව ඔහුද මියගොස් සිට වෙරළු ගසක් අසලදී සොයා ගෙන ඇත. මෙම මරණකරුවන් 8 දෙනාම 10 වැනිදා උදෑසන වන විට වෙඩි වැදීමකට ලක්ව වෙඩි වැදීමේ හේතුවෙන්ම මරනයට පත්වී ඇති බවට වෛද්‍ය සාකෂි මගින් තහවුරු වී ඇත. එපමණක් නොව එම තුවාල පිහිටි ස්ථාන තුවාලවල ස්වභාවය අනුව පොදු වේ ගත්කල යම් ඒකාකාරී ස්වභාවයක් එනම් හිස බෙල්ල පපුව ආශ්‍රිතව ක්ෂණිකයකින් මරනය ගෙන දෙන ස්ථාන ඉලක්ක කර ගෙන වෙඩි තැබීම සිදු කර ඇති බවත් ඔවුන් වැටී සිටි සථාන අසල ලේ විසිවී ඇති ආකාරයක් සමග සලකා බැලීමේදී දුර සිට අහඹු ලෙස වෙඩි වැදීමකින් නොව යම් ආසන්නයක සිට ඉලක්කගත කොට වෙඩි තැබීමකින්ම මෙම අයගේ මරණයන් සිදු වී ඇති බව ප්‍රබල ලෙස තහවුරු වන සාක්ෂි විශේෂයෙන්ම වෛද්‍ය සාක්ෂි තුලින් හෙළිදරව් වේ. ඒ අනුව මෙම මරණකරුවන් 8 දෙනාගේම මරණ චෝදනාවන්හි සඳහන් ආකාරයට 2012.11.10 වල දා සිදු වී ඇති බවට ප්‍රබල සාක්ෂි හෙළිදරව් වී ඇත.

09 වන දා බන්ධනාගාරය තුල සෝදිසි මෙහෙයුමක් බන්ධනාගාරය භාර අමාත්‍යංශය ආරක්ෂක ලේකම් පොලීසිය, මෙන්ම බන්ධනාගාර කොමසාරිසගේ සාකච්ඡාවලින් අනතුරුව සැලසුම් කර ඇත. එම සැලසුමේදි කුමන ආකාරයට පරීක්ෂාවට ලක්කරන්නේ දැයි ය කරුණ සම්බන්ධවය පොදු එකගත්වයක් තිබී නැති බවද සාක්ෂියෙන් හෙළිදරව් වී ඇත. එසේ වුවද මෙම බන්ධනාගාරය පරීක්ෂා කිරීමේදී වි.කා. බ නිලදාරීන් සහභාගි කරවා ගැනීමට එකගත්වයක් තිබී ඇති අතර කුමන බන්ධනාගාර වාට්ටු කුමන ආකාරයට සිදු කරන්නේ ද සම්බන්ධයෙන් බන්ධනාගාර නිලධාරීන් සමග පොදු එකගත්වයක් තිබී නැත. එසේ වුවද 09 වන දා දහවල් 1.30 පමණ වන විට වි.කා.බ බලඇනියක් මෙම කටයුත්තට බන්ධනාගරය ඇතුලට පැමිණ ඇත. මෙම පැමිණීම සහ සෝදිසි සිදු කරන ආකාරය ගැන එම අවස්ථාවේ වැලිකඩ බන්ධානාගරයේ කටයුතු භාරව සිටි කුඩා බණ්ඩා යන සාක්ෂිකරුටද පැහැදිලි අවබෝධයක් තිබි නැත. එය එසේ වුවද මෙම සෝදිසි මෙහෙයුම චැපැල් වාට්ටුව නැමැති බරපතල සනයේ රැදෙවියන් සිටින කොටසේ සිදු කිරීමට යාමත් සමග යම් කලබලකාරි තත්වයක් උද්ගතව ඇත. එහිදි රැදෙවියන් ගල් මුල් වතුර බෝතල් ආදියෙන් ප්‍රහාර එල්ලකර ඇති අතර වි.කා.බ. නිලධාරීන් කඳුළු

ගැස් පාවිච්චි කර පසුව එක්තරා අවස්ථාවකදී පසුබැස ඇත. මේ වන විට රැදෙවියන් පිරිසක් බන්ධනාගාරයේ අවි ගබඩාවෙන් ගිනි අවි ගෙන ඇති අතර ඔවුන් බන්ධනාගාර කුස්සියේ වහලය මතට නැගී යම් කලහකාරී ආකාරයට ක්‍රියා කර ඇත. ඉන් පසුව යුධ හමුදා බලඅැනියක් බන්ධනාගාරය පරිශ්‍රය තුලට පැමිණ තත්වය පාලනය කිරීමට ක්‍රියා කර ඇත. 09 වනදා මධයම රාත්‍රිය වන විට බන්ධනාගරය තුල යුධ හමුදාව පැමිණීමෙන් අනතුරුව පාලනය හමුදාව යටතට ගෙන ඇති බව සාක්ෂිවලින් හෙළිදරව් වේ. ඉන් අනතරුව සිවිල් ඇඳුමෙන් සැරසරුන දෙදෙනෙකු හෝ තිදෙනෙකු බන්ධනාගාරය තුලට පැමිණ පොන්න කපිල, මංජුශ්‍රී සහ මාලන්, යන අය අළුයම කාලයේදීද නිමර්ල අතපත්තු , ගුණ්ඩු සහ සුසන්ත යන තිදෙනා 12.00ත් 1.30 අතර පැහැර ගෙන යාමට කටයුතු කර ඇත. මෙම අය රඳවා සිටි ස්ථානයට පැහැරගෙන යාමට පැමිණි පුද්ගලයන්, ඔවුන්ව තෝරා ගත් ආකාරය තුලින් හෙළිදරව් වන්නේ කිසියම් හෝ සැලසුමකට අනුව මෙ රැදෙවියන්ව හඳුනා ගෙන රැගෙන යාමට සිවිල් ඇඳුමන් පැමිනි පුද්ගලයින් කටයුතු කල බවත් ඊට හමුදා ඇඳුමෙන් සිටි පිරිසකගේ ක්‍රියාකාරී සහායද ලැබී ඇති බවත්ය . මෙසේ රැගෙන ගිය අය සියළු දෙනා එක සමාන ආකාරයකට මියගොස් සිටි ඇත.

මෙම සාක්ෂි පොදුවේ ගත්කල ගම්‍ය වන්නේ ඉහත නම් සඳහන් මරණකරුවන් 7 දෙනා (කොණ්ඩ අමිල හැර) පිටතින් පැමිණි සිවිල් ඇඳුමෙන් සිටි අය සහ යම් හමුදා ඇඳුමෙන් සිටි අයගේ එකගත්වයෙන් සහ සහයෝගය ඇතිව රැගෙන ගිය බවය. මෙම පිරිස පස්දෙනෙකුට වඩා වැඩි බව සාක්ෂි තුලින් හෙළිදරව් වී ඇත. ඒ අනුව මෙම සාක්ෂි වලින් සහ පරිවේශනයන්ගෙන් ප්‍රබල ලෙස ගම්‍ය වන්නේ එම පිරිස තෝරා ගත යම් සිරකරුවන් පිරිසකගේ මරණය සිදු කිරීමට හෝ එම වරදට අනුබල දීමට හෝ එක්ව පොදු අරමුණක් සහිතව ක්‍රියා කිරීමට එකග වීමක් ඇතිව කටයුතු කර ඇති බවත් එසේ කටයුතු කර ඇත්තේ එම අයගේ මරණයන් සිදු කිරීමේ චේතනාවෙන් බවත්ය.

එසේ රැගෙන ගිය අය මෙම 7 දෙනාගේ මරණයන් සිදු කර ඇති බවත් එම මරණ පිටතින් පැමිණි සිවිල් ඇඳුමෙන් සැරසුන අය සහ හමුදා ඇඳුමෙන් සිටි අය එකාවන්ව එක්ව මිනී මැරීමේ පොදු චේතනාවෙන් සිදු කර ඇති බවද මෙම සාක්ෂි මගින් ප්‍රබල ලෙස ගම්‍ය වේ.

එපමණක්ද නොව මෙසේ මරණකරුවන් 7 දෙනා පිටතින් පැමිනි සිවිල් පිරිස ප්‍රමුඛව පැහැර ගෙන ගොස් ඇති බව සාක්ෂි තුලින් ප්‍රබල ලෙස තහවුරු වී ඇත. ඒ අනුව පැමිණිල්ලේ සාක්ෂි මේ අවස්ථාවේ සලකා බැලීමේදී බන්ධනාගරය තුල සිදු වන විවිධ දූෂණ සහ අකටයුතු මැඩලීමට බලධාරීන් විසින් සෝදිසි මෙහෙයුමක් දියත් කර ඇති අතර එහිදි උද්ගත වූ කලබලකාරී තත්වය ප්‍රයෝජනයට ගෙන බාහිරෙන් පැමිණි තිදෙනෙකු සම්බන්ධ වී හමුදා ඇඳුමෙන් සිටි පිරිසකගේද සහාය ඇතිව මෙම මරණකරුවන් 7 දෙනා එනම්, මාලන්, නිමර්ල අතපත්තු, ගුණ්ඩු, කළුතුෂාර, පොන්න කපිල සහ මංජුශ්‍රී යන අයගේ මරණයන් සිදු කර ඇති බවට ප්‍රබල සාක්ෂි පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති බවට මෙම අධිකරණය සෑහීමට පත්වේ.ඒ අනුව 1 සිට 24 සහ 26 සිට 32 දක්වා වන චෝදනාවන්ට අදාල සිදුවීම් යම් පිරිසක් විසින් සිදුකර ඇති බවට ප්‍රබල සාක්ෂි ඉදිරිපත් වී ඇත.

එසේ වුවද එම ක්‍රියාවන්ට 1 වැනි සහ 2 විත්තිකරුවන් සම්බන්ධ වූයේද යන්න සම්බන්ධයෙන් සාක්ෂි තිබේදැයි දැන් සලකා බලනු ලැබේ. පලමුව ඉහත අපරාධයන් සිදු කිරීමේදී 1 වනි විත්තිකරු ඊට සහභාගි වූයේද යන්න සම්බන්ධනේ සහ ඔහුගේ හඳුනා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ සාක්ෂි සලකා බැලිය යුතු වේ. එනම් පැමිණිල්ල විසින් එම අවස්ථාවේ 1 වැනි විත්තිකරුම ඊට සහභාගි වී ඇති බවට සාධාරන සැකයෙන් ඔබ්බට ඔප්පු කල යුතුය. එබැවින් පැමිණිල්ල විසින් 1 වන විත්තිකරුගේ හඳුනා ගැනීම සම්බන්ධයෙන් ප්‍රබල නඩුවක් ගොඩනගා තිබිය යුතුය. පැ.සා. 2, පැසා 3, සහ පැ.සා 4, මෙකී මරණ 7 සම්බන්ධයන් 1 වන විත්තිකරු සහභාගි වූ බවට අධිකරණයේදී හඳුනාගෙන ඇත. එනම් මෙම නඩුවේ 1 වන විත්තිකරුව විත්තිකූඩුවේ සිටියදී හඳුනා ගැනීමක් සිදු කර ඇත. මෙම සාක්ෂිකරුවන් විසින් සිදු කර ඇති මෙම හඳුනා ගැනීම මත විශ්වාසය තැබීම ආරක්ෂිත දැයි දැන් සලකා බලනු ලැබේ. පැ.සා. 2 කුඩා බණ්ඩාගේ සාක්ෂියට අනුව 1 වන විත්තිකරුව ඔහු මෙම සිද්ධියට පෙර දැක තිබූ අයෙකු නොවේ. ඔහු 2012 සිට 2015 දක්වා 1 වන විත්තිකරු ගැන කිසිදු සඳහනක් කරන්නේ ද නැත.

එසේ සිදු නොකිරීමට සාධාරණ හේතුවක් ඉදිරිපත් කර ඇත. එවන් අවස්තාවකදී ප්‍රමාදයකට යටත්ව කරන ලද හෙලිදරව්වක් මත කටයුතු කිරීමට නීත්‍යානුකූල හැකියාවක් ඇත. මෙම නඩුවේදී පැ.සා 2 ගේ සාක්ෂිය 1 වන විත්කිකරු හඳුනා ගැනීම සම්බන්ධයෙන් සලකා බැලීමට ඉතිරිව ඇත්තේ සිද්ධියට වසර 09 කට පමණ පසුව විත්තිකූඩුවේ සිට කරනු ලබන හඳුනා ගැනීමකි. තමා මෙම සිද්ධියට

පෙර කිසි අවස්ථාවක දැක නැති අයෙකු කාලයක් ගතවීමෙන් අනතුරුව විත්තිකූඩුවේ සිට හඳුනා ගැනීම මත විශ්වාසය තබන්නේ නම් එය සුපරීක්ෂාකාරිව සලකා බැලිය යුතුය. මෙම අධිකරණයේ සාක්ෂි දෙමින් 1 වන විත්තිකරුගේ රූප ස්වභාවය කිසියම් හෝ ප්‍රසිද්ධ චරිතයකට සමාන අංග ලක්ෂණ පවතින බවක් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී. එය එසේ වුවද එම සුවිශේෂි භාවයත් තිබීම යන කරුණ 2015 න් පසුව සාක්ෂිකරු විවිධ කමිටු සහ පොලිස් ප්‍රකාශ වල සඳහන් කර නොමැති බවට බවට ඌනතාවයක් මතු කර ඇත. මින් මතුවන 2 වන කාරණාව වන්නේ මේ හා සමාන රුව ඇති පුද්ගලයින් කිහිපදෙනෙකු සිටීමට ඇති හැකියාව වේ.

මෙම පසුබිම යටතේ යම් අකාරයට දුවර්ල ආලෝක තත්වයන් යටතේ ඉතා කෙටි වේලාවක් තුල කරන ලද නිරීක්ෂණයන් මත වසර 9 කට පසුව අධිකරණයේ විත්තිකූඩුවේදී විත්තිකරුවෙකු හඳුනා ගැනීම මත විශ්වාසය තබා කටයුතු කිරීම ප්‍රවේශම්සහගත නොවන සහ අනාරක්ෂිත බව පිලිගත් නීති සිද්ධාන්තයයි. ඒ අනුව පැ.සා. 1 විසින් සද්භාවයෙන් වුවද මෙම අධිකරණයේ ඔහු දුටු පුද්ගලයා 1 වන විත්තිකරු බවට හඳුනාගෙන පෙන්වා සිටියේ වුවද ඉහත හේතු මත මෙවන් අපරාද නඩුවකදී 2012.11.10 වනදා රාත්‍රියේ පැ.සා 1 විසින් දුටු පුද්ගලයා මෙම 1 වන විත්තිකරුම බවට එකී සාක්ෂිය මත තීරණය කිරීම අනාරක්ෂිත බව අපගේ තීරණය වේ.

පැ.සා 4 ඉන්ධික පෙරේරා විසින් පොන්න කපිල යන අය රැගෙන ගියේ 1 වන විත්තිකරු බවට අධිකරණයේ හඳුනා ගෙන ඇත. 1 වන විත්තිකරු මෙම සිද්ධියට පෙර 1 විත්තිකරුව ඔහු දැක ඇති සහ හඳුනන අයෙකු වශයෙන් ස්ථිර සාක්ෂියක් ඉදිරිපත් වී නැත. මුල් අවස්ථාවේ 2015 ට පෙර 1 වන විත්තිකරු ගැන සඳහන් කිරීමක් කර නැති අතර ඉන් පසුව ඔහුගේ මුල් ප්‍රකාශයේ සහ නම්බුවසම් කමිටුවට දුන් සාක්ෂියේදි සිද්ධිය සිදු වූ දින 1 වැනි විත්තිකරු හඳුනා ගැනීමට පාදක වූ කරුණු හෙලිදරව් කර නැත. එනම් කපිල යන අය රැගෙන යන අවස්ථාවේ ඔහු සඳහන් කල දෙය වන රංගජීව මහත්තයා අපිට එලියේ ඉන්න දෙන්නෙත් නැහැ. ඇතුලේ ඉන්න දෙන්නෙත් නැහැ යන කොටස මෙසේ ඌණතාවක් බවට මතුකර ඇත. මෙම ඌනතාවය සැලකිල්ලට ගැනීමේදී 1 වන විත්තිකරු එදින රාත්‍රියේ හඳුනා ගැනීම ඉවහල් වු ප්‍රබලතම කරුණ ඌනතාවයකට ලක්වීමෙන් එම කරුණ යම් අකාරයකට දුවර්ලවීමක් සිදුවී ඇත. එදින අළුයම යම් ආකාරයකට අඳුරු ස්වභාවයක් තිබී ඇත. ඒ අනුව මෙම සාක්ෂිකරුගේ හෙලිදරව් කිරීම ප්‍රමාදයකට යටත්ව සිදුවී

තිබීම මෙන්ම එවැනි පසුබිමකදී ඉන් පෙර දැක නැති අයෙකු වසර 9 කට පසුව විත්තිකූඩුවේ සිට හඳුනා ගැනීම මත විශ්වාසය තබා කටයුතු කිරීම අනාරක්ෂිත කරුණක් වේ. පැ.සා. 3 ලියනාරච්චි යන අය 1 වැනි විත්තිකරු 10 වැනිදා අළුයම 12.00 ත් 1.30 අතර නිමර්ල අතපත්තු, ගුණ්ඩු සහ මාලසුසන්ත යන අය තෝරා ගෙන රැගෙන යනු දුටු බව සඳහන් කරයි. 1 වැනි විත්තිකරුව සාක්ෂිකරු ඊට පෙර මංගල උත්සවයකදී 2004 වසරේ දුටු බව සඳහන් කරයි. එසේ වුවද 2015 වසරේ නම්බුවසම් කමිටුවේ සාක්ෂි දෙමින් එදින සිවිල් ඇඳුමෙන් පැමිණි කිසිවෙකු ඊට පෙර දැක නැති බව ප්‍රකාශ කර ඇති අතර එය පරස්පරයක් ලෙස මතුකර ඇත. මෙම සාක්ෂිකරුද සිද්ධියෙන් වසර 7 කට පෙර එනම් උත්සවයකදී අහඹු ලෙස දුටු අයෙකු මෙම චෝදනාවන්ට අදාල සිදුවීම සිදුවී වසර 9කට පසුව විත්තිකූඩුවේ සිට හඳුනා ගැනීමක් කර ඇත. එම හඳුනා ගැනීම සම්බන්ධයෙන් පරස්පරයක් මතුවී ඇත. සිද්ධිය සිදු වූ දින තරමක් අඳුරු ආලෝක තත්වයන් යටතේ මෙම හඳුනා ගැනීම සිදු වී ඇත. මෙම පරිවේශනයන් පොදුවේ සලකා බැලීමේදී මෙම සාක්ෂිකරු 10 වනදා දුටු අය විත්තිකූඩුවේ සිටින 1 වන විත්තිකරුම බවට දෙන ලද සාක්ෂිය මත විශ්වාසය තබා කටයුතු කිරීම අනාරක්ෂිත බව අපගේ තීරණය වේ. ඊට අමතරව නන්දිමාල් නැමැති සාක්ෂිකරුද 1 වන විත්තිකරු එදින රාත්‍රියේ පැමිනි අය බවට හඳුනා ගෙන ඇති නමුත් එම සාක්ෂිකරුගේ සාක්ෂියේ ඇති කලින් සඳහන් කරන ලද දුවර්ලතාවයන් හේතුවෙන් එම හඳුනා ගැනීමද සලකා බැලීමේ නීත්‍යානුකූල හැකියාවක් නැත.

ඒ අනුව 1 වන විත්තිකරු 10 වන දින බන්ධනාගාරයට පැමිනි පුද්ගලයාම බවට හඳුනා ගැනීමට යෙදුන සාක්ෂිකරුවන් සියළු දෙනාගේම එකී හඳුනා ගැනීමේ දුවර්ලතාවයන් මතුවී ඇත. මෙසේ වෙන් වෙන්ව සලකා බැලීමේදී හඳුනා ගැනීම දුවර්ල වන අවස්තාවකදී එවැනි දුවර්ල සාක්ෂි ගණනාවක් ඉදිරිපත් වන විට එකී දුබලතාවය ඒ අකාරයෙන්ම පොදුවේද පවතින කරුණක් වේ. ඒ අනුව මෙම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වෙන් වෙන්ව මෙන්ම පොදු වේ සලකා බැලීමේදි 1 වැනි විත්තිකරුගේ හඳුනා ගැනීම සම්බන්ධයෙන් පවතින දුවර්ලතාවය ඒ ආකාරයනේම පවතින බව සඳහන කල යුතුය.

මෙම නඩුවේදී 1 වන විත්තිකරුගේ දුරකථන කුළුනු වාතර්‍රා විස්තර ඉදිරිපත් වී ඇත. එම සාක්ෂිවලින් උපරිම වශයෙන් පැමිණිල්ලේ වාසියට සලකා බැලුවේ වුවද තහවුරු වන්නේ මෙම 1 විත්තිකරුගේ ජංගම දුරකථනය 2012.11.09 වන දා රාත්‍රී

10.26 සිට පසුදින එනම් 2012.11.10 දින අළුයම 2.15 අතර වැලිකඩ බන්ධනාගරය අවට තිබී ඇති බවය. 1 වැනි විත්තිකරු සන්තකයේ එම දුරකථය තිබුන බවද පිලිගෙන ඇත. මෙම සාක්ෂියෙන් උපරිම වශයෙන් තහුවුරු වන්නේ සහ ඔප්පු කල හැකි වන්නේ 1 වැනි විත්තිකරු එදින මෙම වැලිකඩ ආසන්නයේ සිටි බව පමණි. අප ඉන් ඔබ්බට ගොස් 1 වැනි විත්තිකරු එදින වැලිකඩ බන්ධනාගාරය තුල සිටි බවට මෙම දුරකථන විස්තර සාක්ෂිය අනුව සලකා බැලුවේ වුවද එමගින් විත්තිකරු මෙම චෝදනාවන්හි නම් සඳහන් පෙර කී මරණකරුවන් 7 දෙනාගේ පැහැරගෙන යාමට සම්බන්ධ වූ බවට එනයින්ම අනුමිතියකට එලඹීමට නොහැක. එනම් මෙම මරණයන් සිදුවූ සිද්ධිය සහ සිද්ධි මාලාව ඉතා සංකීණර් සිද්ධි මාලාවක් වේ. එහිදි විශාල පිරිසක් ඊට සම්බන්ධ වී ඇත. එවන් පසුබිමක දී 1 වැනි විත්තිකරු වැලිකඩ බන්ධනාගාරය අවට ප්‍රදේශයේ සිටි බවට ඔප්පු වූ පමණින් ඔහු මෙම බන්ධනාගාරය තුල සිදු වූ මරණ වලට සම්බන්ධ වූ බවට ඒකායන ලෙස අනුමිතියකට එළඹිය නොහැක. ඒ අනුව අමතර සාක්ෂියක් වන දුරකථන විස්තර සමග ඉහත සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සලකා බැලුවේ වුවද ඒකායන ලෙස එමගින් මෙම 1 වන විත්තිකරු මෙම අපරාධයන් සිදුකල පුද්ගලයා ලෙසට ප්‍රබල අනුමිතියකට එලඹීමට නීතයානුකූල හැකියාවක් නැත.

ඒ අනුව මෙම අධිචෝදනා පත්‍රයේ චෝදනාවන්හි සඳහන් ක්‍රියාවන් සිදුකල පුද්ගලයා මෙම අධිකරණයේ සිටිනා 1 වන විත්තිකරුම බවට ඒකායන ලෙස තීරණය කිරීම සඳහා හෝ එවන් අනුමිතියකට එළඹීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවීම මත 1 වන විත්තිකරුට එරෙහිව කිසිදු චෝදනාවක් සම්බන්දයෙන් ප්‍රබල නඩුවක් ගොඩනැගීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බවට අපගේ තීරණය වේ.

<u>2 වැනි විත්තිකරුට එරෙහිව ඉදිරිපත් වී ඇති සාක්ෂි සලකා බැලීම</u>.

2 වැනි විත්තිකරුට එරෙහිව සිද්ධිය සම්බන්ධයෙන් මූලිකව ඉදිරිපත් වී ඇත්තේ කොණ්ඩ අමිල නැමැති මරණකරු රැගෙන යාම සම්බන්ධයෙන් වන කුඩා බණ්ඩාගේ සාක්ෂිය වේ. කෝවිල් වාට්ටුව ඉදිරිපස කොණ්ඩ අමිල ඇතුළුව සිරකරුවන් රඳවා සිට ඇත. එම ස්ථානයට 2 වැනි විත්තිකරු වැලිකඩ බන්ධනාගාරයට අනුයුක්ත හමුදා අනු කණ්ඩයේ මේජවර්රයෙක් සමග පැමිණ ඇත. එසේ පැමිණ 2 වැනි විත්තිකරු විසින් කොණ්ඩ අමිලව පෙන්වා ඇත. එසේ

පෙන්වා කොණ්ඩ අමිලව නැගිට්ටවා ගෙන ඔහුව රැගෙන ප්‍රධාන කායර්ාලය පිටුපස දොරෙන් ඇතුළු වී රැගෙන යාම මෙම සාක්ෂිකරු දැක ඇත. ඉන් අනතුරුව ඔවුන් කොහේට ගියේ දැයි මෙම සාක්ෂිකරු දැක නැත. ටික වේලාවකට පසුව සාක්ෂිකරු කාමරීක අංශය පැත්තට ඇතුළු වන ස්ථානයේ සිරකරුවන්ගේ දේහ කිහිපයක් තිබෙනු නිරීක්ෂණය කර ඇත. එතැන කළු තුෂාර යන අයගේ දේහය දොර ආසන්නයේද බාල දක්ෂ වාට්ටුවේ දකුණු පස කමර්ාන්ත කායර්ාලය ආසන්නයේ වෙරළු ගහක් යට කොණ්ඩ අමිලගේ දේහය වැටී තිබීම නිරීක්ෂණය කර ඇත. මේ අනුව මූලිකව 2 වැනි විත්තිකරු විසින් කොණ්ඩ අමිල හමුදා මේජවර්යෙක් සමග මෙසේ රැගෙන ගිය බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත.

ඊට අමතරව 2 වැනි විත්තිකරු කොණ්ඩ අමිලත් අතර යම් පෙර සිද්ධියක් හේතුවෙන් පෙළඹවීමේ හේතුව සම්බන්ධව සාක්ෂියක් ඉදිරිපත් වී ඇත. එනම් පැ.සා 11 මලරීන් පැ.සා 100 ටානියා යන අයගේ සාක්ෂි මගින් 2 වැනි විත්තිකරුට එරෙහිව කොණ්ඩ අමිලට යම් හිරිහැර කරදර කිරීමක් සහ මරණ බවට තජර්නය කිරීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට මෙන්ම බොරැල්ල පොලිසියට පැමිණිලි ඉදිරිපත් කර තිබීම වේ. මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පැ. 78 ලෙස ලකුනු කර ඇත. බොරැල්ල පොලිසියට කරන ලද පැමිණිල්ල අනුව මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාතර්ා කර ඇති බව තහවුරු කිරීමට මහේ. උ නඩු අංකය. බී.988/02/12 සම්පූණර් වාතර්ාව පැ 76 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. මානව හිමිකම් කොමිසමට_කර ඇති පැමිණිල්ල කොණ්ඩ අමිලට බන්ධනාගරය තුල සිදු වන යම් අකටයුතු සම්බන්ධයෙන් මැගසින් බන්ධනාගාරයේ අධිකාරීවරයාට එරෙහිව කර ඇති පැමිණිල්ලකි. පැ 76 ට අනුව බන්ධනාගාරය තුලදී කිසියම් හෝ හේතුවක් මත කොණ් ඩ අමිලව මරණ බවට 2 වැනි විත්තිකරු කරන ලදැයි කියන තජර්නයක් සම්බන්ධයෙන් කරුනු වාතර්ා කිරීමක් සිදු කර ඇත. එම ලේඛනවලට අනුව 2 වැනි විත්තිකරු නොතීසි ලත් සැකකාර පාශර්වයක් වශයෙන් නම් කර ඇත. බොරැල්ල පොලිසිය විසින් විමශර්නයක් සිදු කර චෝදනා ගොනු කිරීම සඳහා නීතිපති උපදෙස් ඉල්ලා ඇති බව පෙනේ. මෙම කාරණා දෙකම කොණ්ඩ අමිල මියගිය දිනය වන විට සක්‍රීයව පැවති කාරණා 2 ක් වේ. මානව හිමිකම් කොමිෂමට 2 වැනි විත්තිකරු කැඳවා පරීක්ෂණයක් කල බවටද සාක්ෂියෙන් හෙලිදරව් වේ. ඒ අනුව 2012.11.10 වනදා වන විට 2 වැනි විත්තිකරුට එරෙහිව යම් නීති කෘතීන් කොණ්ඩ අමිලගේ පැමිණිල්ල මත පැවතීම මෙම නඩුවේ යම්

ආකාරයකට 2 වන විත්තිකරුට පෙළඹවීමේ හේතුවක් තිබී ඇති බව තහවුරු වේ. මෙය සාක්ෂි ආඥා පනතේ 8 (1) වගන්තිය යටතේ ආවේශ්‍යා කර ගත හැකිය.

මෙහිදී මරණ තජර්නයක් කල බවට වන කාරණයේ සත්‍යතාවය නොව එවැන්නක් කල බවට පැමිණිල්ලක් කර ඒ මත සක්‍රීය නීති කෘතියක් පැවතීම යන කරුණ පෙළඹවීමේ හේතුවක් වශයෙන් සලකනු ලැබේ. තවද සාක්ෂියෙන් හෙලිදරව් වී ඇත්තේ මෙ කාරණා 2 ම කොණ්ඩ අමිලගේ මරණය හේතුවෙන් නිමාවී අවසන් වී ඇති බවය. එනම් මරණ තජර්නය සම්බන්ධව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුව පැමිණිලිකරු මියයාම හේතුවෙන් සී. 4 වශයෙන් අක්ෂර ගත කර නඩු කටයුතු අවසන් කර ඇත.

එසේම මලරීන් සහ ටානියාගේ සාක්ෂියට අනුව මානව හිමිකම් කොමිෂමේ පරීක්ෂණයද කොණ්ඩ අමිලගේ මරණයෙන් පසුව එක් වතාවක් කැදවා අවසන් වී ඇති බව හෙලිදරව් වේ . රජයේ සේවකයෙක් වන 2 වැනි විත්තිකරුට එරෙහිව අපරාධමය චෝදනාවක් එල්ල කොට අපරාධ චෝදනාවක් ගොනු වීමේ ඉහල ප්‍රවනතාවයක් තිබුන අවස්ථාවකදී කොණ්ඩ අමිලගේ මරණය සමග එම නඩු කටයුතු අවසන් වීම යන කාරණාව විත්තිකරුට මෙවන් ක්‍රියාවකට මැදිහත් වීම සඳහා ප්‍රබල හේතු පාදක වන කරුණක් බව ඉන් ගම්‍ය වේ.

මීට අමතරව බන්ධනාගාර ප්‍රධාන ජේලර් නිමල් ශාන්ත යන අයගේ සාක්ෂියට අනුව කොන්ඩ අමිල මැගසින් බන්ධනාගාරයේ සිටි කාලයේදී 2 වැනි විත්තිකරු සමග යම් ආකාරයක ගැටළුකාරී තත්වයක් තිබී ඇති බව හෙලිදරව් වේ. ටානියාගේ සාක්ෂියට අනුව මෙම සිද්ධියට දින කිහිපයකට පෙර ඇය බන්ධනාගාරයට ගිය අවස්ථාවේ 2 වැනි විත්තිකරු ඇයට දන්වා ඇත්තේ අමිල නටනවා වැඩියි යනුවෙනි. එමගින්ද ගම්‍ය වන්නේ 2 වැනි විත්තිකරුත් කොන්ඩ අමිල යන අය අතර බන්ධනාගාරය තුලදී දරුණු තත්වයකට පත්වූ විරසකයක් හෝ ගැටුම්කාරීතත්වයක් තිබී ඇති බවය. ඒඅනුව 2 වනි විත්තිකරුට කොණ්ඩ අමිල නැමැති සිරකරුව මරණයට පත්කිරීම හෝ එවැනි අන්තරායකට පත්විය හැකි ආකාරයේ ක්‍රියාවක් සිදු කිරීමට ප්‍රබල හේතුවක් තිබී ඇත. කුඩා බණ්ඩාගේ සාක්ෂියට අනුව 2 වැනි විත්තිකරු කොණ්ඩ අමිල රැගෙන යාම සිදු වන්නේ නොවැම්බර් 10 වැනිදා උදේ 6.00 පසුවී ඇති අවස්ථාවක වේ. ඒ සඳහා 2 වනි විත්තිකරු සහායට ගෙන ඇත්තේ එදින පිටතින් පැමිණි යුද හමුදා නිලදාරීන් හෝ භටයින් නොව බන්ධනාගාරයට අනුයුක්ත

හමුදා අනුකණ්ඩයේ මේජවර්රයෙකු වේ. එම අයගේ නම විස්තර මෙම සාක්ෂිකරුවන්ගෙන් හෙලිවී නැත. මෙම සාක්ෂි පොදුවේ සලකා බැලීමේදී ප්‍රබල ලෙස ගම්‍ය වන අනුමිතියක් වන්නේ බන්ධනාගාරය තුල යම් ගැටුමක් සිදුවූ අවස්ථාවකදී එය ප්‍රයෝජනයයට ගෙන 2 වැනි විත්තිකරු තමාට කරදරයක් සහ අගතියක් සිදු කරන පුද්ගලයෙක් වන කොණ්ඩ අමිල යන අයට හානියක් සිදු කිරීමට අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමක් සිදු කල බවය.

මෙම නඩුවේදී ඉදිරිපත් වූ ද සාක්ෂිවලින් හෙලිදරව් වූ පොදු කරුණක් වන්නේ මෙම චෝදනාවන්හි සඳහන් අනෙකුත් මරණකරුවන් 7 දෙනා එදින පිටතින් පැමිණි හමුදා නිලදාරීන් සහ සිවිල් ඇඳගත් යම් කණ්ඩායමක පුද්ගලයින් විසින් තෝරාගෙන යම් සැලසුමකට අනුව එම අයගේ මරණයන් සිදු කර ඇති බවය. මෙම නඩුවේ කුමන්ත්‍රනය සහ නීති විරෝධි රැස්වීමේ පොදු අරමුණ අනුව එම මරණ 7 කිසියම් පිරිසක් විසින් සිදු කර ඇති බවට ප්‍රබල සාක්ෂි ඉදිරිපත් වී ඇත.

එසේ වුවද කොණ්ඩ අමිලගේ මරණය පෙර විශ්ලේෂනය කල ආකාරයට 2 විත්තිකරුගේ පුද්ගලික අවශ්‍යතාවයක් හෝ කෝන්තරයක් සපුරා ගැනීම සඳහා අනුකණ්ඩ මේජවර්රයෙකු යැයි සඳහන් අයෙකුගේ සහාය ලබාගෙන සිදු කර ඇති බවට ඒකායන ලෙස ගම්‍ය වන සාක්ෂි ඉදිරිපත් වී ඇත.

මීට අමතරව ඉදිරිපත් වන අනෙකුත් පරිවේශනීය සාක්ෂි වන්නේ 10 වැනිදා උදෑසන මෙම 2 වැනි විත්තිකරු අවි ලබා ගෙන විවිධ මරණකරුවන් වැටී සිටි ස්ථානවලට දමා තිබීම වේ. එනම් කුඩා බන්ඩා සහ නානායක්කාර යන සාක්ෂිකරුවන්ගෙන් හෙලිදරව් වන්නේ 2 වැනි විත්තිකරු විසින් නානායක්කාර භාරයේ තිබූ තුවක්කු 4 ක් ලබා ගත් බවය. පසුව එම තුවක්කු මෙම චෝදනාවන්හි නම් සඳහන් මරණකරුවන් අසල තිබී හමුවී ඇත. මෙම මරණකරුවන් වැටී සිටි ස්ථාන ගුණවධර්න නැමැති බන්ධනාගාර නියාමක විසින් ඡායාරූප ගත කර ඇති අතර එම ඡායාරූප ගත කිරීම උදෑසන 7. 30 ත් 8.00 ත් අතර සිදු කර ඇත. මුලින් ගිනි අවි කිසිවක් මෙම දේහ අසල තිබී නැති_ නමුත් ඊට උට සුළු වේලාවකට පසුව ගත් ඡායාරූපවල තුවක්කු 4 ක් වෙන් වෙන්ව දිස්වේ. ඉදිරිපත් වූ සාකෂිවලට අනුව මෙම තුවක්කු 4 හි අංක අංක එදින උදෑසන නානායක්කාර විසින් 2 වැනි විත්තිකරුට ලබාදුන් තුවක්කුවල අංක සමග ගැලපේ.

ඒ අනුව ඉන් ගම්‍ය වන්නේ 2 වැනි විත්තිකරු මැදිහත් වී ලබාගත් තුවක්කු ඊට සුළු වේලාවකට පසුව මෘත දේහයන් තිබූ සමහර ස්තානවලට ගෙන ගොස් දමා ඇති බවය. මෙම ක්‍රියාවෙන් 2 වන විත්තිකරු උත්සාහ කර ඇත්තේ මෙම වෙඩි වැදී තුවාල සහිතව මිය ගොස් සිටින අය මිය යන අවස්ථාවේ ගිනි අවි වලින් සන්නද්ධව සිටි බව ඇඟවීමට වේ. ඒ හැර අන් කිසිදු සාධාරන අනුමිතයක් ඉන් මතු වන්නේ නැත. මෙම අය මිය ගිය සත්‍ය ආකාරය වසන් කිරීම එහි ප්‍රමඛ අරමුණක් බව පෙන්. නිරායුධ පුද්ගලයින් වෙඩි වැදී මිය ගොස් සිටින අවස්ථාවක ඔවුන් අසලට ගිනි අවි දමා මියගිය ආකාරය සහ වෙනස් කර වෙනස් චිත්‍රයක් මැවීමට යම් උත්සායක් දරා ඇති බව ගම්‍ය වේ. එවැන්නක් සිදු කරනු ලබන්නේ මියගිය ආකාරය සම්බන්ධයෙන් සත්‍ය තත්වය සැඟවීම සඳහා මිස එමගින් වෙනත් කිසිදු සාධාරන අනුමිතියකට එළඹීමට හැකියාවක් නැත. ඒ අනුව 2 වැනි විත්තිකරු එම ක්‍රියාවට ක්‍රියාකාරීව සහාය වීමෙන් පෙනී යනුයේ ඔහු ද මෙම මරණකරුවන් මිය ගිය සැබෑ ආකාරයට වසන් කිරීමේ චේතනාවෙන් වේ. එය යම ආකාරයට වරදකාරී මනසකින් යුතුව ක්‍රියා කරන ක්‍රියා කර ඇති ආකාරයක් ආකාරයක් විදහා දක්වයි.

**<u>2 වැනි විත්තිකරුට චෝදනා සම්බන්ධයෙන් ප්‍රබල නඩුවක් ගොඩ නගා ඇත්දැයි සලකා බැලීම.</u>**

2 වැනි විත්තිකරුට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා වන්නේ 01 වන 03 වන 18 සිට 33 දක්වා චෝදනා වේ. දැනටමත් සාක්ෂි සම්පිණ්ඩනය සහ මෙතෙක් කර ඇති විශ්ලේෂණයට අනුව සාක්ෂි වලින් හෙළිදරව් වන්නේ 2 වැනි විත්තිකරු කොණ්ඩ අමිල නැමැති අයගේ මරණය සිදු කිරීමට ක්‍රියාකර ඇත්තේ අනෙකුත් මරණකරුවන් 7 දෙනාගේ මරණ සිදු කරන ලද කණ්ඩායම ස්වාධීනව එම අයගේ පොදු අරමුණෙන් සහ පොදු චේතනාවෙන් පරිභාහිරව බවය.

එනම් 2 වන විත්තිකරු කොණ්ඩ අමිලව පැහැර ගෙන යනු ලබන්නේ බන්ධනාගාරයට අනුයුක්ත කර සිටි හමුදා අනුකණ්ඩයේ මේජවර්රයෙක් සමග වන නමුත් අනෙකුත් මරණකරුවන් පැහැර ගෙන යාම සිදු කර ඇත්තේ පිටතින් පැමිණි සිවිල් ඇඳගත් තිදෙනෙකු සහ යුධ හමුදා නිළධාරින් හෝ හටයින් සමග වේ. ඊට අමතරව සාක්ෂිවලට අනුව 10 වැනිදා අළුයමයම 6.00 වන විට යුධ හමුදාව විසින් තත්වය පාලනය කොට නැවත බන්ධනාගාර නිලධාරීන්ට සිරකරුවන් මෙන්ම අවි

භාරදීම ආරම්භ වීමෙන් අනතුරුව කොණ්ඩ අමිල නැමැති අය පැහැර ගෙන යාම සිදු වී ඇති බවටද කරුණු තහවුරු වේ.

එවන් පසුබිමකදී මෙම චෝදනා අතුරෙන් 2 වැනි විත්තිකරුට එරෙහිව සලකා බැලිය හැකි වන්නේ චෝදනා අංක 25 සහ 33 පමණක් වේ. එසේ වුවද චෝදනා අංක 25 ට පාදක වන්නේ 1 වන චෝදනාවේ සඳහන් පොදු අරමුණ සහ 3 වැනි චෝදනාවේ සඳහන් නීති විරෝධී රැස්වීම වන බැවින් ද මේ වන විට ඉහත සඳහන් කල ආකාරයට හමුදා ක්‍රියාන්විතය අවසන් වෙමින් තිබීමත්, එසේ පැමිණි අය ඍජුව සම්බන්ධ වූ බවට සාක්ෂි නොතිබීම හේතුවෙන් 25 වන චෝදනාව සලකා බැලීමේ අවශ්‍යතාවය මතු වන්නේ නැත. ඒ අනුව 2 වැනි විත්තිකරුට එරෙහිව සලකා බැලිය හැකි චෝදනාව වන්නේ චෝදනා අංක 33 වේ.

මෙම චෝදනාව ඔප්පු කිරීම සඳහා විත්තිකරු පැමිණිල්ල නොදත් අන් අය සමග එක්ව කොණ්ඩ අමිල යන අයගේ මරණය සිදු කිරීම සහ මිනී මැරීමේ පොදු චේතනාවකින් යුතුව එම පොදු චේතනාව එකිනෙකා අතර බෙදා ගනිමින් කොණ්ඩ අමිල නැමැත්තාගේ මරණය සිදු කිරීමේ යම් ක්‍රියාවක් සිදු කල බවත් ඒ හේතුවෙන්ම එම මරණය සිදු වූ බව පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කල යුතුය.

මෙම නඩුවේ 2 වැනි විත්තිකරු පැමිණිල්ල නොදත් යුද හමුදා මේජර්වරයෙක් සමග එක්ව කොණ්ඩ අමිල නැමැත්තා ඔහු රඳවා සිටි ස්ථානයේ සිට ඉවත් කර තවත් ස්ථානයකට රැගෙන ගිය බවට ඍජු සාක්ෂි කුඩා බණ්ඩා මගින් හෙළදරව් වී ඇත. එසේ රැගෙන ගිය දිශාවේම ගොඩනැගිල්ලකින් එහා ආසන්න ස්ථානයක එසේ රැගෙන යාමෙන් පැයක් පමණ කාලයක් තුලදී වෙඩි වැදීම් තුවාල සහිතව දේහය වැටී තිබීමත් හමුවී ඇත.

වෛද්‍ය සාක්ෂියට අනුව කොන්ඩඅමිල මිය ගොස් ඇත්තේ ගිණි අවියකින් එල්ල වූ වෙඩි පහරකින් බවට ඔප්පු වී ඇත. තවද කොණ්ඩ අමිල නැමැත්තාව 2 වැනි විත්තිකරු විසින් රැගෙන යාමට පෙළඹවීමේ හේතුව සම්බන්ධයෙන් සාක්ෂිය මලරීන් සහ ටානියා මෙන්ම බන්ධනාගාර නියාමක නිමල් ශාන්ත යන අයගේ සාක්ෂිය ද සමග සලකා බැලීමේදී 2 වැනි විත්තිකරුට කොණ්ඩ අමිල නැමැත්තාව මරණය හෝ මරණය සිදුවිය හැකි අන්තරායට දැමීමේ චේතනාවෙන්ම රැගෙන ගිය බවට ඒකායන ලෙස ගම්‍ය වන කරුණක් වේ.

එපමණක්ද නොව බන්ධනාගාරගේ වගකිය යුතු නිලධාරියෙක් ලෙස කිසියම් හෝ වලංගු හේතුවකට මේසේ රැදෙවියෙක් රැගෙන ගියේ නම් එම කාරණය කවරේද යන්න අවම වශයෙන් පැමිණිල්ලේ සාක්ෂිකරුට යෝජනා කර යුතුව ඇත. එවැන්නක් යෝජනා කර නැත. එසේම 2 වැනි විත්තිකරු මැගසින් බන්ධනාගාරය භාරව සිටි අරයෙකු වන අතර ඔහුට වැලිකඩ බන්ධනාගාරයේ රැදෙවියන් සම්බන්දයෙන් සෘජු අධීක්ෂණයක් හෝ පාලනයක් ඒ අනුව තිබී නැත. විශේෂයෙන්ම එසේ රැගෙන යාමෙන් සුළු වේලාවකට පසුව එම පුද්ගලයා ගිනි අවි වලින් සිදු වූ තුවාල සහිතව මිය ගොස් සිට ඇත. එවැනි පසුබිමකදී 2 වැනි විත්තිකරු තම රාජකාරි කටයුත්තක් වශයෙන් එම පුද්ගලයා රැගෙන ගියේ නම් ඔහු නැවත රැගෙන ඒමේ වගකීමත් 2 වැනි විත්තිකරුට තිබී ඇත. එවැන්නක් කිරිම සාමාන්‍ය කටයුතු අතරේ අවම වශයෙන් බලාපොරොත්තු විය යුතුය. එපමනක්ද නොව මෙම 2 වැනි විත්තිකරු මැගසින් බන්ධනාගරයේ අධිකාරීවරයා වන අතර වැලිකඩ බන්ධනාගාර රැදෙවියෙක් එසේ රැගෙන යාම අසාමාන්‍ය තත්වයක් වේ. ඒ අවස්ථාවේ වැලිකඩ රැදෙවියන් භාරව කටයුතු කල පැ.සා. 2 කුඩා බණ්ඩාට හෝ එහි ප්‍රධාන ජේලර් යන කිසිවෙකුට 2 වන විත්තිකරු දැනුම් දීමක් හෝ කර නැත. මෙම පරිවේශනයන් සමග මරණයට පත්වූ කෝණ්ඩ අමිල අවසන් වතාවට ජීවතුන්අතර සිටියදී දැක ඇත්තේ 2 වැනි විත්තිකරු ඔහුව තව අයෙකු සමග ඔහු මැරී වැටී සිටි ස්ථානය දෙසට රැගෙන යාමය. ඒ අනුව මෙම පරිවේශයන්ගෙන් ප්‍රබල ලෙස ගම්‍ය වන්නේ 2 වැනි විත්තිකරු විසින් මරණය හෝ එවැනි අන්තරායට පත්විය ඇති අකාරයට දැමීම සඳහාම මරණකරු වන කොන්ඩ අමිලව රැගෙන ගිය බවය.

වෛද්‍ය සාක්ෂියෙන් කොණ්ඩ අමිලට යම් අයෙකු එල්ල කර ඇති වෙඩි පහරකින් ඔහු මියගොස් ඇති බව ඔප්පු වී ඇත. ඒ අනුව ගම්‍ය වන අනුමිතිය වන්නේ එසේ රැගෙන ගිය කොන්ඩ අමිලගේ මරණය යමෙකු විසින් මිනී මැරීමේ චේතනාවකින් යුතුවම සිදු කර ඇති බවය. කොණ්ඩ අමිලට වෙඩි තැබුවේ කවරෙකුද යන්න සම්බන්ධයෙන් සෘජු සාක්ෂි ඉදිරිපත් වී නැත. 2 වැනි විත්තිකරුට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය යටතේ සහ 296 වන වගන්තිය යටතේ වන චෝදනා අංක 33 සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇත්තේ පරිවේශණීය සාක්ෂි වේ. පරිවේශණීය සාක්ෂි මත මෙවන් චෝදනාවක් ඔප්පු කිරීමේදී එකී පරිවේශණයන්ගෙන් ඒකායන ලෙස ගම්‍ය විය හැකි එකම අනුමිතිය විය යුත්තේ

විත්තිකරුගේ වරදකාරීත්වය සමග ගැලපෙන අනුමිතීන් පමණක් විය යුතු අතර යම් හෙයකින් විත්තිකරුගේ නිදෙර්ෂීභාවය සමග ගැලපෙන කිසියම් හෝ අනුමිතියක්ද මතුවන්නේ නම් එහි වාසිය විත්තිකරුට ලබාදිය යුතුය. මෙම සිද්ධාන්තය සිහිපත් කරමින් 2 වැනි විත්තිකරුට එරෙහිව ඇති 33 වන චෝදනාව සම්බන්ධයෙන් ප්‍රබල නඩුවක් ගොඩනගා ඇත්දැයි දැන් සලකා බලනු ලැබේ.

ඉහත විශ්ලේෂනය කල පරිදි 2 වැනි විත්තිකරු කොණ්ඩ අමිල නැමැත්තා අළුයම 6.00ත් 6.15 ත් අතර රැගෙන ගිය බවට ඍජු සාක්ෂි ඉදිරිපත් වී ඇත. එසේ එකී පරිවේශණයන් යටතේ රැගෙනගිය අයෙකු යම් සුළු කාල පරාසයක් වන පැයකදී පමණ වෙඩි වැදී මියගොස් සිටීම සහ එසේ සිට ඇත්තේ විත්තිකරු විසින් මරණකරුව රැගෙන ගිය දිශාවේ ආසන්නම ස්ථානයකදීමය. කුඩා බණ්ඩාගේ සාක්ෂියට අනුව කොන්ඩ අමිලව රැගෙන යන්නේ කෝවිල් වාට්ටුව ඉදිරිපිට (පැ. 1 ජේ . ස්ථානයේ ) සිට අධිකාරී කායර්ාලය නැමැති ගොඩනැගිල්ල තුලට වේ. (පැ. 1 සී ස්ථානය) එතැනට රැගෙන ගිය කොණ්ඩ අමිලගේ දේහය කමර්ාන්ත කායර්ාලය පිටුපස බාලදක්ෂ වාට්ටුව ලෙස හඳුන්වන කොටස ආසන්නයේ වෙරළු ගහක් යට තිබී ඇත. (පැ.1 ඕ,ස්ථානයේ.) ඒ අනුව මෙම මරණකරු මියගොස් සිටි ස්ථානය මුලින් ඔහු සිටි ස්ථානයේ එනම් 2 වන විත්තිකරු සහ හමුදා නිලධාරියෙකු විසින් ඔහුව නැගිට වූ ස්ථානයේ සිට ආසන්න ස්ථානයක පිහිටා ඇත. මරණකරුව එසේ රැගෙන යාමෙන් පැයක් ඇතුලත මරණකරුගේ දේහය වැටී තිබීම සාක්ෂිකරු දැක ඇත.

එවන් පසුබිමකදී ගම්‍ය වන අනුමිතියක් වන්නේ 2 වැනි විත්තිකරු හෝ ඔහු සමග එක්ව යමෙකු විසින් මරණකරුගේ මරණය සිදු කල බවය. එසේ කිරීමට 2 වැනි විත්තිකරුට ප්‍රබල පෙළඹවීමේ හේතුවක් එනම් මරණකරුගේ පැමිණිලි හේතුවෙන් අපරාධමය නඩුවක් සහ මානව හිමිකම් කොමිෂමේ පරීක්ෂණයක් 2 විත්තිකරුට එරෙහිව තිබී ඇත. සාක්ෂි වලට අනුව එම කාරණා දෙකම කොණ්ඩ අමිලගේ මරණයත් සමග අවසන් වී ඇත. තවද පැ.සා 20 නිමල් ශාන්ත නැමැති බන්ධනාගාර නියාමකගේ සාක්ෂියෙන් කොණ්ඩ අමිලත් 2 වැනි විත්තිකරුත් අතර ඊට පෙර පැවති විරසකාරී තත්වය හෙලිදරව් වී ඇත. මෙකී පරිවේශණයන් යටතේ 2 විත්තිකරු තව අයෙකු සමග රැගෙන ගිය කොණ්ඩ අමිල යන අයගේ මරණය 2 විත්තිකරු හෝ ඔහු සමග සිටි අයෙකු විසින් සිදු කර ඇති බවට ප්‍රබල අනුමිතියක් ගම්‍ය වේ. තවද කොන්ඩ අමිල රැගෙන යන අවස්ථාවේ 2 වෙනි විත්තිකරු අත හෝ

හමුදා මේජර් නැමැති අය අත ගිනි අවියක් තිබුන බවට කිසිදු සාක්ෂියක් හෙලිදරව් වන්නේ නැත. එසේ නම් මෙසේ රැගෙන ගිය අයට වෙඩි තබා මරණය සිදු කලේ කාගේ අවියකින්ද කවුරුන් විසින් දැයි යන්න සම්බන්ධයෙන් ඍජු සාක්ෂියක් නැත. එසේ නම් ඉදිරිපත් වූ පරිවේශනයන්ගෙන් ගම්‍ය වන ප්‍රබල අනුමිතීන් කවරේදැයි දැන් සලකා බලමු.

පෙර සඳහන් කල ආකාරයට රැදෙවියෙකු බන්ධනාගාර නිලධාරියෙක් තම භාරයට රැගෙන ගිය විට ඔහුගේ වගකීම එම නිලධාරීයා ඔහුව නැවත රැගෙන එන තෙක් පවතී. මෙසේ 2 වැනි විත්තිකරු විසින් කොන්ඩ අමිල ගොඩනැගිල්ලක් තුලට රැගෙන ගියායින් පසුව ඉන් ඔබ්බට සිදුවු දෙය දන්නේ 2 වන විත්තිකරු පමණකි. ඉන් පසුව කුමක් සිදුවූයේ දැයි කිසිදු යෝජනාවක් හෝ 2 විත්තිකරු වෙනුවෙන් සාක්ෂිකරුවන්ට ඉදිරිපත් කර හෝ නැත. ඒ අනුව මරණයට සුළු වේලාවකට පෙර අවසන් වතාවට 2 වැනි විත්තිකරු සමග මරණකරු සිටිනු දැකීම ඉහත පරිවේශණයන්ද සමග පොදුවේ සලකා බැලීමේදී නිරායාශයෙන් ඒකායන ලෙස ගම්‍ය වන එකම ප්‍රබල සාධාරණ අනුමිතිය වන්නේ 2 වන විත්තිකරු තව අයෙකු සමග මරණකරුගේ මරණය සිදු කල බවය. එනම් මරණකරු රැගෙන යාම දක්වා සිද්ධි මාලාවත් මරණකරු ඉන් පසුව මියාගොස් සිටීමත් යන කාරණා සලකා ඉහත පරිවේශණයන් සමග සලකා බැලීමේදී ඍජු සාක්ෂි නොමැති අවස්ථාවක මරණකරු මරා දැමීම සිදුවූ ආකාරය එක හෙලා සාධාරන මනසකට ඒකායන ලෙස අවබෝධ වන්නේ 2 වැනි විත්තිකරු ඔහු සමග සිටි අයද එක්ව මරණකරුගේ මරණය සිදු කල බව මිස ඉන් වෙනත් සාධාරණ අනුමිතියක් ගම්‍ය වන්නේ නැත.

මෙම නඩුවේ 2 වන විත්තිකරුගේ හඳුනා ගැනීම සම්බන්ධයන් කිසිදු හබයක් සැකයකන් මතු වී නැත. එනම් පැසා 2 වන කුඩා බණ්ඩා 2 වන විත්තිකරුව රාජකාරී මට්ටමෙන් මෙම සිද්ධියට පෙර ඉතා හොඳින් හඳුනන අයෙකු බව ඉතා පැහැදිලිය. එම පසුබිම යටතේ 2 වන විත්තිකරුගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් කිසිදු සැකයක් මතු නොවේ.

ඒ අනුව කොණ්ඩ අමිල නැමැත්තා මෙදින රැගෙන ගිය අය 2 වන විත්තිකරුම බවට ප්‍රබල සාක්ෂි මේ අවස්ථාවේ ඉදිරිපත් කර ඇති බවට තීරණය කරනු ලැබේ.

ඒ අනුව පැමිණිල්ල විසින් 2 වන විත්තිකරුට එරෙහිව ඇති 33 වන චෝදනාව සම්බන්ධයෙන් ප්‍රබල නඩුවක් ගොඩනගා ඇති බව මේ අවස්ථාවේ තීරණය කරනු ලැබේ.

**2 වැනි විත්තිකරුට එරෙහිව වෙනත් වරදක් හෙලිදරව් වීම.**

පෙර විශ්ලේෂණයට අනුව පෙනී යන්නේ 2 වැනි විත්තිකරුට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය යුතු 355 වන වගන්තිය යටතේ කොණ්ඩ අමිල නැමැති අය පැහැරගෙන යාම සම්බන්ධයෙන් වරදක් සිදු කර ඇති බවට සාක්ෂි මෙම නඩුවේදී හෙලිදරව් වී ඇති බවය. මෙය 2 වන විත්තිකරුට එරෙහිව චෝදනා කර ඇති 33 වන චෝදනාවන්ට පරිබාහිරව වෙනත් වරදක් සිදු කර ඇති බව සාක්ෂි හෙලිදරව් වන අවස්ථාවකි. මෙවැනි අවස්ථාවකදී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 177 වන වගන්තිය අදාල වේ. 177 වගන්තියේ මෙසේ සඳහන් වේ.

“ 176 වන වගන්තියේ සඳහන් අවස්ථාවේදී චූදිතට විරුද්ධව එක් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබ, ඒ වගන්තියේ විධිවිධාන යටතේ ඔහුට විරුද්ධව චෝදනා නැගිය හැකිව තිබුණු වෙනත් වරදක් ඔහු විසින් කර තිබෙන බව සාක්ෂිවලින් පෙනී ගිය හොත්, ඒ වරද සම්බන්ධයෙන් ඔහුට චෝදනා නගනු නොලැබුවද, ඔහු විසින් කරන ලදැයි පෙන්වන ලැබූ ඒ වරද සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබිය හැකිය. ”

මෙම වගන්තියෙන් සලසනු ලබන ප්‍රතිපාදනය වන්නේ නඩුකරයක් අවසානයේ සාක්ෂි සලකා බලන විට ඉදිරිපත් කරන ලද චෝදනාව නොව වෙනත් වරදක් සිදු කර ඇති බව සාක්ෂි තුලින් හෙලිදරව් වන්නේ නම් විත්තිකරුවෙකු එවැනි වෙනත් චෝදනාවකට වරදකරු කිරීමට හැකි බවය. මෙම වගන්තියේ වැඩිදුරටත් දක්වා ඇත්තේ එවැනි වෙනත් වරද සම්බන්ධයෙන් චෝදනාවක් ඉදිරිපත් කර නොතිබුනේ වුවද එසේ වරදකරු කිරීමේ හැකියාවක් ඇති බවය. එසේ වුවද 177 වගන්තියේ 176 වගන්තියේ සඳහන් අවස්ථාවන්ට යටත් කර ඇත. එනම්, මෙම

නඩුවේදී හෙලිදරව් වී ඇති වරද වන දණ්ඩ නීති සංග්‍රහයේ 355 යටතේ වන චෝදනාව 176 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම නඩුවේ දැනට පවතින චෝදනා සමග එක්ව චෝදනා කිරීමට හැකියාවක් තිබිය යුතු චෝදනාවක් වේ. මෙම නඩුවේ 2 වන විත්තිකරුට එරෙහිව ගොනු කර ඇති 25 වන සහ 33 වන චෝදනා වන්නේ කොණ්ඩ අමිල නැමැති අයගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් වන චෝදනා වේ. එකී චෝදනාවන් සමග 355 වන වගන්තිය යටතේ වන චෝදනාවක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 176 වන වගන්තිය ප්‍රකාරව එකතු කිරීමේ හැකියාවක් ඇත. මෙකී 177 වන වගන්තිය අර්ථ කථනය කරමින් අභියාචනාධිකරණ සභාපති විනිසුරු ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු විනිසුරුතුමා විසින් ***ඩික්ෂන් නිහාල් අප්පුහාමි එරෙහිව නීතිපති (අභියාචනාධිකරණ නඩු අංක එච්.සී.සී/0289/2019)*** දරණ නඩු තීන්දුව 2021.12.17 වන දින ප්‍රකාශයට පත් කර ඇත. එකී නඩු තීන්දුවේදී මෙවැනි අවස්ථාවකදී වෙනත් වරදක් සම්බන්ධයෙන් වරදකරු කිරීමට හැකි බව තීරණය කොට ඇත. එහිදී වෙනත් චෝදනාවක් ගොනු කිරීම සිදු වී නැත. එකී නඩුවේදී ස්ත්‍රී දූෂණ චෝදනාවක් තිබී ඇති අතර විත්තිකරුව වෙනත් වරදක් එනම් බරපතල ලිංගික අපරයෝජනය යන වරදට අභියාචනාධිකරණය විසින් වරදකරු කර ඇත.

මීට අමතරව ***කරුපයියා සවර්ායි එරෙහිව රජු 52 නා.නි.වා 227*** යන නඩුවේ වත්මන් 177 වගන්තියට අනුරූපී එවකට පැවති අපරාධ නඩු විධාන සංග්‍රහයේ 182 වගන්තිය අර්ථ කථනය කිරීමක් සිදු කර ඇත. එම නඩුවේදී දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ විත්තිකරුට එරෙහිව චෝදනා ගොනු කර තිබූ නමුත් එකී චෝදනාව ඔප්පු කිරීමට සාක්ෂි ප්‍රමාණවත් ව නොවූ බැවින් දණ්ඩ නීති සංග්‍රහයේ 198 වගන්තිය යටතේ සාක්ෂි අතුරුදහන් කිරීම යන වරද සම්බන්ධයෙන් සාක්ෂි හෙලිදරව් වීම මත එකී වරදට චෝදනාවක් නොතිබුණද විත්තිකරු වරදකරු කරන ලදී. මෙවන් අවස්ථාවකදී චෝදනාවක් නොමැතිව වරදකරු කිරීමෙන් විත්තිකරුට අගතියක් සිදු වන්නේද යන්න සලකා බැලිය යුතු වේ. මෙම නඩුවේදී 2 වන විත්තිකරුට එරෙහිව කොණ්ඩ අමිල නැමැති අයගේ මරණය සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනා 2 ක් ගොනු කර තිබිණ.

එසේ නමුත් දණ්ඩ නීති සංග්‍රහයේ 355 වන වගන්තිය යටතේ චෝදනාවක් පැමිණිල්ලෙන් ගොනු කර නොතිබුණද මරණකරු එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට රැගෙන යාම සහ මරණය හෝ මරණය සිදුවිය හැකි අන්තරායකට පත්කිරීමේ චේතනාවෙන් එසේ ඉහත කී මරණය සිදුවූ සිද්ධිය සහ අවස්ථාවේම

මරණකරු පැහැරගෙන යාම යන සාක්ෂි ඉහත කී 25 සහ 33 යන චෝදනා සම්බන්ධයෙන් ඊට අදාලව මෙහෙයවා ඇත. ඒ අනුව එකී සාක්ෂිය හබ කිරීමට විත්තිකරුට අවස්ථාව සහ අවකාශය තිබී ඇති අතර එම ක්‍රියාවන් මෙසේ දැනටමත් ඉදිරිපත් කර තිබූ චෝදනා ඔප්පු කිරීමේදී අදාල සහ අනුකූල වන බව එසේ මරණය හෝ මරණය සිදු කිරීමේ අන්තරායකට පත්වන ආකාරයට මරණකරු රැගෙන ගොස් දැමීම සඳහා 2 වන විත්තිකරු ක්‍රියාකල බවට වන සාක්ෂිය ඉදිරිපත් කර ඇත. ඒ අනුව විත්තිකරුට එම කාරණාවන්ට එරෙහිව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සහ දැනුවත් භාවය ලැබී ඇති අතර මෙම නඩුවේ ඉදිරිපත් වූ සාක්ෂි අනුව සහ විත්තිකරු වෙනුවෙන් කරන ලද යෝජනා අනුව එකී පැහැරගෙන යාම සම්බන්ධයෙන්ද විත්තිකරු ස්ථාවරයක් ගෙන ඇති බව හෙලිදරව් වේ. එම පසුබිම යටතේ මෙම දණ්ඩ නීති සංග්‍රහයේ 355 වන වගන්තිය යටතේ වන කොණ්ඩ අමිල නැමැති අය පැහැරගෙන යාම සම්බන්ධයෙන් වන සාක්ෂි හෙලිදරව් වීම හේතුවෙන් එම චෝදනා විත්තිකරුට එරෙහිව සලකා බැලීම නීත්‍යානුකූලව සිදු කල හැක.

එසේ වුවද 33 වන චෝදනාව සම්බන්දයෙන් ප්‍රබල සාක්ෂි මත නඩුවක් ගොඩනගා ඇති බව තීරණය කර තිබීම හේතුවෙන් ද පැමිණිල්ල විසින් කුමන හෝ හේතුවකට 355 වගන්තිය යටතේ චෝදනාවක් ඉදරිපත් කර නොතිබීම යන කාරණා සලකා බැලීමේදී මෙම වෙනත් චෝදනාව සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 177 වගන්තිය යටතේ ක්‍රියාකිරීමේ අවශ්‍යතාවය මතු වන්නේ නැත. ඒ අනුව එම අමතර වරද තව දුරටත් සලකා බලන්නේ නැත.

**<u>විත්තිවාචකය සළකා බැලීම</u>**

මෙම නඩුවේ 1 වන විත්තිකරුට එරෙහිව ප්‍රබල නඩුවක් ගොඩනැගීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බවට තිරණය කර ඇති බැවින් 1 වන විත්තිකරුගේ ප්‍රකාශය හෝ ඔහුගේ විත්තිවාචකය තවදුරටත් සලකා බැලීමේ අවශ්‍යතාවය මතු වන්නේ නැත. එසේ වුවද පැමිණිල්ල විසින් 2 වැනි විත්තිකරුට එරෙහිව මලිත් සමීර පෙරේරා නොහොත් කොණ්ඩ අමිල යන අයගේ මරණය සිදු කිරීම 33 වන චෝදනාව වන මිණී මැරීමේ චෝදනාව සම්බන්ධයෙන් ප්‍රබල නඩුවක් ගොඩනගා ඇති බව තීරණය කර ඇති මේ අවස්ථාවේ අප දැන් මෙම නඩුවේ 2 වැනි විත්තිකරුගේ විත්තිවාචකය සහ ඔහු වෙනුවෙන් කැඳවූ සාක්ෂි සලකා බලනු ලැබේ.

2 වැනි විත්තිකරු විත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් කර ඔහු වෙනුවෙන් සාක්ෂි කැඳවීමක් ද සිදු කර ඇත.

**<u>2 වන විත්තිකරුගේ ප්‍රකාශය.</u>**

2 වන විත්තිකරු දිසර් ප්‍රකාශයක් සිදු කර ඇත. ඔහු මූලිකව ඔහුගේ දීසර් සේවාකාලය සහ බන්ධානාගාරයේ වසර 38 ක පමන සේවා කාලය තුල සේවය කල ස්ථානයන් සහ ඔහු බන්ධනාගාරයේ සුභ සිද්ධිය සහ නිසි පරිපාලනයක් පවත්වා ගෙන යාමටත් එහි සිදු වන විවිධ අකටයුතු ක්‍රියා වලට එරෙහිව ක්‍රියාකල බවත් 2012.11.09 වන දින වන විට මැගසින් බන්ධනාගාරයේ අධිකාරී වශයෙන් කටයුතු කල බවත් සඳහන් කර ඇත. ඔහු ගනු ලබන ප්‍රදානතම විත්තිවාචකය වන්නේ 2015 යහපාලන ආණ්ඩුව සමයේදී තමාට එරෙහිව ව්‍යාජ නඩුවක් අසත්‍ය ලෙස ගෙතූ බවත් ඒ සඳහා විවිධ එන්.ජී.ඕ ආයතනවල සහායද මුදල්ද ලැබුන බවත්ය.

2 වැනි විත්තිකරු ඔහුට එරෙහිව ඇති කුමන්තණයේ චෝදනාව පදනම් විරහිත බවත් මෙවන් සෝදිසියක් කරනා බවට පෙර දැනුම් දීමක් හෝ දැන ගැනීමක් ඔහුට නොතිබූ බවත් අතර 09 වැනිදා සවස 4.00ට පමණ මෙවනි සෝදිසියක් සිදු වන බව ඔහු දැනගත් බවත් සඳහන් කර ඇත. 1 වන විත්තිකරු එදින වන විට තමා දැන සිටියේ නැති බවත් මුල් වතාවට මුන ගැසෙන්නේ බන්ධානාගරගතවීමෙන් අනතුරුව බවත් ඒ අනුව තමා නොදන්නා අයෙක් සමග පෙර දැන නොසිටි සිද්ධියක් සම්බන්ධයෙන් කුමන්ත්‍රණය කල නොහැකි බවට ස්ථාවරයක් ගෙන ඇත.

විත්තිකරුගේ ප්‍රකාශය අතරතුරදී 09 වැනිදා සවස වි.කා.බ. නිලදාරීන් පැමිණ සෝදිසියක් සිදු කිරීම ඉන්පසුව කලහකාරී තත්වයක් ඇති වීම පසුව රාත්‍රී වන විට යුධ හමුදාවෙන් ඇතුළු වී වැලිකඩ පරික්ෂා කිරීම සහ ඒ සමග කලහකාරී සිද්ධියක් සිදුවීම යන කරුණු හබ කර නැත. එම සිද්ධිය ඔහුගේ ප්‍රකාශයේදීද පිලිගනී. නමුත් ගන්නා ස්ථාවරය වන්නේ ඔහු 09 වන දා රාත්‍රී 12.00 පමණ වන තෙක් මැගසින් බන්ධනාගාරයේ ඔහුගේ නිල නිවසේ රැඳී සිටි අතර ජ්‍යොෂ්ඨ නිලධාරීයෙක් වන ජයසිංහ කොමසාරිස් ජනරාල් කොඩිප්පිලි ඇතුළු නිලධාරීන් මෙන්ම යුධ හමුදා නිලධාරීන් සමග රාත්‍රී 12 වන තෙක් මෙම කලහකාරි තත්වය පාලනය කිරීමට සාකච්ඡා කල නමුත් එසේ වුවද පොදු එකගතාවයක් එළඹීමට නොහැකිවූ බවයි. ඉන් පසුව එම පිරිස විසිර ගොස් ඇති අතර 2 වැනි විත්තිකරු ඔහුගේ නිල නිවසේ සිට 10 වන දා අළුයම 6.00 ත් 6.30 ත් අතර වැලිකඩ බන්ධනාගරයට පැමිණ රැදෙවියන්ට

අවශ්‍ය ආහාර සැපයීම සඳහා කටයුතු කිරීටම යොමු වී ඇත. ඔහුගේ ප්‍රකාශයේ සඳහන් වන්නේ සාමාන්‍යයෙන් රැදෙවියන්ට ආහාර ලබාදෙන වේලාවන් ලෙස උදෑසන 6.00 ට සහ සවස 4.00 ට ආහාර ලබාදෙන බවත් එදින දවල් ආහාරය ලබාදීමට නොහැකි වූ බවය.

තමන් අවංකව තම සේවය ඉටු කල බවත් විවිධ අක්‍රමිකතා සිදු කල අයට එරෙහිව දැඩි පියවර ගත් අතර බන්ධානාගාර තුල විවිධ ජාවාරම් සිදු කරන අය තමාට එරෙහිව වෛරයකින් සිටි බව ප්‍රකාශ කර ඇත. කොණ්ඩ අමිල රැදෙවියෙක්ව සිට බව පිලිගනි. එහු මෙදින සිදුවීමෙන් මියගිය බවත් එම රැදෙවියාට එරෙහිව 2 වැනි විත්තිකරු විවිධ පියවර ගෙන ඇති බවත් එසේ පියවර ගන්නා විට මානව හිමිකම් කොමිෂමට ඒ සම්බන්ධව පැමිණිලි කර තිබූ බවත් 2 වන විත්තිකරු ප්‍රකාශ කර ඇත. මෙම නඩුවේ සාක්ෂි දුන් මලරීන් සහ ටානියා නැමැති දෙදෙනා ප්‍රකාශ කලේ කොණ්ඩ අමිල වැනි අය දුරකථන භාවිතා කල බවත් අවශ්‍ය ආකාරයට ආහාර පාන ගෙන්වා ගන්නා බවත් දිනකට දෙතුන්වරක් ඔහුව බැලීමට යන බවය. 2 වැනි විත්තිකරු වැනි අයගේ එවැනි ක්‍රියා පාලනය කිරීම හේතුවෙන් උරණ වූ අය තමාට එරෙහිව මෙම නඩුව ගෙතීමට කටයුතු කල බව ඔහුගේ ස්ථාවරය වේ.

09 වන දින කිසිදු අවස්ථාවක වැලිකඩ බන්ධාගාරයට ගියේ නැති බවත් 10 වනදා උදෑසන 6.30 ට පමණ තවත් නිලධාරීන් දෙදෙනෙකු සමග යකඩ ගේට්ටුව ඉදිරිපිට භූමියට ගොස් ආහාර දීම ගැන සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියා කර නැවත පැමිණි බවත් ඔහුගේ ස්ථාවරය වේ.

කොණ්ඩ අමිල යන අය එක් අවස්ථාවක මැගසින් බන්ධනාගාරයේ රඳවා සිට ඇති අතර ඔහු විනය විරෝධි කටයුතු කිරීම හේතුවෙන් බන්ධානාගාර විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඔහුට සිර දඬුවමක් නියම කර වැලිකඩ බන්ධනාරයේ රඳවා තබූ බවත් තම නිල කටයුතු කිරීම හැර වෙනත් පුද්ගලික හේතුවක් ඔහුට එරෙහිව නොතිබූ බවත් මෙම 2 වන විත්තිකරු පොදුවේ ගෙන ඇති ස්ථාවරය වේ. එසේ සිටියදී මෙම කැරැල්ලේදී 2011.1.09 වන දින කොණ්ඩ අමිල මිය ගිය බවත් තමා කොණ්ඩ අමිල රැගෙන ගිය බවට කරන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් සියළු චෝදනාවන් සඳහා තමා නිවැරදි කරු බවටත් 2 වන විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එසේම 10 වනදා උදේ ගිනි අවි කිහිපයක් තමා රැගෙන ගිය බවට වන චෝදනාවන් අසත්‍ය බවත් එයද ප්‍රතික්ෂේප කරන බවත් ඔහු සඳහන් කර ඇත. කුඩා බණ්ඩාර කියනා වේලාව එනම් 6.00ත් 06.30ත් අතර කොන්ඩ අමිල රැගෙන

ගියා යැයි කියනු ලබන අවස්ථාවේ තවත් ඉහල නිලධාරීන් කිහිපදෙනෙක්ද සිට ඇති බවත් මීට අමතරව එතැන වූ එල්.කේ. සහ ජේ. ඇතුළු අනකුත් වාට්ටුවල රැඳෙවියන් සිටි අතර එවැන්නක් සිදුවූයේ නම් ඔවුන්ටද එය පෙනිය යුතු බවත් එසේ වුවද මෙම පැහැර ගැනීම දැක ඇත්තේ කුඩා බණ්ඩාර පමණක් විය නොහැක්කක් බවට ස්ථාවරයක් ඉදිරිපත් කර ඇත. එය අසත්‍යයක් බවත් තමා අවංකව සෘජුව සේවය කිරීමේ හේතුවෙන් මෙවැනි චෝදනාවක් කරන බව ඔහුගේ ස්ථාවරය වේ.

ජේලර් නානායක්කාර සී.අයි.ඩී.යට දුන් ප්‍රකාශයට වෙනස් ප්‍රකාශයක් නම්බුවසම් කොමිෂමට ලබාදී ඊට වෙනස් දෙයක් අධිකරණයේ ප්‍රකාශ කරන අතර ඉන් පෙනී යන්නේ තමාට එරෙහිව යම් කුමන්ත්‍රණයක් ශානි අබේසේකර ඇතුළු අය සිදු කරන බව ද මෙම විත්තිකරු ප්‍රකාශ කර ඇත. මෙම නානායක්කාර නැමැත්තා දුන්නා යැයි කියන ප්‍රකාශ 2 ක් ද කුඩාබණ්ඩා 2012.11.10 දුන්නා යැයි කියන ප්‍රකාශද තමන්ට නොලැබුන බවද ප්‍රකාශ කර ඇත. තවද තමාට ගුණවර්ධන නැමැති ඡායාරූප ශිල්පියාගේද වාකිෂ්ඨ මහතාගේ ප්‍රකාශද ඉල්ලා සිටි නමුත් ලබා නොදුන් අතර ඒ අනුව මෙය අසත්‍ය නඩුවක් බව ප්‍රකාශ කර ඇත. එස්ම ආයුධ රැගෙන ගොස් මෙම සිද්ධිය වෙනස් කිරීමට තමන්ට අවශ්‍යතාවයක නොමැති අතර මෙය දේශපාලන පලිගැනීමක් වන අතර දූෂිත නිලධාරීන් සහ පාතාලයේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් එක්ව සිදු කර ඇත්තක් බවට ස්ථාවරයක් ගෙන ඇත. තවද බන්ධානාගාර කොමසාරිස් වික්‍රමසිංහ යටතේ කමිටුවක් පත්කර මෙම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර ඇති නමුත් තමාගෙන් ප්‍රකාශයක් හෝ එහිදි නොගත් අතර ඒ අනුව තමා ගැන ඒ අවස්ථාවේදී කිසිවක් හෙලිදරව් වූයේ නැති බව ප්‍රකාශ කරයි. තමාව 2018.03.18 මෙම සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් අතර බන්ධනාගාරයේද සිටිනා කාලය තුලදී විවිධ බලපෑම් කල බවත් මෙම කැරැල්ලට නියෝග දුන්නේ එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ බවට ප්‍රකාශ කරන ලෙසට තමාට බලපෑම් ඇතිවුවද එවැන්නක් නොදන්නා බැවින් එසේ කියන්නේ කෙසේදැයි ප්‍රශ්න කර ඇත. හිටපු අග්‍රාමාත්‍යවරයෙකු සහ ඇමතිවරුන් කිහිපදෙනෙකු ඇතුළු යම් අයද තමාට බලපෑම් කිරීම සම්බන්ධයෙන් තොරතුරු තිබෙන බවත් මෙම අසත්‍ය චෝදනා වලින් තමා නිදොස් කොට නිදහස් කරන ලෙසට 2 විත්තිකරු අයැද සිට ඇත.

2 වන විත්තිකරු වෙනුවෙන් සාක්ෂිකරුවන් කිහිපදෙනෙකු කැඳවන ලදී. මුලින්ම සාක්ෂි අංක 3 බන්ධනාගාර කොමසාරිස් ජනරාල් කොඩිප්පිලි අය

සාක්ෂියට කැඳවන ලදී. ඔහු සිද්ධිය වන අවස්ථාවේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වශයෙන් කටයුතු කර ඇත. මෙම සිද්ධියට පාදක වූ සෝදිසි කිරීම් එවකට ආරක්ෂක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති යම් රැස්වීමකදී තීරණය කල බවත් බන්ධනාගාරය තුල ජංගම දුරකථන මගින් විවිධ අපරාධ ක්‍රියා මෙහෙයවන බවත් එය බන්ධනාගාරය තුල නැවැත්වීමට නොහැකි හේතුව ද විමසා ඇති අතර ඒ අනුව සෝදිසියක් කිරීම් ඒ සඳහා පොලිසියේ සහාය ලබාගැනීමට තීරණය කර ඇත. මෙම රැස්වීමට බුද්ධි අංශ භාර බන්ධානාගාර නිලධාරයෙකුද සහභාගි වූ නමුත් මෙම සාක්ෂිකරුගේ අවසරය හෝ දැනුම මත එම අය සහභාගි වූයේ නැති අතර ඔහුට සෘජුව ලැබු කැදවීමක් මත එසේ සහභාගි වන්නට ඇතැයි මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිකරු බාහිර පුද්ගලයෙක් පැමිණ සෝදිසි කිරීමට එතරම් කැමැත්තක් දක්වා නැති බව ඔහුගේ සාක්ෂියේදි හෙලිදරව් විය.

එසේ වුවද පෙර සඳහන් කල රැස්වීමේදී එවකට ආරක්ෂක ලේකම් අමාත්‍ය ලේකම් නි.පො.ප. නිමල් වාකිෂ්ඨ අමාත්‍යංශ නීති උපදේශන ලලිත් අන්ද්‍රා හැන්දිගේ සිල්වෙස්ටර් නැමති විශේෂ කායර් බලකාගේ නිලධාරයෙක් සහ ඉන්දික සහ බන්ධනාගාර බුද්ධි අංශ නිලදාරියා සහභාගි වී ඇත. ඒ කෙසේ වෙතත් වැපැල් අංශ සෝදිසි කිරීමට මෙම සාක්ෂිකරු කිසිසේත්ම එකග වී නැති බවත් 2012.11.09 තමාට මෙය වෙනත් රැස්වීමක සිටිනා විට පස්වරු 1.40 ට පමණ වි.කා.බ. නිලධාරීන් බන්ධානාගරයට ඇතුළුව වූ බව දැනගෙන ඇත. ඉන්පසුව තත්වය ය උත්සන්න වුවාට පසුව තමාට මෙය පාලනය කර ගැනීමට බන්ධනාගාර නිලධාරීන්ට කතා කර ඇති බව දැනුම් දී පැය 2 ක කාලයක් එය ලබාදෙන ලෙස ඉල්ලා ඇත. එම ඉල්ලීම නොසලකා හැර යුධ හමුදා නිලධාරීන් බන්ධනාගාරය තුලට රැගෙන ඒමට හමුදාව භාර අය කටයුතු කර ඇත.

පැමිණිල්ලෙන් හරස් ප්‍රශ්න කිරීමේදී ඔහු විසින් පොලිස් වි.කා.බ නිලධාරින් සහායට ලබා දෙන ලෙස යොමු කල ලිපිය අමාත්‍යංශය තුලදී තමාගේ ලිපි ශීෂර්යක් මත පිලියෙල කර භාර දුන් එකක් බව ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ බන්ධනාගාර නිලධාරීන් විසින් සිදු කරනු ලබන සෝදිසියට නිලධාරීන් හිග වීම යන කරුණ හේතුකොට ගෙන මෙසේ වි.කා.බ. නිලධාරින්ගේ සහාය ඉල්ලා සිටි බවය. මෙම ලිපියේ සෝදිසිය සඳහා යෝජිත ස්ථාන සඳහන් කර ඇති නමුත් වැපැල් අංශය එහි සඳහන් වන්නේ නැත. ඊට හේතුව වශයෙන් සඳහන් කර ඇත්තේ එහි සිටින රැදෙවියන් වෙන් වෙන්ව හෝ කිහිපදෙනෙක් එක සිර මැදිරියේ

සිටිනා බැවින් බන්ධනාගාර නිලධාරීන් ඔවුන් සෝදිසි කිරීමේ ගැටළුවක් නොතිබූ බවය. එම ලිපිය පොලිස්පති වෙත යොමු කර ඇති අතර එය අමාත්‍යතුමාගේ උපදෙස් මත සිදු කර ඇත. මෙම සාක්ෂිකරු විසින් එදින සිදුවූ සිද්දි මාලාව එනම් පස්වරු 4.30 ත් 5.00 ත් අතර යම් ගැටළුකාරි තත්වයක් හට ගැනීම 6.00ට පමණ වන විට වෙඩි ශබ්ද ඇසීම එසේම සිරකරුවන්ට වහල උඩ නැග කලහකාරි ලෙස හැසිරීම කරුණු මෙන්ම එදින රාත්‍රී 10.30ට පමණ යුධ හමුදා නිලදාරීන් කිහිපදෙනෙක් මෙම සාක්ෂිකරු මුණ ගැසී ඇති බව සඳහන් කර ඇත. මෙම මුණ ගැසීම මැගසින් බන්ධනාගාරයේ අධිකාරී වරයාගේ නිල නිවස තුල සිදුවී ඇත. මෙම සාකච්ඡාවේදී සිරකරුවන්ගේ අතට අවි පත්වී ඇති බවත් එය මැඩපැවැත්වීමට හමුදා අවශ්‍ය බව දැනුම් දී ඇත. මෙම බන්ධනාගාර නිලධාරීන්ට මෙම තත්වය පාලනය කර ගැනීමට හැකි බවට පැවති විශ්වාසය හේතුවෙන් මෙම සාක්ෂිකරු දැනුම් දී ඇත්තේ බන්ධනාගාර නිලධාරින්ට පැය 2 ක පමණ කාලයක් මෙය පාලනය කිරීමට ලබාදෙන ලෙසය. හමුදා නිලධාරීන් ඊට එකග වී නැත. පැයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි නමුත් පැය බාගයක් ඇතුලත විශාල ශබ්දයක් සමග වෙඩි හඬද ඇසී ඇත. ඒ අනුව යුධ හමුදා නිලධාරීන් බන්ධනාගාරය තුලට ගිය බව ඔහු දැනගෙන ඇත. පසු දින අළුයම එනම් 11 වැනිදා පෙරවරු5.30 ත් 5.45.ත් අතර බන්ධනාගාරය තුලට යාමට උත්සාහ කලත් හමුදාවෙන් එයට ඉඩ දී නැත. පසුව පෙරවරු 6.00ත් 6.30 ත් අතර ඔහු බන්ධනාගාරය තුලට ගොස් ඇත. එහි ගාමිණී ජයසිංහ, ජේලර් වලිසුන්දර, කුඩාබන්ඩා ඇතුළු නිලධාරින් සිට ඇත. ඔහු එම නිලධාරින් සමග සිරකරුවන්ට උදේ ආහාර වේල සැපයීම සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇත. වැලිකඩ බන්ධනාගාරයේ මුළුතැන්ගෙය විනාශ කර තිබූ අතර ආහාර සැපයීමට විකල්ප වැඩ පිලිවෙලක් සකසා ඇත.

මෙම සාක්ෂිකරු එම ස්ථානයට යන විට බන්ධනාගාරය යුධ හමුදාවේ අණසක යටතේ තිබී ඇත. ඔහු එදින පෙරවරු 11.00 වන තෙක් එහි රැදී සිට විවිධ කටයුතු වල යෙදී ඇත. ඔහුගෙන් ප්‍රශ්න කරන ලදුව කිසිවිටෙක ගිණි අවියක් යමෙකුට දෙන ලෙස නියෝග නොකල බව ප්‍රකාශ කරමින් ඔහුගේ මූලික සාක්ෂි අවසන් කර ඇත.

හරස් ප්‍රශ්න අතරතුරදී පැමිණිල්ලෙන් මතුතර ඇති ප්‍රධාන කාරණාව වන්නේ මොහු කොමසාරිස් ජනරාල් වශයෙන් සේවය කලේ වුවද ඔහුගේ කණිෂ්ඨ නිලධාරීන් නිසි ආකාරව පාලනයකින් තොරව රැස්වීම්වලට සහභාගි වන බවය. ඊට

අමතරව මෙම සාක්ෂිකරු අමාත්‍යවරයාගේ නියෝග සහ අවශ්‍යතා අනුව කටයුතු කරන දුවර්ල චතර්යකින් යුත් අයෙකු බවට යෝජනා කර ඇත. සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇත. එනම් පැමිණිල්ලෙන් යෝජනා කර ඇත්තේ ඔහු නෝන්ජල් පුද්ගලයෙක් බවය. යුධ හමුදාව කැඳවීම ඔහු නොකල බවත් කවුරුන් කැඳවූයේ දැයි නොදන්නා බවත් ප්‍රකාශ කර ඇත. පසු දින බන්ධනාගාරය තුලට ගිය අවස්ථාවේ සිරකරුවන් මියගොස් සිටිනු සාක්ෂිකරු දැක ඇත. මෙම සිද්ධියේදී රැදෙවියන් 27 ක් පමණ මිය ගිය බවත් තමා එම දේහයන් දුටුවේ මුළුතැන් ගෙට යාමෙන් අනතුරුව බවත් ඔහුගේ ස්ථාවරය විය. එදින පෙරවරු 6.00.ත් 6.30 අතර මෙම සාක්ෂිකරු වැලිකඩ බන්ධනාගරය තුලට පැමිණි අවස්ථාව වන විට 2 වැනි විත්තිකරු ඊට කලින් එතැනට පැමිණ සිට ඇත. 2 වන විත්තිකරු එවකට මැගසින් බන්ධනාගයේ අධිකාරී එමිල් රංජන් ලමාහේවා බවත් ඔහු අධිකරණයේ ද සිටින 2 වැනි විත්තිකරු බවටත් සාක්ෂිකරු හදුනා ගෙන ඇත.

පැමිණිල්ලෙන් යෝජනා කර ඇත්තේ 2 වැනි විත්තිකරු විසින් ජේලර් නානායක්කාර සතුව තිබූ ගිනි අවි ඉල්ලා සිටි බවත් ඒ අවස්ථාවේ එම ඉල්ලීම අනුව ගිනි අවි භාර දෙන ලෙසට සාක්ෂිකරු විසින් යම් පෙලඹවීමක් හෝ බලපෑමක් කල බවය. සාක්ෂිකරු එය සම්පූණර්යෙන් ප්‍රතික්ෂේප කර ඇත. තවද අධිකරණයෙන් විමසන ලදුව බන්ධනාගාර නිලධාරියෙක් තම උපදෙස් මත ඡායාරූප ගත කිරීම කල බවත් එම අය තමාගේ සහකාරවරයෙකු වන අතර පෙරවරු 6.30 ත් 7.00ත් අතර වගේ එම ඡායාරූප ගැනීමට උපදෙස් දී ඇත. තවද නානායක්කාර යන අය තමාට එරෙහිව මෙවැනි බරපතල දෙයක් ප්‍රකාශ කිරිමට හේතුවක් තමා නොදන්නා බවත් ඔහුගේ වගකීම පැහැර හැරීමේ වගකීමෙන් බේරීමට මෙසේ කරන්නට ඇතැයි මෙම සාක්ෂිකරු පවසමින් ඔහුගේ සාක්ෂිය අවසන් කර ඇත.

මීට අමතරව 2 වැනි විත්තිකරු වෙනුවෙන් සංජිවනී සිල්වා යන අභායාචනාධිකරණයේ නිලධාරිනියක්ද නිල්මිණි මෙන්ඩිස් නැමැති ප්‍රධාන පොලිස් පරීක්ෂකවරියක්ද සාක්ෂියට කැඳවා ඇත. මෙම සාක්ෂිය මගින් මෙහෙයවා ඇත්තේ කුඩා බණ්ඩා නැමැති පැ.සා. 2 ගෙන් 2012.12.01 දින ප්‍රකාශයක් ලබාගෙන ඇති බවත් අදාල නිලධාරියා වන උ.පො.ප. ප්‍රේමතිලක විසින් එම ප්‍රකාශය 2012.12.01 දින මෙම සාක්ෂිකාරියට භාරදී ඇත. එම ප්‍රකාශය බාරගත් ලේඛනය 2 ව. 1 වශයෙන් ලකුණු කර ඇත. මෙසේ භාරදුන් අපරාධ පැඩ්වල සටහන් කර තිබූ ප්‍රකාශය නැවත

උ.පො.ප. ප්‍රේමතිලක සටහන් දැමීමට රැගෙන ගිය බව ඉහත ලේඛනයේ සටහන් වී ඇත.

**<u>2 වැනි විත්තිකරුගේ විතිතිවාචකයේ පිලිගත හැකි භාවය සලකා බැලීම</u>**

මේ අවස්ථාවේ 2 වන විත්තිකරුගේ ප්‍රකාශයක් සහ විත්තියේ සාක්ෂි පිලිගත හැකි භාවය සලකා බලනු ලැබේ. විත්තිකරු කූඩුවේ සිට කල ප්‍රකාශයක් වුවද එය දිවුරුමක් මත හෝ හරස් ප්‍රශ්නවලට භාජනය වී නැති නමුත් එකී ප්‍රකාශය අනෙකුත් සාක්ෂිමෙන් සාක්ෂියක් වශයෙන් සලකනු ලැබේ. ඒ අනුව එම ප්‍රකාශයෙන් හෝ අන්‍යාකාරයකින් පැමිණිල්ලේ නඩුව මත සැකයක් මතු කරන්නේ නම් හෝ එම ප්‍රකාශය පිලිගන්නේ නම් හෝ පිලිගැනීමට හෝ ප්‍රත්ක්ෂේප කිරීමට නොහැකි තත්වෙයකට පත් වනනේ නම් එහි වාසිය විත්තියට ලබාදිය යුතුවේ. ඒ අනුව මූලිකව මෙම ප්‍රකාශයේ පිලිගත හැකි භාවය සලකා බලනු ලැබේ. 2 වැනි විත්තිකරුගේ ස්ථාවරය වන්නේ ඔහු බන්ධනාගාරය තුල දැඩි පාලනයක් සහ විනයක් ඇති කිරීමට කටයුතු කිරීම හේතුවෙන් පාතාලය සහ එන්.ජී.ඕ ආයතන සහ ඔහුගේ දැඩි පරිපාලනයෙන් අසතුටට පත් වූ රැදෙවියන් මෙසේ තමාට විරුද්ධව අසත්‍ය චෝදනාවක් ගොනු කරන බවය.

මෙම නඩුවේ 2 වැනි විත්තිකරු සම්බන්ධ කරන්නේ එක් රැදෙවියෙකු රැගෙන යාම සම්බන්ධයෙන් පමණක් වේ. එනම් කොණ්ඩ අමිල යන අය වේ. එදින රැදෙවියන් 27 දෙනෙක් පමණ මෙම සිද්ධියේදී මරණයට පත්වී ඇත. ඉන් 8 දෙනෙකු පමණ යම් පිරිසක් විසින් සැලසුම් සහගත ලෙස රැගෙන ගිය බවට පොදුවේ සාක්ෂිවලින් හෙළිදරව් වී ඇත. එසේ වුවද මෙම විත්තිකරු සම්බන්ධකරනු ලබන්නේ ඉන් එක් රැදෙවයෙකුගේ පැහැර ගෙන යාම සහ මරණය සම්බන්ධයෙන් පමණක් වේ. සාමාන්‍ය කටයුතු අතරේ මෙම 2 විත්තිකරු කියනා ආකාරයට ඔහුට එරෙහිව මේසා පුළුල් පිරිසක් එක්ව අසත්‍ය නඩුවක් ගෙතුවේ නම් එක් රැදෙවියෙකුගේ රැගෙන යාමට පමණක් 2 වන විත්තිකරුව සම්බන්ධ කිරීම තරමක් අස්වාභාවික වේ. සාමාන්‍යයෙන් ද්වේශ සහගතව යම් තැනැත්තෙක් වරදකට පටලවන අවස්ථාවකදී හැකිතාක් දුරට එය සංකීණර් තත්වයට පත්කර ඔහුව උපරිම

අපරාධ සංඛ්‍යාවකට සම්බන්ධ කිරීම සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන කරුණකි වේ. නමුත් එවැන්නක් මෙහිදි සිදු වී නැත.

මෙම නඩුවේ මුල් අවස්ථාවේ කුඩා බණ්ඩා යන සාක්ෂිකරු සාක්ෂි දුන් අවස්ථාවේ මෙම 2 වැනි විත්තිකරු විසින් දැඩි පාලනයක් සහ විනයක් බන්ධනාගාරය තුල සථාපනය කිරීමෙ හේතුවෙන් මෙසේ එන්.ජී.ඕ. සහ කුඩු ජාවාරම් කරුවන් හෝ අසතුටට පත් රැඳෙවියන් සමග එක්ව මෙවන් අසත්‍ය චෝදනාවක් සිදු කරන බවට ඍජු යෝජනාවක් හෝ සිදු කර නැත. ඒ අනුව මෙම ස්ථාවරය ඒකාකාරි භාවයකින් තොර බවට පත්වේ. නඩුව අවසානයේ පසු සිතුවිල්ලක් මත මෙය ගෙන ඇති ස්ථාවරයක් බව ඒ අනුව ගම්‍ය වේ. නානායක්කාර යන සාක්ෂිකරු අසත්‍ය ප්‍රකාශ කරන බව මුල් අවස්ථාවේ යොජනා කර ඇති නමුත් මෙම විත්තිකරුට එරෙහිව එවනි අසත්‍යක් ප්‍රකාශ කිරීමට හේතුවක් යෝජනා කර නැත. මෙම විත්තිකරු වෙනුවෙන් කැඳවූ කොඩිප්පිලි නැමැති සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ නානායක්කාර යන අය මෙවන් අවි 2 වැනි විත්තිකරුට භාරදුන් අවස්ථාවේ කොඩිප්පිලි එසේ භාරදෙන ලෙස යම් බලපෑමක් කල බවට ප්‍රකාශ කරන්නේ එම කල ක්‍රියාවේ වගකීම යම් ජ්‍යෝෂ්ඨ නිලධාරියෙක්ට පැවරීමේ අදහසින් බවය. එනම් කෙටියෙන් සඳහන් කලහොත් නානායක්කාර අවි බාරදීම සිදු කර ඇති නමුත් එම ක්‍රියාවේ වගකීමෙන් බේරිමට කොඩිප්පිලිගේ කීම මත එම අවි 2 වැනි විත්තිකරුට භාරදුන් බවට නිදහසට කරුණක් දක්වන බවය.

ඒ අනුව විත්තිකරුගේ ප්‍රකාශය කොඩිප්පිලිගේ සාක්ෂිය සමග එක්ව සලකා බැලීමේදී පරස්පර සහ නොගැලපෙන තත්වයකට පත්වේ. එනම් 2 වන විත්තිකරු අවි බාරගැනීමක් හෝ නානායක්කාරගෙන් ලබා ගැනීමත් සම්පූණර්යෙන්ම ප්‍රතික්ෂේප කරන අතර කොඩිප්පිලිගේ ස්ථාවරය වන්නේ නානායක්කාර අවි දීමෙන් පසුව වගකීම කොඩිප්පිලිට පැවරීමට උත්සාහ දරන බවය.

ඒ අනුව 2 වන විත්තිකරුගේ විත්තී වාචකය පොදු වේ ගත්කල වියහැකි භාවයකින් තොරව සහ ඒකාකාරී භාවයකින් තොරව ඔහුගේම සාක්ෂිකරුවන් සමග පරස්පරතාවයකට පත්ව ඇත. මෙම විත්තිවාචිකය පැහැදිලිව පසු සිතුවිල්ලක් මත පිහිටා ගෙන ඇති විත්තිවාචකයක් බවට පත්වේ. ඒ අනුව 2 වන විත්තිකරුගේ

විත්තිකූඩුවේ සිට කර ඇති ප්‍රකාශය සහ ඔහු වෙනුවෙන් කැඳවන ලද විත්තියේ සාක්ෂි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

<u>**සියළු සාක්ෂි පොදුවේ සලකා බැලීම**</u>

විත්ති වාචකය ප්‍රතික්ෂේප කර ඇති මේ අවස්ථාවේ පොදුවේ සියළු කාරනා එනම් පැමිනිල්ලේ සාක්ෂිද විත්තියේ යෝජනා ස්ථාවරයන් සහ සාක්ෂිද සැලකිල්ලට ගෙන 2 වන විත්තිකරුට එරෙහිව ඇති 33 වන චෝදනාව සම්බන්ධයෙන් වන සාක්ෂි මත කිසියම් හෝ ආකාරයකට සැකයන් මතුවන්නේද නොඑසේ නම් මෙම චෝදනාව සාධාරන සැකයෙන් ඔබබ්ට ඔප්පු කර ඇත්දැයි සලකා බලනු ලැබ්.

මෙම නඩුවේ සාක්ෂි පොදුවේ සලකා බැලීමේදි 2012.11.09 සහ 10 යන දිනයන්හි බන්ධනාගාරය තුල සිදුවීමක් සහ කලහකාරී තත්වයක් හට ගැනීමත් එම චෝදනාවල සඳහන් 8 දෙනාගේම මරණ එම සිද්ධියේදී සහ කාලපරාසය තුල සිදුවීම සම්බන්ධනේ කිසිදු හබයක් නැත. කොණ්ඩ අමිල ඇතුළු මියගිය අය වෙඩි වැදීම හේතුවෙන් මරණයට පත්වීමද හබයකින් තොරව ඔප්පු වී ඇත. 2 විත්තිකරු වෙනුවෙන් කල දේශනයේදීද මතුකල කරුණක් වන්නේ කොන්ඩ අමිලගේ ආමාශයේ අන්තරගත දේ සම්බන්ධයෙන් වෛද්‍ය සාක්ෂියේදී හෙලිදරව් වූ කාරණයක් වන මිලිලීටර් 100 ක පමණ බත් හඳුනා ගැනීම වේ. ඒ අනුව මෙම මරණකරුගේ මරණයට පැය 6 ක් ඇතුලතදී ඔහු බත් සහිත ආහාර වේලක් අනුභව කර ඇති බවත් බන්ධනාගාරයේ අවසන් නිල ආහාර වේල් ලබාදී ඇත්තේ 09 වනදා උදේ වරුවේ වීම හේතුවෙන් 09 වනදා මෙම මරණකරුගේ මරණය සිදුවී තිබිය යුතු බවය. මෙම කරුණ නැවත මේ අවස්ථාවේදී පොදුවේ විත්තියේ සාක්ෂිද සමග සලකා බලනු ලැබේ.

විත්තියේ සාකෂිකරුවන් වන කොඩිප්පිලි ඇතුව සියළු සාක්ෂිකරුවන්ගේ පොදු ස්ථාවරය වන්නේ බන්ධනාගාරයේ උදෑසන ආහාරවේල ලබාදීමෙන් අනතුරුව සවස ආහාර වේල සවස 5.00 ට පමණ ලබාදෙන බවය. මීට අමතරම එදින සවස 1.30න් පසුව වි.කා.බ නිලධාරීන්ද රාත්‍රි 12 .00 වන විට යුද හමුදා කණ්ඩායමක්ද පැමිණීම හේතුවෙන් සවස ආහාර ලබාදීම සාමාන්‍ය පරිදි සිදු වී නැත. එසේ නම් පැමිනිල්ලේ සාක්ෂිවලට අනුව 10 වනදා උදේ 6.00ත් 6.15 ත් අතර මියගිය කොණ්ඩ අමිලගේ ආමාශය තුල මිලිලිටර් 100 ක බත් තිබුනේ කෙසේදැයි

අවිනිශ්චිතතාවයක් මතුවන බවත් එමගින් ඔහු එම වේලාවේදී මියගියේ දැයි සැකයක් මතුවන බව විත්තියේ සැලකිරීමේ වේ.

මෙම නඩුවේ පැමිණිල්ලේ මෙන්ම විත්තියේ සාක්ෂි පොදුවේ සැලකිල්ලට ගැනීමේදී ඉතා ඒකකාරීව මතු වී ඇත්තේ රාත්‍රී 12.00ට පමන මෙම භූමියට යුද හමුදාව පැමිණීමෙන් අනතුරුව වාට්ටුවල සිටින රැදෙවියන් ඒ ඒ වාට්ටු තුල හෝ අසල පෝලිම් කර බන්ධනාගාර භූමියේ ආරක්ෂාව පාලනය කර කලහකාරී තත්වය සමනය කර ඇති බවය. එසේ වුවද අළුයම 5.30 ත් 6.00 ත් අතර වන විට තත්වය පාලනය කිරීමෙන් අනතුරුව යුද හමුදාව බන්ධානාගාරයේ පාලනයෙන් බැහැර වී ඔවුන් සොයා ගත් අවි ආයුධ බන්ධනාගාර නිලධාරීන්ට භාරදීමද ආරම්භ කර ඇත. ඒ අනුව මේ අවස්ථාව වන විට නැවත වරක් රැඳෙවියන් තම තමන්ගේ වාට්ටුවලට යාමක් සිදුවී ඇති බව හෙලිදරව් වේ. එම පසුබිම යටතේ රැදෙවියන්ට කැඩි බිදි තිබූ ආහාර පිලියෙල කරන ස්ථානයෙන් හෝ අන්‍යාකාරයකින් ආහාර වේලක් ලබා ගැනීමේ අවස්ථාව සහ අවකාශය තිබී ඇත. සාමාන්‍ය කටයුතු අතරේ පැය 18 කට ආසන්න කාලයක් ආහාරයක් නොලබා සිටි අයෙකු මෙසේ ලැබෙන අවස්ථාවකදී යම් ආහාරයක් ලබා ගැනීමට කටයුතු කිරීම සිදු විය හැකි කරුණකි. තවද මෙම කොණ්ඩ අමිල නැමැති මරණකරු රැදෙවියක්ව සිටියේ වුවද ඔහු යම් ආකාරයකට බන්ධනාගාර නියාමකවරුන්ට සහාය දක්වමින් යම් යම් කටයුතු සිදු කරමින් බන්ධනාගරයේ ගත කල අයකෙු බව සාක්ෂියෙන් හෙලිදරව් වී ඇත. එවන් පසුබිමකදී හමුදා මෙහෙයුමෙන් පසුව යම් ලිහිල් අවස්ථාවක් ලද සැනින් පැය ගණනාවක් නිරාහාරව සිටි අයෙකු කැඩි බිදි තිබූ කුස්සියකින් හෝ ආහාර ලබා ගැනීම විය හැකි අතර මෙම කොණ්ඩ අමිල සිටි ස්ථානය ආසන්නයේම භෝජනාගාරයක් සහ මෙම සිද්ධියෙන් අලාභවූ ආහාර පිලියෙල කරන කුස්සියක් තිබුන බවට සාක්ෂි ඇත. 09 වනදා සවස ආහාර ලබාදීමට යම් ආකාරයකින් කටයුතු එදින දහවල් වන විට සිදුවෙමින් පැවති බවද සාක්ෂිවලින් හෙලිදරව් වී ඇත. එම ආහාර වේල ලබා දීමට නොහැකි වූයේ වි.කා.බ. නිලධාරීන්ගේ පැමිණීම නිසාය.. ඒ අනුව පිසූ ආහාර එතැන තිබීමේ ඉතා ඉහල ප්‍රවණතාවක් මෙම සාක්ෂිවලින් හෙලිදරව් වේ. ඒ අනුව විත්තියේ මෙම තකර්ය පරදම් විරහිත බවත් එමගින් කිසිදු සැකයක් පැමිනිල්ලේ නඩුව මත මතු නොවේ.

ෙමෙම කාරනාවට අනුශාංගිකව පැ.සා 11 මලරීන් සහ පැ.සා 100 ටානියා යන අයගේ සාක්ෂිද සලකා බැලිය යුතුවේ. මෙම දෙදෙනාගේ සාක්ෂිවල මියගිය

කොණ්ඩ අමිල දුරකථනය මගින් 09 වන වනදා සහ 10 වනදා මෙම සාක්ෂිකරුවන් සමග සම්බන්ධවී ඇත. පෙර විශ්ලේෂණය කර ඇති අකාරයට කොන්ඩ අමිල යන අය සිය මව වන මලරීන්ට 09 වන දා රාත්‍රී 9.00 ත් 10 වනදා අළුයම 1.20 ත් අතර ඇමතුම් ලබාගෙන ඇත. ටානියා සමගද 10 වනදා අළුයම 6.00 ත් 6.10 ත් අතර දුරකථනයනේ සම්බන්ධ වී ඇති නමුත් 6.10 ට කොන්ඩ අමිල භාවිතා කල දුරකථනය ක්‍රියා විරහිතව තිබූ බව ඇයගේ සාක්ෂිය වී ඇත. මෙම සාක්ෂිකරුවන් විසින් ඉදිරිපත් කල මෙකී සාක්ෂි කිසිදු ආකරයකට පරස්පරයකට හෝ ඌනතාවයකට ලක්වීමක් හෝ එම සාක්ෂිය විත්තිය විසින් හබ කිරීමක් හෝ සිදු කර නැත. මෙම සාක්ෂිකරුවන් දෙදෙනාගේම සාක්ෂිය වන්නේ මෙම ඇමතුම්වලට පසුව 6.30 වන විට කොණ්ඩ අමිලට යම් කරදරයක් හෝ හානියක් සිදුවූ බවට ඔවුන් දැනුවත් වූ බවය. ඒ අනුව පැහැදිලිව ගම්‍ය වනුයේ 2012.11.10 දින පෙරවරු 6.00 ත් 6.15 ත් අතර කොණ්ඩ අමිල ජීවතුන් අතර සිටි බවය. මෙම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සිද්ධිය දුටු සාක්ෂිවලට ස්වාධීනව සහ පරිබාහිරව ඉදිරිපත් වී ඇත. එම සාක්ෂි කොණ්ඩ අමිල පැහැර ගැනීම දුටු බවට ඉදිරිපත් වූ අනෙකුත් සාක්ෂි සමග මනා ගැලපීමකින් ඉදිරිපත් වී ඇති අතර විත්තිය විසින් හබ කරද නැත .ඒ අනුව පොදුවේ ගත් කල මරණකරුගේ ආමාශයේ බත් තිබීම හේතුවෙන් කිසිදු ආකාරයක සාධාරන සැකයක් මෙම නඩුවේදි මතු වන්නේ නැති බව අපගේ නිගමනය වේ.

පෙර විශ්ලේෂනයන්ට අනුව කොණ්ඩ අමිල නැමැති අය පැහැරගෙන යාම සම්බන්දයෙන් සෘජු සාක්ෂි ඉදිරිපත් වී ඇත. මිණී මැරීම සම්බන්ධයෙන් ඇත්තේ පරිවේශණීය සාක්ෂි වේ. 2 වන විත්තිකරුට පෙළඹවීමේ හේතුවක් තිබීම සම්බන්ධයෙන් සාක්ෂියක්ද පසු හැසිරීම එනම් තුවක්කු රැගෙන ගොස් යම් මෘත ශරීර අසල දමා ඇත්ත සිද්ධිය වෙනස් කිරීමේ උත්සාහයක් සම්බන්ධයෙන්ද සාක්ෂි ඉදිරිපත් වී ඇත. විත්තිකරුගේ විත්තිවාචකය සහ ස්ථාවරයන් තුලින් ඔහුට එරෙහිව අසත්‍ය ලෙස මෙවන් චෝදනාවකට පැටලවීමට යම් පිරිසක් ක්‍රියාකර දේශපාලන හේතු මත ඊට පැටලවූ බව සඳහන් කරයි. මෙම නඩුවට අදාලව තව 7 දෙනෙකුගේ මරණ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් සාක්ෂි දී ඇත. එසේ වුවද එම එක් සිද්ධියකට වත් 2 වැනි විත්තිකරුව අසත්‍ය ලෙස සම්බන්ධ කිරීමට එම සාක්ෂිකරුවන් කිසිදු උත්සාහයක් දරා නැත. ද්වේශ සහගත ලෙස අසත්‍ය ලෙස 2 වැනි විත්තිකරුව මෙම සිදුවීම්වලට සම්බන්ද කරන අයකු මේ ආකාරයට 2 වැනි විත්තිකරු එක් මරණකරුවෙක් රැගෙන යාම පමණක් දුටු බවට අසත්‍ය චෝදනාවක් ගොතනු ඇතැයි

සාමාන්‍ය කටයුතු අතරේ බලාපොරාත්තු විය නොහැක. එවැන්නක් සිදු කරන අයෙකු අදාල අවස්ථාවේ මරණකරුට හානියක් සිදු කිරීම සම්බන්ධයෙන්ද කරුණු ඉදිරිපත් කිරීම බලාපොරොත්තු විය යුතුය. එපමණක්ද නොව 2 වන විත්තිකරුට තිබූ එරෙහිව පෙළඹවීමේ හේතුව සම්බන්ධයෙන් මලරීන් සහ ටානියා නැමැති දෙදෙනෙකුගේ සාක්ෂි ඉදිරිපත් විය. එම සාක්ෂි කරුවන් ඉදිරිපත් කරන ලද පෙළඹවීමේ හේතුව එනම් මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති අපරාධමය නඩුව සහ මානව හිමිකම් පරීක්ෂණය ඔවුන්ගේ සාක්ෂියට ස්වාධීනව ලේඛන ගත සාක්ෂිය මගින්ද තහවුරු වී ඇත. එවන් සාක්ෂි කිසිදු ආකාරයකට ව්‍යාජ ලෙස පසුව නිමර්ාණය කිරීමේ හැකියාවක්ද නැත. මෙම නඩුවේ 2 වන විත්තිකරුගේ විත්ති වාචකය පොදුවේ ගත් කල දැඩි විය නොහැකි විත්තිවාචකයක් බවට පත්ව ඇත. ඒ අනුව පොදුවේ 2 වැනි විත්තිකරුගේ විත්තිවාචකයද සමග සියළු කාරණා සලකා බැලීමේදී විත්තියේ සාක්ෂි හෝ 2 වන විත්තිකරුගේ ප්‍රකාශය මත පැමිණිල්ලේ නඩුව මත කිසිදු සැකයක් මතුකිරීමට අපොහොසත් වී ඇති බව අපගේ තීරණය වේ.

**<u>අවසානය.</u>**

මෙම තීන්දුව අප තිදෙනාම පොදුවේ ඒකමතිකව පිලියෙල කරන ලද තීන්දුවක් වේ. එසේ වුවද අප තිදෙනාම මුල් අවස්ථාවේ වෙන් වෙන් ව සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව වෙන් වෙන්ව තීරණ වලට එළඹුන අතර එකී සියළු තීරණ ඒකමතික වීම හේතුවෙන් විනිසුරුවරුන් තිදෙනාව එක් තීන්දුවක් සමස්ත අධිකරණයේ තීන්දුවක් (Judgment of Court) ලෙස පිලියෙල කර මෙසේ ප්‍රකාශ කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව අපගේ ඒකමතික තීරණය වන්නේ මෙම නඩුවේ 1 වන චූදිත හදුනාගැනීම සම්බන්ධයෙන් ඇති වූ දුබලතාවය හේතුකොට ගෙන 1 වන විත්තිකරුට එරෙහිව ඇති සියළු චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බවයි. තවද 2 වන විත්තිකරුට එරෙහිව නගා ඇති 1 වන, 3 වන, 18 සිට 32 දක්වා වන චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බව අපි තීරණය කරමු.

2 විත්තිකරුට එරෙහිව නගා ඇති 33 වන චෝදනාව ඉහත දක්වා ඇති හේතු අනුව පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙක් ඔබ්බට ඔප්පු කර ඇති බව අපි තීරණය කරමු.

ඒ අනුව 1 වන විත්තිකරු ඔහුට එරෙහිව නගා ඇති සියළු චෝදනා වලින්ද, 2 වන විත්තිකරු ඔහුට එරෙහිව නගා ඇති 1 වන, 3 වන, 18 සිට 32 දක්වා වන චෝදනා වලින්ද නිදොස් කොට නිදහස් කරනු ලැබේ.

2 වන විත්තිකරු ඔහුට එරෙහිව නගා ඇති 33 වන චෝදනාවට වරදකරු කරනු ලැබේ.